# විවෘත ආර්ථිකය, රූපවාහිනිය, නාට්‍යය හා ස්ත්‍රිය

සුදර්ශනී කුමාරි දමුණුපොල

විවෘත ආර්ථිකය, රූපවාහිනිය, නාට්‍යය හා ස්ත්‍රීය (***E – Copy*** )
● සුදර්ශනි කුමාරි දමුණුපොල

**ISBN : 978- 624 -99822- 4- 6**
විද්‍යුත් පිටපත : 2022 දෙසැම්බර්

ප්‍රකාශනය :
කතෘ ප්‍රකාශනයකි
129/19, පොල්හේන, මඩපාත, පිළියන්දල
***Sudarshanidamunupola@gmail.com***

පිටු සැකසුම හා කවර නිර්මාණය:
දිනුක ගුණවර්ධන
***dinukab202@gmail.com***

දේශපාලනික දැනුම ලබා
සක්‍රීය පුරවැසියෙකු වීමට
සිතන
ඔබ සැමට

## අන්තර්ගතය


1. පෙරවදන
2. විවෘත ආර්ථිකය බිහිවීම හා එහි න්‍යායාත්මක දිශානතින්
3. විවෘත ආර්ථිකය ශ්‍රී ලංකාවට හඳුන්වාදිම
4. ශ්‍රී ලංකාවේ සංවෘත ආර්ථික මොඩලය වෙත විවෘත ආර්ථික මොඩලය හඳුන්වාදීම තුළ සිදු වූ බලපෑම
5. සම්ප්‍රදායික නාට්‍යය ටෙලිනාට්‍යය දක්වා විකාශනයේ පරාමිතීන්
6. ජනමාධ්‍යය ගුවන් විදුලියේ සිට රූපවාහිනිය දක්වා විතැන්වීම
7. රූපවාහිනියේ ඉතිහාසය හා ශ්‍රී ලංකාවට රූපවාහිනිය හඳුන්වාදීම
8. මානව අභිමතාර්ථ සන්තර්පණයේ දී රූපවාහිනිය
9. රූපවාහිනී ටෙලිනාටක හා එහි දිශානතීන්
10. රූපවාහිනිය, ටෙලි නාට්‍ය හා කාන්තාව
11. පවුල පිළිබඳ න්‍යායාත්මක වපසරිය හා කාන්තාව
12. පිතෘමූලික සංකල්පයේ න්‍යාය හා භාවිතය, කාන්තාව
13. පිතෘමූලික දිශානතීන් විදහා දක්වන මාධ්‍යය හා රූපවාහිනි නාට්‍යය කාලාව
14. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

# පෙරවදන

නූතන සමාජය දෙස ඔබගේ අවධානට යොමු කරන විට පෙරදාට වඩා මෙරට සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රමය තුළින් මතුවී ඇති බොහෝ ප්‍රශ්න වලට හේතුව ලෙස ඇතමෙක් මෙරට 1970 දශකයේ හඳුන්වා දුන් විවෘත ආර්ථිකය මෙයට සෘජුව වගකිවයුතු බවට තර්ක කරන අතර තවඑකෙක් ඊට මෙරට රූපවාහිනියේ මාලා නාටක බලපාන බවත් එහිදි පවුල තුළ ස්ත්‍රී පුමුඛව සිදුවූ බලපෑම කෙරෙහි අවධානය යොමු කරනු දැකිය හැක. ඒ අනුව විවෘත ආර්ථිකය පිළිබඳ න්‍යායාත්මක හා මෙරට භාවිත තත්වයන් විමසීම කෙරෙහි මූලික අවධානය දෙමින් එහි ප්‍රතිඵල ලෙස ජනමාධ්‍යය පුමුඛ රූපවාහිනියේ නාටක මගින් පවුල් සංස්ථා තුල ස්ත්‍රීන් වෙත සිදුකරන බලපෑම පිළිබඳ න්‍යායාත්මක හා භාවිත තත්වයන් පිළිබඳ මූලික දැනුම හා අවබෝධය ලබාදීමේ අදහසින් මෙම කෘතිය සකස් කොට ඇත.

129,19
පොල්හේන,
මඩපාත,
පිළියන්දල

## 1. විවෘත ආර්ථිකය බිහිවීම හා එහි න්‍යායාත්මක දිශානතින්

කාලානුක්‍රමිකව මිනිසාගේ පැවැත්ම සුරක්ෂිත කරගැනීමේ ක්‍රියාවලිය තුළ විවිධ විධි ක්‍රමයන්, විවිධ න්‍යායන් හා මූලෝපායන් මගින් එම පැවැත්ම සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කර ගැනීමේ ස්භාවික සංසිද්ධිය වෙත මිනිසා නිරන්තරව සංක්‍රමණය වේ. එය මීට පෙර පැවති සමාජ සංස්ථාවන් නිර්වචනය කරගැනීමේ විෂය ක්ෂේත්‍රය තුළ වෙනත් අංශයන්ට වඩා සමස්ත සමාජය නියාමනය කරමින් ඍජු බලපෑමක් ආර්ථික උපක්‍රමයන් මගින් සැපයේ. ඒ වූකලී ග්‍රීක යුගයේ (**Greek Era**) සිට නූතනය **(Modern Er)** මානව පැවැත්ම දක්වා පැවැත්ම සුරක්ෂිත කිරීමේ කලාව තුළ විවිධ න්‍යායවේදීන් විවිධ කාලානුක්‍රමික සන්දර්භයක් ආග්‍රාහණය කරමින් නිෂ්පාදනය කරනු ලබන න්‍යායයන් තුළින් මනාව ප්‍රත්‍යක්ෂ වේ. " ග්‍රීක යුගයේ ඇරිස්ටෝටල් විසින් මිනිසාට මූලිකව පවතින ස්වභාවික ආශාවන් තුනක් තිබෙන බව පෙන්වා දී තිබේ. ඒනම් ධනය රැස්කිරිමට ඇති ආශාව, ලිංගික ජිවතයක් ගතකිරිමට ඇති ආශාව සහ බලය ලබාගැනීමේ ආශාව යනාදී වශයෙනි **(Samaranayaka, 1996, 67)** .

ඒ අනුව බලන විට මානව පැවැත්ම තහවුරු කරගැනීමේ ක්‍රියාවලිය තුළ මූලික අභිලාෂ හා අවශ්‍යතාවලට අනුකූලව පැවැත්ම තහවුරු කර ගැනීමේ සංසිද්ධිය තුළ මුළුමනින්ම පාහේ ව්‍යුහාත්මක වපසරියක් මගින් තීරණය කරන ලද බලවේගයක් ලෙස ආර්ථික මොඩලය අපට හඳුනාගත හැක. විශේෂයෙන්ම ග්‍රීක යුගයේ ඇරිස්ටෝටල් තම **Politics** කෘතිය මගින් අවධානයට ලක්කරන ධනය රැස් කරමින් ජීවත් වීමේ ආශාව ඕනෑම පුද්ගලයෙකුගේ ජීවිතය ජීවත් කිරීමේ ආහාර පාන ගනිමින් තම මූල්‍ය අවශ්‍යතාවයන් සංතෘප්ත කර ගැනීමේ නිබඳ අරගලයක නියැලෙන්නේ ද මේ ආකාරයෙන් ආර්ථිකව ජීවත් වීමේ ආශාව සුරක්ෂිත කිරීමටය. කෙසේ වෙතත්, ජීවත්වීමේ අයිතියේ ප්‍රකෘතිය ග්‍රීක යුගයේ සිට නූතනයේ දක්වා විවිධ උපායන්, මාදිලීන් භාවිත කරමින්, විවිධ රටවල බහුවිධ පුද්ගල අවශ්‍යතා සජීවීකරණය කරමින් යාවත්කාලීන කිරීමේ කලාවේ විවිධ සංස්තිථික ආරෝපිත යන්ගේ ඍජු බලපෑම අනුව වෙනස්වී පැවතීම අපට අද වන විට නූතන මානයන් තුල දැකිය හැක.

මෙකී ආරෝපිතයන් ආර්ථික, දේශපාලන හා සමාජීය ආදී විවිධ මාදිලීන් හා දෘෂ්ටිකෝණ උපක්‍රමයන් මනාව භාවිත කරමින් විශ්ලේෂණය කරනු දැකිය හැක. පුනරුදය, කාර්මික විප්ලවය යන ප්‍රස්තුයන් මුළුමනින්ම පාහේ යුරෝපීය ආර්ථික රටාව, ක්‍රියාවලිය වෙත ඍජු බලපෑම් සහගත විපරිවර්තනීය ආරෝපණයන් කිරීමට සමත් විය. මෙහිදී වඩා වැදගත් වන්නේ ඉහත ප්‍රස්තුතයන් ඔස්සේ මෙතෙක් පැවති ස්වයංපෝෂිත වැඩවසම් ආර්ථික ක්‍රමවේදය සම්පුර්ණයෙන්ම පාහේ අහෝසි කරමින් පුද්ගල පැවැත්ම සුරක්ෂිත කරගනු ලැබූ යැපුම් ආර්ථිකයේ මූලික සාධකයන් ආනයන අපනයන **(Export and Import)** ආර්ථික මොඩලයක් වෙත එනම් සංවෘතීය මාදිලීන් විවෘත මාදිලීන් වෙත බද්ධ වීම ආරම්භ වනුයේ 16 වන සියවසෙන් පසු යුරෝපීය පසුතලය තුළය. විශේෂයෙන්ම මෙයාකාරයට යුරෝපය තුල විපරිවර්තනීය ආරෝපිතයන්ගේ බලපෑම පුනරුදය, දේශ ගවේෂණය මගින් ඇති කරන ලද නව රාජ්‍යයන් සොයා ගැනීමේ කුතුහලය දනවන වීර කාව්‍ය මූලාශ්‍ර මගින් ආසියාව**(Asia)**, අප්‍රිකාව ( **Africa**), ලතින් ඇමෙරිකාව (**latin America**) වැනි කලාපවලට යටත්විජිතකරණයේ බලපෑම් වෙත ඍජුව නතු වනු දැකිය හැක. විවෘත ආර්ථිකයේ මොඩලය සම්බන්ධව විශේෂිත හා පැහැදිලි ඓතිහාසික පරිණාමන ක්‍රියාවලිය අපට හඳුනාගත හැකි අතර එහි බලපෑම හා ප්‍රතිපත්තිය රාජ්‍ය ක්‍රමයෙන් රාජ්‍ය ක්‍රමයට වෙනස් වනු දැකිය හැක. කෙසේ වෙතත්, වැඩවසම් සංවෘත ආර්ථික ක්‍රමය තුළ රාජ්‍ය ඒකකය තුළ සිටි සමස්ත පුරවැසියන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික හැඟීම් හා දැනීම්, ආවේග, අභිලාශ හා අවශ්‍යතා යන සියලු බලවේගයන් ඉඩම් භුක්තිය මගින් නිර්ණය කරන ලද වැඩවසම් ආකෘතිය තුළ ප්‍රධාන තීරණාත්මක මූලෝපායන් විය.

නමුත් වැඩවසම් ආකෘතිය බිඳ වැටීමත් සමග මෙතෙක් සමස්ත සමාජය ඒකාබද්ධව යාවත්කාලීන කරනු ලැබූ ප්‍රධාන මූල්‍ය උපායේ පැවැත්ම අකර්මණ්‍ය වීමක් දැකිය හැක. මෙහිදී මෙම ඓතිහාසික සංසිද්ධිය ඉතිහාසවේදීන්, ආර්ථික විශේෂඥයින් හා දේශපාලන විද්‍යාඥයින් විවිධ පර්යාවලෝකනයන් මූලාශ්‍ර කර ගැනීමෙන් තම අවධානයට යොමු කරන්නේ ධනවාදී අභිලාශ මගින් හික්මුණු ලබන ලිබ-රල්වාදී ගුරු කුලයට අයත් න්‍යාය හා භාවිතය මූලාශ්‍ර කර ගනිමිනි. එය එක් අතකින් ලිබරල්වාදයේ හරයාත්මක පදනම් සමස්ත ආර්ථික, දේශපාලන, සමාජීය හා සංස්කෘතික අවකාශ වෙත වඩා නිදහ-ස්ව, කිසිඳු විභේදනයකින් හා කිසිඳු බාධාවකින් තොරව පුද්ගල පැවැත්ම සුරක්ෂිත කිරීමේ ක්‍රමෝප-ායන් වෙත සංජානනය කිරීමට කරන ලද මෙහෙය වැදගත්ය. මෙහිදී එම මෙහෙය හා එහි සංසිද්ධිගත ක්‍රියාවලියේ දිශානතීන් කෙබඳුද යන්න හඳුනාගැනීම කෙරෙහි වැඩවසම් සමාජයේ නිර්මිත මූලික සංරචක හඳුනාගැනීම වැදගත්ය.

විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයන් ලංකාවේ මුහුදුබඩ හා උඩරට ප්‍රදේශවල ආධිපත්‍ය ව්‍යාප්ත කළ අවදියේ දී එනම් 18 වන සියවස ආරම්භයේ දී මෙරට මහජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කුඹුරු හා හේන් ගොවිතැනයි. එය මෙරට ගැමි ආර්ථිකයේ සාමූහිකත්වය සංවර්ධනය පදනම් කරගෙන ඉඩම් භුක්තිය මගින් නිර්ණය විය. "එමිල් ඩර්ක්හයිම්ට අනුව කෘෂිකාර්මික ස්වයංපෝෂිත පුද්ගලයන් තුළ වූ හෘද සාක්ෂියේ බලාත්මකභාවය කාර්මිකරණයට ලක් වූ ධනවාදී පවුල් සංස්ථාව තුළින් මුළුමනින්ම පාහේ වියෝජනය වීමත් හා එමගින් නිර්ණය වූ සමාජ විපර්යාසයක් අපට දැකගත හැකිය (Samaranayaka, 1996, 109)

එය වූ කලී යැපුම් කෘෂි ආර්ථිකයේ පදනම නූතන සමාජ අවකාශ වෙතින් ඛණ්ඩනය වීමක් මෙ-න්ම ගෝලීය ධනවාදයේ හරයාත්මක පදනම ශ්‍රී ලංකාව නමැති සන්දර්භය තුළ කාර්යක්ෂමභාවය, ගතිකත්වය, පුරෝකථනය, තාක්ෂණික පාලනය මුළුමනින්ම ලංකාවේ ස්වයංපෝෂිත සමබර ආහාර වේලකින් උකහා ගන්නා සංතෘප්තභාවය ක්ෂණික ආරුක්කුවලින් නියෝජනය වන ක්ෂණික ආහාර ලබන විලාසිතාවක් බවට පරිවර්තනය වනු දැකිය හැක. මෙකී සංසිද්ධිය ඇතැමෙක් විවෘත ආර්ථික මොඩලයේ දිශානතීන් ප්‍රසාරණය කිරීමක් ලෙස හඳුනාගනී. "විවෘත ආර්ථිකය සම්බන්ධව "ජෝර්ජ් රිට්සර්ගේ" අදහස වන්නේ ගෝලීයකරණයේ සෘජු ප්‍රතිඵල සමග නිබඳව සම්බන්ධ වෙමින් ලෝක-වාසී ජනතාවගේ භාවිතාවන් කිසිඳු විභේදනයකින් හෝ කිසිඳු සීමාවකින් තොරව විසුරුවා හැරීමකි. නොඑසේ නම්, මහද්වීප හරහා පුද්ගල සබඳතා ප්‍රසාරණය කිරීමකි. එහි ප්‍රබලත්වය වන්නේ සියලු දේ සඳහා විවෘත වීමත්, සියලූ දේ උකහා ගැනීමත්, ඒ මත පුද්ගල සමාජ ජීවිතය පෙර නොවූ විරූ ආකාරයට ප්‍රසාරණය වීමකි (Sen, 1996 ,111) "රොබින් විලියම්සන්ට අනුව විවෘත ආර්ථිකය යනු අර්ථ ශාස්ත්‍රයේම කොටසක් නොවන අතර මෙකී සුවිශේෂත්වය වනුයේ අර්ථ ශාස්ත්‍රය මගින් සමාජ, දේශ-පාලන හා සංස්කෘතික සංරචක නිෂ්පාදනය, බෙදා හැරීම හා ප්‍රතිව්‍යාප්තිය ශීඝ්‍ර පරිමාවක සීමා රහිතව සහ ඉතා වේගයෙන් සමස්ත සමාජයට විප්ලවීයකරණයට භාජනය වීමයි"( Lester, 2000, 58 ) .

මීට පෙර කිසිම කලෙක නොතිබූ පරිද්දෙන් ජයග්‍රහණයෙන් විශාල පරාසයකට අයත් පිරිසකට භාණ්ඩ හා සේවා අති විශාල ප්‍රමාණයක් ලබාගතහැකි වීම. මීට පෙර භාණ්ඩ හා සේවා ලබාගැනීම පාලනය වී තිබුනේ දේශපාලනයට කාලයට හෝ භූගෝලීය පිහිටීමට හෝ යටත්වය. මිනිසුන්ට අවශ්‍ය දේවල් ඒ හා සැණෙන් පහසු විදියකට ලබාගන්නට පුළුවන්කම ලැබී තිබීම මෙන්ම මීට පෙර තිබුනාට වඩා ඒකරූපී ගුණයෙන් යුතු භාණ්ඩ හා සේවා බහුරූපීයව ලබාගන්නට පුළුවන්කම ලැබීම. භාවිතාවට අවතීර්ණ වන්නට පෙරාතුව පැවතුණු මට්ටමට වඩා ගුණාත්මක පක්ෂයෙන් ඉහළ මට්ටමකින් යුක්ත භාණ්ඩ හා සේවා යටත් පිරිසෙයින් ජනගහනයෙන් කොටසකටවත් ලබාගන්නට පුළුවන්කම ලැබීම. මිල අධික, ඉහළ බද්දක් සහිත, භාණ්ඩ හා සේවා වෙනුවට ආර්ථික වශයෙන් වාසි ගෙන දෙන විකල්ප භාණ්ඩ හා සේවා භාවිතයට පැමිණීම. ඒ හේතුවෙන් මීට පෙර වියදම් කළාට වඩා වැඩි මුදලක් වියදම් කරමින් භාණ්ඩ හා සේවා ලබාගන්නට පුළුවන්කම ලැබීම. දීර්ඝ කාලීන වැඩමුරවල යෙදෙන සේවයේ යෙදෙන, වෙනත් කටයුතුවල නිරතවීම සඳහා එතරම් කාලයක් නොලැබෙන, ජනකොටස්වලට සීඝ්‍ර ලෙස කාර්යක්ෂම අන්දමින් භාණ්ඩ හා සේවා ලබාගන්නට පුළුවන්කම ලැබීම.

දීර්ඝ කාලීන වැඩමුරවල යෙදෙන සේවයේ යෙදෙන, වෙනත් කටයුතුවල නිරතවීම සඳහා එතරම් කාලයක් නොලැබෙන, ජනකොටස්වලට සීඝ්‍ර ලෙස කාර්යක්ෂම අන්දමින් භාණ්ඩ හා සේවා ලබාග න්නට පුළුවන්කම ලැබීම. ඉක්මණින් වෙනස්වන, මීට පෙර අත්දැක නැති, එතරම් මිත්‍රශීලී නොවන, ලෝකය තුළ විවෘත ආර්ථික ක්‍රමය විසින් ස්ථිරසාර, සුපුරුදු, ආරක්ෂිත වාතාවරණයක් ගොඩනගා තිබීම. ගණනය කිරීමේ ක්‍රමය නිසා පාරිභෝගිකයාට වෙනත් තරගකාරී භාණ්ඩ හා සන්සන්දනය කිරී- මේ හැකියාව පහසුවෙන්ම ලබා ගත හැකි වීම. එමෙන්ම පරෙස්සමෙන් නියාමනය කරන ලද ක්‍රමයක් තුළ යම් යම් නිෂ්පාදන (උදාහරණයක් ලෙස, තුලිත ආහාර වේල) ලබාගැනීම ආරක්ෂිත පියවරකි. ජනවාර්ගික, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සමාජ පන්ති නොතකා එක හා සමානව සැලකුම් ලබන්නට ජනයා තුල පවතින කැමැත්ත සාක්ෂාත් වීම. සංවිධානය හා නව තාක්ෂණික සොයාගැනීම් ජාලය හරහා ඉක්මණින්ම සහ පහසුවෙන්ම ව්‍යාප්ත වීමේ හැකියාව එක් සංස්කෘතියක් තුල වඩාත් ජනප්‍රිය අයිතමයක් තවත් සංස්කෘතියක් තුළ වේගයෙන් ව්‍යාප්ත කරවීමේ හැකියාව පැවතීම (Laksman, 1998 ,127).

මේ ආකාරයට විවිධ බුද්ධිමතුන් විවෘත ආර්ථිකය හඳුනාගනු ලබන්නේ කිසිඳු සීමා මායිම්වලින් තොරව සියලූ දේ ආනයනය හා සියලූ දේ අපනයනය සිදු කිරීම, නියත ලෙස අරුත් ගන්වන හෝ සාධනීයත්වයෙන් තොරව ඉල්ලූමට සැපයුම ලබා දීමේ ආර්ථික නියතය වඩාත් තිව්‍ර අන්දමත්, ගෝලීය- කරණ ආර්ථික ක්‍රියාවලිය තුළ සිදුකර ගැනීමට දරන දැඩි උත්සහයක් ලෙසය. මෙමගින් අපට පැහ- ැදිලි වනුයේ මිට පෙර පැවති ස්වයංපෝෂිත කෘෂිකර්මාන්තය තුළ පැවති සමස්ත සමාජය හික්මවීමේ අධිකාරී බලය රජු ප්‍රමුඛ වැඩවසම් ආකෘතියට හිමි වුවද, ධනවාදයේ පැවැත්ම තහවුරු කරගැනීමට එකී සංවෘත්ත ආර්ථික මොඩලය තව දුරටත් පවත්වාගෙන යාම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි වීමයි ඒ අනුව බලන විට නව අභිලාශ හා අවශ්‍යතා හමුවේ පෙනී සිටින ආර්ථික බුද්ධිමතුන් හා නිර්බාධවාදී චින්තකයන් කියන ලෙසකින් රජු වැඩවසම් ආකෘතිය හා විවිධ බල අධිකාරීන් ආර්ථිකයට බලපෑම් කිරීම කිසිඳු ලෙසකින් පිළිගන්නේ නැත.

"ජෙරමි බෙන්තම් වැනි උපයෝගීතා චින්තකයින් අපේක්ෂා කළ වැඩිම දෙනාගේ උපරිම සතුට සා- ක්ෂාත් කර ගැනීමට නම් දේශපාලන අධිකාරිය කිසිඳු ලෙසකින් ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම්,ෙ- බදා හැරීමේ සහ ප්‍රතිව්‍යාප්තියේ ක්‍රියාකාරකම්වලට අධිකාරී බලය යොදවමින් පාලනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී පුද්ගලයන්ට කිසි ලෙසකින් සතුටුදායක දෙයක් නොවන බවට තරයේ ප්‍රකාශ කර සිටියේය"

( Muwer, 2000, 79). ඊට හේතුන් ලෙස ඔහු දැක්වූයේ මිනිසා නිදහස්ව උපත ලබා ඇති අතර මිනිසා සියලූ යදම්වලින් බැඳී ඇත යන ජීන් ජැක්වීන් රූසෝ නමැති සමාජ සම්මුතිවාදීන්ගේ ප්‍රමුඛ අදහස් පූර්වාදර්ශ කර ගනිමිනි. ඒ අනුව මිනිසාගේ පැවැත්ම තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය තුළ දිනෙන් දින නිරන්තර විපරිවර්තනයන්ට ලක්වන මිනිසා තම අභිලාශ හා අවශ්‍යතා සන්තර්පණ ක්‍රියාවලිය බලාධිකාරය යොදවමින් මුළුමනින්ම පාහේ බල අධිකාරය සතු පුද්ගලයන්ගේ පටු අභිලාෂ හා අවශ්‍යතා උදෙසා කැපකිරීම වූ කලී පුද්ගල නිදහස, අයිතීන්, සමානාත්මතාවය, වගවීම හා වගකීම යන ප්‍රජාතන්ත්‍රවාදී පොදු හරයන් මුළුමනින්ම පාහේ අකර්මන්‍ය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජ අවකාශ- යක් තුළ කිසි ලෙසකින් පැවැත්ම තහවුරු කිරීමේ ක්‍රියාවලියට සුදුසු නොවන ආකාරයයි.

ඒ අනුව බලන විට ලිබරල්වාදීන් විසින් අපේක්ෂිත "නිදහස"(Freedom) යන ප්‍රස්තුතය මුළුමනින්ම පාහේ අවලෝකනය කර ගැනීමට උත්සුක වූයේ ධනවාදයට ඍජු ලෙස සමපාත වෙමිනි. මේ අනුව බලන විට විවෘත ආර්ථික මොඩලය වූ කලී ඍජුවම බල අධිකාරීත්වයෙන් තොරව ආර්ථික- යට නිදහසේ සැරි සැරීමට ඇති පරම අයිතිය නැවත නැවතත් ප්‍රකාශයට පත් කිරීමකි.

විශේෂයෙන්ම බොහෝ ආර්ථික විද්‍යාඥයන් (19 වන සියවස) පිළිගනු ලබන පොදු සත්‍යය වන්නේ ආර්ථිකයේ ප්‍රධාන නියතය වන ඉල්ලුමට සැපයුම ලබා දීමේ ප්‍රස්තුතය ස්වභාවික ප්‍රපංචයක් වන අතර එහි උද්වේගකර හැඟීම් හා ආවේග මගින් මිල පාලනය සිදු කළ නොහැකි බවයි. ඉන් වැඩිදුරටත් අදහස් වන්නේ මිල පාලනය නමැති ස්වභාවික ප්‍රපංචය ලිබරල්වාදී සුජාතකරණයට ලක් කිරීම අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුතු බවයි.

මෙම තර්කය අපට පැහැදිලිවම හඳුනාගත හැක්කේ ආර්ථික මොඩලය ධනවාදයේ උච්චතම අවධිය තුළ ධනවාදයේ සියලු දිශානතීන් ගෝලීයකරණයේ පර්යාවලෝකයත් සමග ඍජුව සමපාත වූ යුගයේදීය."යෝගේන්ද්‍ර සිං (2001) පවසන ආකාරයට ධනවාදී සමාජය මගින් නිර්මාණය කරන ලද එහි පැවැත්ම සුරක්ෂිත කර ගනිමින් පවත්වාගෙන යාමට නිර්ණය වූ විවෘත ආර්ථික මොඩලය වූ කලී ධනවාදී සමාජයට පමණක් නොව නූතනත්වය නමැති වියත් දෘෂ්ටිය විසින් සම්ප්‍රදාය දුරස්ථ කර ලද පශ්චාත් ධනවාදී සමාජයේ පවතින අනේක විධ මතවාදයන්, සංස්කෘතීන්, හර පද්ධතීන් තුල ඒවා ප්‍රකාශයට පත් වීමේ සංකේතාත්මක බලය ද විවෘත ආර්ථිකය මගින් ඍජුව සංවිධානය කරන ලද්දකි ( Richerd, 2007 ,159). සිංගේ තර්කයට අනුව අපට අවබෝධ වන්නේ විවෘත ආර්ථික මොඩලය මගින් පුද්ගලයන්ගේ ආර්ථික චර්යාව ජාතික තලයට පමණක් සීමා නොතබමින් කිසිඳු විභේදනයකින් තොරව බුද්ධිමය හා තාර්කික හැඟීම් හා ආවේග සියලු සමාජ සංස්ථාවන් වෙත ජනනය කරනු ලබන්නේ මෙම මොඩලය මගින් හඳුන්වා දෙන සීමා රහිත නිදහස් දිශානතීන් මාර්ග ස්ථ කර ගනිමින් බවයි. "ෂෝන් ප්‍රංශුවා ලයිෆෙත් බාති පශ්චාත් නූතන වාදින්ගේ තර්කනයන් ලෙස සාධනය කරන්නේ ද දැනුම සම්පාදනය කරන නිෂ්පාදන ඒකාධිකාරීන් වෙත ලබා දී ඇති නිදහස් මූලෝපායන් ගාව ගනිමින් බවය" (Fisher, 2007, 146). ඒ වූ කලී එක් අතකින් එකිනෙකා අතර ගැටුම්භාර/අනන්‍යතා/ප්‍රවණතා/අනේක විධ විවිධතා පවතින අතර සමස්තයව එක්ව පවුලක් ලෙස ඒකාග්‍රකරණය කිරීමේ හැකියාව විවෘත ආර්ථිකය නමැති ප්‍රබල මොඩලය තුළ මුළුමනින්ම පාහේ අන්තර්ගත වී ඇති බවයි. මෙය විවෘත ආර්ථිකයේ න්‍යායාත්මක දිශානතීන් සමස්ත සමාජයේ යහපත උදෙසා ඉල්ලුම සැපයුම යන සරල ආර්ථික නියතය තුළ මුළුමනින්ම පාහේ සමස්ත මානව වර්ගයාගේ හැඟීම්, දැනීම්, ආවේග නිෂ්පාදනය, පුනර්නිෂ්පාදනය හා යාවත්කාලීන කිරීම යන මූලික සිද්ධාන්ත තුන යටතේ නිරන්තර දෝලනය වීමකට ලක්වේ.

එමගින් හැකිතාක් උපරිම ලාභය ලබාගැනීමේ ධනවාදී මූලෝපායන් වෙත වඩ වඩාත් සංකේන්ද්‍රණය ගතකොට පවත්වාගෙන යාමට අදාළව ගොඩනගනු ලබන හා අඛණ්ඩව පවත්වාගෙන යා හැකි මෙවලම ලෙස විවෘත ආර්ථිකයේ මොඩලය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රටවල ව්‍යවස්ථාපිත නොඑසේ නම් ව්‍යවස්ථාව ආදේශ කරන ලද ආරෝපිතයන් ධනවාදය ගෝලීයකරණය වීමේ ඍජු ආභාසය සහිතව සිදුවීම යුරෝපය ප්‍රමුඛ කරගෙන දැකගත හැක. මේ ආකාරයට බැලූ විට අපට පැහැදිලි වන්නේ විවෘත ආර්ථිකය නමැති මොඩලය න්‍යායාත්මකව යුරෝපීය ධනවාදයේ අභිලාෂ හා අවශ්‍යතාවන් පුනර්නිෂ්පාදනය කිරීමට අදාළ යුරෝපීය දේශපාලන, සමාජ හා ආර්ථික සංදර්භය පූර්වාදර්ශ කර ගනිමින් බිහිවන අතර එය බැලූ බැල්මට ආර්ථික ක්ෂේත්‍රයට හෙවත් ආධිපත්‍යයට පමණක් සීමා වන මොඩලයක් බව පෙනුන ද එය විචක්ෂණශීලීව අවධානයට ලක් කළවිට එමගින් උද්දීපනය කරනුයේ සංස්ථික රූපනයන්ගෙන් නිශ්චිත හා පැහැදිලි වෙනස්කම් දැකිය හැක.

ඒවා නම් සමස්ත සමාජය ඒකාග්‍රකරණය කිරීමෙන් පෘථුල කෞශල්‍යයෙන් හෙබි සමස්ත සමාජය මිල පාලනයන්ට සමග්‍රාහීව මෙහෙයවමින් සමස්ත සමාජයේ පුද්ගලයන්ගේ හැඟීම් හා ආවේග බහුරූපීය චලිතයක් වෙත ඒකාබද්ධ කරනු ලබන්නේ විවෘත ආර්ථිකය මගිනි. විවෘත ආර්ථික මෙකී කාර්යය හා සංසිද්ධිය වඩා සක්‍රියව පවත්වාගෙන යාම සඳහා ජනමාධ්‍ය, බහු ජාතික සමාගම් ආදී සමස්ත සමාජයට තිර බලපෑමක් කළ හැකි මෙවලම් පූර්වාදර්ශ කර ගන්නා ආකාරය විවෘත ආර්ථික මොඩලය සම්බන්ධව ඇති සංකල්පීය දිශානතීන් මගින් අපට අවබෝධ කර ගත හැක.

සංවෘත ආර්ථිකය හා ශ්‍රී ලංකාව ශ්‍රී ලාංකීය දේශපාලන, ආර්ථික, සමාජයීය හා සංස්කෘතිය හැසිරවීමේ උපකරණය මෙන්ම මෙම සියලු අංශයන් දැඩිව පවත්වාගෙන යාමේ සංස්ථිතිය ඉඩම් හිමිකම මගින් නිර්ණය වූ රාජකාරි ක්‍රමය ප්‍රතිනිෂ්පාදනය විය. එය වූ කලී සමස්ත සමාජයේම පුද්ගල ජීවිතයන්හි පැවැත්ම නිර්ණය කිරීමට අදාළව මූලික අභිලාෂ හා අවශ්‍යතා නිර්ණය කිරීම, එම මූලික අවශ්‍යතා සපයා ගැනීමට අදාළ උපක්‍රම නිර්ණය කිරීම, ඒවා යාවත්කාලීන කිරීම හා සීමා පැනවීම ආදිය සම්බන්ධ සියලු නිෂ්පාදන ඒකාධිකාරය රජු සතු විය. එනම් මින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ සංවෘත ආර්ථිකය ලෙස අප හඳුනාගනු ලබන්නේ මෙරට ඉතිහාස කතිකාවත විධිමත්ව ආරම්භ වන පණ්ඩුකාභය රජු විසින් මෙරට සැළසුම් සහගත නගරය නිර්මාණය කළ අනුරපුර යුගයේ සිටය. ඉන් අනතුරුව ක්‍රමයෙන් රාජධානිය පොළොන්නරුව හා පසුකාලීනව විවිධ සන්දර්භයන් යටතේ නිරිත දිගට මාරුවෙන කාල වකවානුව හා මෙරට සිංහල රාජධානිය අවසන් වන මහනුවර යුගය තෙක් කාලපරිච්ඡේදය මෙරට සංවෘත ආර්ථිකයේ හර පද්ධතීන් ක්‍රියාත්මක වූ ආකාරය අපට හඳුනා ගත හැක. ඒ අනුව මෙකී කාල කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය ඒකාධිකාරය මගින් මුළුමනින්ම පාහේ මෙරට ආර්ථිකය හැසිරවීම වූ ආකාරය අපට පැහැදිලි විය. සංවෘත ආර්ථිකයේ මූලික සංරචක මුළුමනින්ම පාහේ ආර්ථික අංශය රාජ්‍ය දේහය මත නොඑසේනම් රජු වෙත ප්‍රතිබද්ධ වී ඇති ආකාරය පැහැදිලිය. උක්කුබණ්ඩා "ශ්‍රී ලාංකීය ස්වයංපෝෂිත ආර්ථික රටාවේ ප්‍රබලතම ලක්ෂණය වූයේ රජු අවශ්‍යතා සඳහා ගොඩනගාගෙන තිබූ කුල ක්‍රමය හා එමගින් නිර්ණය වූ කාර්ය විභේදනයයි. එය වූ කලී මෙරට යැපුම් ආර්ථික කෘෂිකර්මය සමස්ත සාමාජයීය හා සංස්කෘතික හරයන් වෙත කිරීමට කරන ලද මෙ-හෙයද විශේෂයෙන්ම සැළකිල්ලට ගත යුතුය"( උක්කුබණ්ඩා, 1989, 56).

මොහුගේ තර්කය අනුව අපට පැහැදිලි වන්නේ මෙරට සංවෘත ආර්ථිකය තීරණය කිරීමේදී රජුගේ බල අධිකාරියට සමග්‍රාහී වෙමින් නිෂ්පාදනය කළ කුල ක්‍රමය, මෙරට ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයේ ප්‍රකට ලක්ෂණයක් විය. මෙරට සංවෘත ආර්ථිකය පවත්වාගෙන යාමේ මූලික හා තීරක බලපෑම මෙම රජුගේ මූලික අභිලාෂ හා අවශ්‍යතාවන්ට සමපාතිකව නිර්ණය කර තිබූ අතර එමගින් රටේ සමස්ත පුර-වැසියන්ගේ අභිලාෂ හා අවශ්‍යතාවලට ඍජුව ප්‍රතිබද්ධ විය. විශේෂයෙන්ම කිසිම ආකාරයක් "මූල්‍ය" භාවිතයන් සිදු නොවුන සමකාලීන මෙරට සංවෘත ආර්ථික ක්‍රමවේදය තුළ පුද්ගලයන් තමන්ගේ ජීවන පැවැත්ම සුරක්ෂිත කිරීමට අදාළ දෑ කිරීම සිදු කළ අතර තමන්ට නිෂ්පාදනය කළ නොහැකි භාණ්ඩ එනම් වළං, පැදුරු, ආයුධ ආදිය නිෂ්පාදනය කරන්නන් වී, ධාන්‍ය ආදිය හුවමාරු කරගනු ලැබීය.

ඒ අනුව සංවෘත ආර්ථික ක්‍රමවේදය තුළ එම සමාජ ක්‍රමයන්ට යැපීමට ප්‍රමාණවත් මූලික අවශ්‍යතාවයන් සන්තර්පණයට අදාළව භාණ්ඩ හුවමාරුව සිදු කෙරිණි. මෙම ක්‍රමය තුළ මුදල් හුවමාරුව භාවිතය රජු ප්‍රමුඛ රදළ පෙළපතට පමණක් සීමා විය. එමෙන්ම සමාජ ක්‍රමය තුළ නූතන ආර්ථික ක්‍රමවේදය තුළ මෙන් නොව පුරවැසියන්ට තමන්ගේ තමන්ගේ අභිලාෂ හා අවශ්‍යතා සන්තර්පණය කර ගැනීමේ නව උපායන්, උපක්‍රම ලබා ගැනීමට කිසිඳු වරණයක් නොවීය. වෙනත් ලෙසකට සඳහන් කරන්නේ නම්, තම හැඟීම්, දැනීම් හා ආවේගවලට අදාළව පැවැත්ම නිර්ණය කිරීමේ සංරචකයන් වෙත ගමන් කිරීමේ කිසිඳු තෝරා බේරාගෙන ඔවුන්ගේ කැමැත්ත සමග සංයෝජනය වීමේ අවකාශය-ක් නොවීය. එනම් රජු විසින් දෙන ලද තීන්දු තීරණ හා නියෝග එයාකාරයෙන්ම ක්‍රියාත්මක කළ යුතු අතර එලෙස නොවූ විට කිසිඳු වගවිභාගයකින් තොරව ජනතාවට දැඩි දඬුවම් පැමිණවීමේ හැකිය-ාව රජු සතුය. මෙයාකාරයට සංවෘත ආර්ථිකය තුළ තවත් මූලරචකයක් වන්නේ ආර්ථික නිදහසක් ජනතාවට හිමි නෙවීම හා දැඩි, අනම්‍ය නීති හා දඬුවම් ක්‍රමවේද මගින් රජුගේ ආර්ථික ඒකාධිකාරය පවත්වාගෙන යාමයි. මෙහිදි ස්ත්‍රී පුරුෂ තුළ ආදී කිසිඳු විභේදනයකින් තොරව මෙකී සංවෘත ආර්ථික ක්‍රමවේදය සමස්තය අද අප හඳුන්වන සාර්ව ආර්ථිකය හා පොදු ආර්ථිකය නියාමනය කිරීමේ හිමිකම හා කාර්යක්ෂමභාවය රජු සතු අයිතීන් විය. මෙයාකාරයට සංවෘත ආර්ථිකය තුළ තවත් මූලරචකයක් වන්නේ ආර්ථික නිදහසක් ජනතාවට හිමි නෙවීම හා දැඩි, අනම්‍ය නීති හා දඬුවම් ක්‍රමවේද මගින් රජුගේ ආර්ථික ඒකාධිකාරය පවත්වාගෙන යාමයි. මෙහිදි ස්ත්‍රී පුරුෂ තුළ ආදී කිසිඳු විභේදනයකි-න් තොරව මෙකී සංවෘත ආර්ථික ක්‍රමවේදය සමස්තය අද අප හඳුන්වන සාර්ව ආර්ථිකය හා පොදු ආර්ථිකය නියාමනය කිරීමේ හිමිකම හා කාර්යක්ෂමභාවය රජු සතු අයිතීන් විය.

ආර්ථික අංශය යටතේ පමණක් නොව කිසිඳු ආකාරයකින් ජනතාවට අයිතියක් නොවීය. එය නූතන ආර්ථික ක්‍රමවේදය තුළ අප භුක්ති විඳින සාර්ව අයිතීන් හා නිදහස්කාමී ව්‍යුහාත්මක හැඟීම්වලින් මුළුමනින්ම පාහේ වියෝජනය විය. එමෙන්ම පුද්ගලයන්ට අදාළ භාණ්ඩ නිෂ්පාදනය බෙදාහැරීම පුනර්නිෂ්පාදනයේ ඒකාධිකාරය අයිතිය රජු සතු විය. එකී කාර්යය උදෙසා මෙම ක්‍රමවේදය තුළ විකල්පයන් නොවීය. සරල සීමිත අභිලාෂ හා අවශ්‍යතා සන්තර්පණය ක්‍රියාවලියට අදාළව පුද්ගලයන්ට බාහිර ලෝකය සන්නිවේදන පරාසයන් සමකාලීන මෙරට යටත් වැසියන්ට නොවීය. වෙළඳාම, ලාභය, පාරිභෝගිකයන් යනු විවෘත ආර්ථිකයේ වාස්තවික මූලයන්ගේ කිසිඳු චායාක්වත් මෙම යුගයේ ප්‍රතීයමාන නොවීය. එමෙන්ම සංවෘත ආර්ථික ක්‍රමයේ භූගෝලීය ව්‍යුහයන් ඒකාබද්ධ වූයේ "ගම" තුළින් සරල ස්වයංපෝෂිත මානයන් වෙත වූ අතර එමගින් මුළුමනින්ම පාහේ ස්වයං-පෝෂිත කෘෂිකාර්මික ජන ජීවිතය පවත්වාගෙන යාමට අදාළ සංවෘත ආර්ථික රටාවේ බොහෝ ව්‍යුහ-ාත්මක ලක්ෂණවලින් පෝෂණය විය.සංවෘත ආර්ථික ක්‍රමය තුළ පුද්ගලයන් එකිනෙකා අතර පැවති-යේ නොබිඳිය හැකි අඛණ්ඩ ඒකාබද්ධතාවයක් පවත්වාගෙන යා හැකි නූතනය සමාජ කතිකාවත තුළ නම් සංරක්ෂණය කොට පවත්වාගෙන යා යුතු ගුණාංගයකි. එය වූ කලී මෙම ක්‍රමයේ සහජීවනත්වය වඩාත් ප්‍රතීයමාන කරනු ලැබූ හෘද සාක්ෂිය විය.

එමිල් ඩර්ක්හයිම් පවසන ආකාරයට කාර්මික සමාජ ක්‍රමයන්ට හොඳින් මානවයා ප්‍රතිබද්ධ වීමෙන් අනතුරුව ස්වයංපෝෂී කෘෂි ආර්ථික දිවි පැවැත්ම තුළ පැවති එකිනෙක පුද්ගලයන්ගේ ලබාදීම හා සෙනෙහස, කැමැත්ත, ආශක්තභාවය, හැඟීම්, ආවේග, ප්‍රතිරූපණයන් හා එකඟත්වය ආදී මානව සංහතිය පොදු මානව ගුණධර්ම වෙත ප්‍රතිබද්ධ වනු දැකිය හැක. එය වූ කලී ලෝක ඉතිහාසය තුළ මිනිසා හා රාජ්‍යය අතර සබඳතාවය කිසියම් අනුක්‍රමික රටාවන් ඔස්සේ විකාශනය වූවක් වශයෙන් සැළකිය හැක. විශේෂයෙන්ම ලෝක සන්දර්භය තුළ භෞතික හා සදාචාර සනත්වයේ විකාශනය හේතු කොටගෙන සමාජ වෙනස්වීම් තරවුරු විය. (Emil Durkehim, 1934, P.39,) .

මේ පසුබිම තුළ රාජ්‍යය සංකල්පය ද කෘත්‍යාත්මක හා ව්‍යුහාත්මක වෙනසකට භාජනය වූ අතර මෙතෙක් පුරවැසියන් වෙනුවෙන් රාජ්‍යය ඉටු කළ කාර්යය විවිධ අංශ යටතේ පුළුල් හා සංකීර්ණ අයුරින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලය වූයේ ප්‍රමාණාත්මක වර්ධනය සමග ගුණාත්මක පිරිහීමක් සටහන් වීමයි. ඒ අනුව මතු වූ ප්‍රධාන තර්කය වූයේ තම අභිලාෂ හා අවශ්‍යතා හමුවේ නිර්මාණය වූ සුවිශාල රාජ්‍ය යාන්ත්‍රණය මහජන වරණය උපරිම කිරීමට අදාළ මහජන අවශ්‍යතා සපුරාලීමේ විකල්ප මාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම සමකාලීන යුරෝපීය අධෝ ව්‍යුහය තුළ අත්‍යවශ්‍ය කරුණක් විය. මෙයාකාරයට රාජ්‍ය ඒකාධිකාරී මොඩලය තුළ රාජ්‍ය අංශයට පරිබාහිරව මහජන වරණය උපරිම කිරීම සඳහා ලිබරල්වාදී ආර්ථික න්‍යායවේදීන්ගේ තර්කයන් සමග ඍජුව සමපාත වනු දැකිය හැක. විශේෂයෙන්ම අප මෙහිදී අවබෝධයේ තබා ගත යුතු කරුණු කිහිපයකි. ඒවානම්, යුරෝපීය සංවෘත ආර්ථික ක්‍රමයට සමගාමීව ශ්‍රී ලංකාවේ සංවෘත ආර්ථිකයේ ප්‍රතීයමානයන් දැකගත හැකි නමුත් ලාංකීය සංවෘත ආර්ථික මොඩලය සුවිශේෂී ලක්ෂණ ඇති බව අප විසින් හඳුනාගනු ලැබුවේය. යුරෝපයේ මධ්‍යතන යුගය වන තෙක්ම එනම් වැඩවසම් මොඩලය බිඳ වැටෙන තෙක්ම පැවතියේ මෙකී ආකෘතියයි. පුනරුදය, දේශගවේශනය, කාර්මික විප්ලවය ආදී සාධක මගින් යුරෝපය තුළ ඇති කරන ලද ප්‍රතිඵල බොහෝමයකි. ඒ අතර ප්‍රමුඛ වූයේ මෙතෙක් පාප් වහන්සේගේ හා පල්ලියේ දැඩි ග්‍රහණයට නතුව පැවති රාජ්‍ය නව ජාතික රාජ්‍යයන් බිහි කරගැනීමට අදාළව යුරෝපය තුළ කටයුතු ප්‍රතිසංවිධානය වීමයි. මෙහිදී රජු වෙත විශාල බලයක් නොවූ අතර නව අභිලාෂ සමග ගොඩනැගීමත් පැවති නව මධ්‍යම පන්තියේ නව අභිලාෂ අනූව රාජ්‍ය ආර්ථික අංශය කෙරෙහි දැඩි ලෙස බලපෑම් කිරීමේ හැකියාවට කිසි ලෙසකින්වත් වළකනු නොවීය. එමෙන්ම පල්ලියේ ආධිපත්‍ය බිඳ දමා ජාතික රාජ්‍යයේ ගොඩනගා ගන්නා නව රජවරුන්ට පෙර සිට ප්‍රභූ රදළ වංශාධිපතීන්ගේ බැඳීයාවට වඩාත්ම මධ්‍යම පන්තිය තමන් වෙත බද්ධ කර ගැනීම ඔවුන් සමග ගනුදෙනු ඇරඹුම වාසි සහගත විය.

ඒ අනුව 16 සියවසේ යුරෝපයේ ජාතික රාජ්‍ය මොඩලය තුළ නව මධ්‍යම පන්තියේ අභිලාෂවලට අනුකූලව ආර්ථික අංශය රාජ්‍යයේ ඍජු මැදිහත් වීමෙන් පරිබාහිරව පිහිටුවීම අත්‍යවශ්‍ය විය. ඒ අනුව "නිදහස" නැමැති ප්‍රස්තුතය මුල් කරගෙන න්‍යායාත්මකව ලිබරල්වාදය නැමැති ප්‍රස්තුතය සමග ඍජුව වර්ධනය වන්නේ ආර්ථිකයට මීට පෙර තිබූ බැඳීම් හා සීමාවන්ගෙන් රහිත ලිහිල් කරන ප්‍රතිපත්ති අනුගමනය කරමින් නිර්මාණය වන්නේ විවෘත ආර්ථික මොඩලයයි. මෙයාකාරයට විවෘත ආර්ථික මොඩලය බටහිර යුරෝපය තුළ න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව බිහි වුවද, අද වන විට මෙකී ආර්ථික මොඩලය ක්‍රියාත්මක නොවන රාජ්‍යය ඒකකයන් සොයා ගැනීම අපහසු කාරණයකි.

විශේෂයෙන්ම යටත්විජිතකරණය, දේශපාලන නවිකරණය යන සාධක ද්විත්වයේ සමායෝජන බල ක්‍රමයට ශ්‍රී ලංකාව ප්‍රමුඛ ආසියානු කලාපයට විවෘත ආර්ථික ක්‍රමවේදය සංක්‍රමණය වනු දැකිය හැක. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත්විජිත ග්‍රහණයෙන් නිදහස ලබා ගැනීමෙන් අනතුරුව සිය සංවර්ධන අභිලාෂයන් සාධනීය කරගැනීමේ ක්‍රියාදාමය කෙරෙහි විවිධ ක්‍රම උපායන් වෙත බද්ධ වීම අත්‍යවශ්‍ය කරුණක් විය. ඒ අනුව නිදහස් ජාතියක් තම පැවැත්ම සුරක්ෂිත කර ගැනීමේ ක්‍රියාදාමය තුළ බාහිර හා අභ්‍යන්තර සාධක මගින් නිර්ණය කරනු ලැබූ අතර ඒවා සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික යන සියල්ලෙහි සමෝදානයක් විය. විශේෂයෙන්ම මේ වන තෙක් පැවති සංවෘත ආර්ථික ක්‍රමය වූ කලී මෙරට රාජාණ්ඩු ක්‍රමික ආකෘතිය තුළ දේශපාලනයේ ප්‍රතිබිම්බනය විය. නමුත් යුරෝපීය දේශපාලන තලය ලිබරල්වාදී න්‍යාය මගින් හැසිරවීම සිදු කළ අතර ශ්‍රී ලංකාවේ සියලු අංශ වෙත ඍජු බද්ධභාවයක් ප්‍රතිබිම්බනය කරමින් පෙරළි කරන භූමිකාවන් වෙත ප්‍රකට වූයේ මෙරටට විවෘත ආර්ථික මොඩලයන් හඳුන්වා දී මෙකී මොඩලය පිළිබඳ ජනප්‍රිය අවකාශය තුළ අවධානයට ලක් වන්නේ 1977න් පසුවය. ඊට හේතුව වන්නේ 1977ට පෙර විවෘත ආර්ථිකය සම්බන්ධව ෆීලික්ස් ඩයස් වැන්නවුන් අවධානය දී තිබුණ ද මෙරට නෛතික අවකාශ තුළ ඊට අදාළ සියලු දේශපාලන, සමාජ හා ආර්ථික ව්‍යුහාත්මක සන්දර්භය ගොඩනගන්නේ එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුව තුළ බහුතරය ලබා ගැනීමෙන් අනතුරුවයි.

## 2. විවෘත ආර්ථිකය ශ්‍රී ලංකාවට හඳුන්වාදීම

"ආර්ථිකය විවෘත කළ යුතු විදේශ ආයෝජන ප්‍රතිපත්තිය අනුව මුල්ම විදේශ ආයෝජන පනත ගෙනාවේ ජේ. ආර්. ගේ යුගයේදී මුදල් ඇමති වූ රොනී ද මැල් විසින් නොවෙයි. ඊට පෙර පැවති ශ්‍රී.ල.නි.ප. ආණ්ඩුවේ මුදල් ඇමති වූ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා විසිනුයි. විදේශ ආයෝජන ධවල පත්‍රිකාව ඉදිරිපත් කළේ මට මතක හැටියට ඇන්. ඇම්. පෙරේරා මහතායි. නිදහස් වෙළඳ කලාප ගැනත් ඔහු කතා කළේය. ඇන්. ඇම්. මුදල් ඇමති වශයෙන් සිටියේදී පවා යම් යම් බාධා සීමාවන් තිබුනේ වී නමුත් එය සංවෘත ආර්ථිකයක් යයි කිව නොහැක."(Lakshman, 1997, 70).අඩු තරමින් ඉන්දියාවේ, බුරුමයේ හෝ චීනයේ තත්ත්වයටවත් ආර්ථිකය සංවෘත වූයේ නැත. නිදහස ලැබීමෙන් පසුව දිගටම නොයෙක් ආකාරයේ වෙනස්කම් ඇති කරමින් අනුගමනය කළේ සංවෘත ආර්ථික ප්‍රතිපත්තියක් නොවෙයි. විවෘත ආර්ථික ප්‍රතිපත්ති ජනප්‍රිය දේශපාලන සටන් විලාශය ගත්තේ මෑත කාලයේදීය. 1970 දශකයේ ධනවාදී ලෝකය මුහුණ දී තිබුණු දරුණු ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න යොදා ගත්තු උපක්‍රමයක් හැටියටත් මේ කාලයේදී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ජනප්‍රිය විය.

විශේෂයෙන්ම කාටර්ගේ පාලන කාලය තුළ ඇමෙරිකාවේ ආර්ථිකය බරපතල ප්‍රශ්නවලට මුහුණ දුන්හ. විරැකියාව ඉහළ ගොස් තිබුණු අතර, උද්ධමනයද දැඩි ලෙස ඉහළ ගොස් තිබුණු තත්ත්වයක් ඇතිවිය. මෙයට හේතු වූයේ ඔවුහු එතෙක් අනුගමනය කරගෙන ආ මිල්ටන් ෆ්‍රීඩ්මන්ගේ මූල්‍යමය ප්‍රතිපත්ති කියලා කිව හැකියි. ඒ කියන්නේ මුදල් තමයි වැදගත්ම අංශය කියලා සළකන සංකල්පය මත ඇති කරගත් ආර්ථික ප්‍රතිපත්ති බංකොළොත් වෙන්නට පටන් ගත්හ. මීට කලින් අනුගමනය කළේ එම කේන්ස්ගේ ආර්ථික ප්‍රතිපත්තියයි. කලින් හිටපු නික්සන් සහ කෙනඩි වැනි අය වැඩිපුර අනුගමනය කළේ කේන්ස්ගේ ආර්ථික ප්‍රතිපත්තියයි. කේන්ස්ගේ ප්‍රතිපත්ති පරිභෝජනය පදනම් කරගත් එකකි. මිනිසුන්ට වැඩිපුර ආධාර දිය යුතුය. එසේ මිනිසුන්ගේ ඉල්ලීම වැඩි කිරීම කිරීම තුළින් නිෂ්පාදනය ඉහළ යැවීම කියන මතය ප්‍රධාන කරගත් ප්‍රතිපත්තියක් විය.

මෙම ආර්ථික ප්‍රතිපත්තිවල අර්බුදයක් නිසායි පෙර කී මුදල් ප්‍රධාන කොටගත් මූල්‍ය ආර්ථික ප්‍රතිපත්තිවල අර්බුදයන් නිසා නැවත වරක් නිෂ්පාදකයාට දිරිදීමේ පැරණි ප්‍රතිපත්තියට නැවත පැමිණියේය. පාරිභෝගිකයාට දිරිදීම නොවෙයි නිෂ්පාදකයාට දිරිදීම කළ යුතුයි යන පිළිගැනීමට නැවත පැමිණියහ. මෙය සප්ලයිඩ් ඉකොනොමික් යනුවෙන් හැඳින්විය. මෙය ඇමෙරිකාව වැනි රටවල තිබුණු අර්බුදවලින් තාවකාලිකව සාර්ථකභාවයට විවිධ හේතූන් තිබිණ. විශෙෂයෙන් තෙල් අර්බුදය නිසා ධනය රැස් කරගත් මැද පෙරදිග ධනවතුන්, ඇමෙරිකාව සහ බටහිර වෙනත් රටවල ගොස් එහි ආයෝජනය කළේය. නිෂ්පාදකයාට දිරිදීමේ ප්‍රතිපත්තිය පිළිගැනීම නිසා ආයෝජකයෝ ඇමෙරිකාව ආයෝජනය සඳහා ආරක්ෂිත ස්ථානයක් ලෙස සැළකුවා. මෙම සැපයුම් පාර්ශවයේ ආර්ථික ප්‍රතිපත්තිය ධනවාදී ලෝකයේ ඒ සමගම බෙහෙවින් ජනප්‍රිය විය.

ඇමෙරිකාවේ රේගන්ගේ සමයේ තැචර් යටතේ මහා බ්‍රිතාන්‍යය, බටහිර ජර්මනිය සහ අනෙකුත් බටහිර රටවල් මෙම ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කරන්නට පටන් ගත්තායින් පස්සේ මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය වැනි මූල්‍ය ආයතන මගින් සංවර්ධනය වන ලෝකයට දෙන ණය හා අනෙකුත් මූල්‍ය ආධාර හරහා ලෝකයේ අනෙකුත් රටවල් පිළිබඳ බලපෑම් කළේය. එම ආර්ථික ප්‍රතිපත්තිය පිළිගන්නෙයි කියන ලදි. මේ නිසා කමයි 1977න් පසු රොනී ද මෙල් මහතා මුදල් ඇමති වශයෙන් සිටියදී හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ඒ අයුරින් අපට හඳුන්වා දෙනු ලැබීය.

"ලොව පුරා යළි ජනප්‍රිය වූ මෙම නිෂ්පාදන දිරිදීමේ ප්‍රතිපත්තිය ලෙස හඳුන්වා දුන්නත් එය 1976දී ඇඩම් ස්මිත් ජාතීන්ගේ ධනය නමැති පොත ලියද්දී ඉදිරිපත් කළ මූලික ප්‍රතිපත්තිවලට වඩා වැඩි දෙයක් නොවෙයි. රටවල් අතර වෙළඳ කටයුතු සම්බන්ධයෙන් බාධාවන් නොතිබිය යුතුයි ඔහුට කියන්න පුළුවන් විය. නිදහස් හුවමාරුව නියමයක් ලෙස පිළිගත යුතු යැයි ඔහු කියා සිටියේය. වික්ටෝරියා රැජිණගේ කාලයේදී මහා බ්‍රිතාන්‍යය මේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිගනු ලැබීය. ඒ ප්‍රතිපත්තියටම තමයි නිදහස් ආර්ථිකය, නිර්බාධ ආර්ථිකය එසෙත් නැතහොත් විවෘත ආර්ථිකය ලෙස අප හඳුන්වන්නේ (Lakshman, 1998, 45)

## 3. ශ්‍රී ලංකාවේ සංවෘත ආර්ථික මොඩලය වෙත විවෘත ආර්ථික මොඩලය හඳුන්වාදීම තුළ සිදු වූ බලපෑම

ශ්‍රී ලංකාව අප හඳුනාගනු ලබන්නේ ස්වභාවික සම්පත්වලින් අනූණ කෘෂි ජන ජීවිතය සුදුසු සියලු ස්වභාවික සම්පත්වලින් ගහණය වූ රාජ්‍යයකි. මෙම රාජ්‍යයේ ඉතිහාසය දෙස අපගේ අවධානය යොමු කළහොත් පැහැදිලි වන කරුණු කිහිපයක් වේ.

එම්. ඩී. රාගවන්ගේ "Ceylon Culture" යන කෘතිය තුළ සහ ඉන්ද්‍රාණි මුණසිංහගේ "ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය" නැමැති කෘතිය තුළ ලංකාවේ කෘෂිකාර්මික දිවිපෙවත හා එමගින් නිර්ණය වූ සමාජ, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයන්හි බලපැවැත්ම කෙසේද යන්න විග්‍රහ කරයි. මෙවන් කෘතිවලින් ගෙන එන මූලික තර්ක මගින් අපට පැහැදිලි කර ගත හැකි කරුණු කිහිපයකි. එනම් මෙරට පුද්ගලයන්ගේ ජන ජීවිතය දිවි පැවැත්ම මුලුමනින්ම පාහේ ගොඩනගනු ලැබුවේ කෘෂිකර්මයයි. ඊට හේතු පාදක වූයේ මෙරට පුද්ගලයන්ට කිසිඳු ආකාරයකින් ඉඩම් පිළිබඳ හිමිකමක් නොතිබූ අතර සියළු ඉඩම්වල හිමිකාරීත්වය පැවතියේ රජු ප්‍රමුඛ වැඩවසම් ආකෘතියටයි. එහිදී මෙරට කෘෂිකාර්මික දිවිපෙවත සක්‍රීය කරගනු ලැබූ බොහෝ මූල රචකයන් එම අවධියේ මෙරට සමාජය, සංස්කෘතිය පමණක් නොව ආර්ථිකය හා දේශපාලනයද ඒකාග්‍රකරණය කිරීමේ මුදුන් මල්කඩ විය. ඊට හේතුව වූයේ ගොවිතැන මගින් සමස්ත සමාජය යාමනය කිරීමට අදාළ, සමස්ත සමාජය ප්‍රතිබද්ධ කරගැනීමට අදාළ සිද්ධාන්තයන් නිර්ණ වීමයි. එය වූ කලී අවුරුදු දසදහස් ගණනක් මෙරට පැවැත්ම සුරක්ෂිත කිරීමේ සියළු මෙවලම් යාමනය කිරීමට අදාළ කටයුතු ප්‍රතිසංවිධානය කිරීමකි.එය නූතන අර්ථයෙන් ආර්ථික මොඩලයක් සම්බන්ධව විවිධ න්‍යායවේදීන්ගේ මතවාදයන් සමග ඍජුව සමපාත වීම ප්‍රමාණවත් නොමැත. ඊට හේතු සාදක වනුයේ සරල ප්‍රාථමික දිවිපෙවතක් තුළ තම පැවැත්ම නිර්ණය කරගනු ලැබූ මෙරට ස්වදේශිකයන් වෙත නිදහසේ අර්ථ ශාස්ත්‍රයයේ උපනතීන් පිළිබඳ පරමාදර්ශයන්ට වඩා සමස්ත සමාජය යාමනය කිරිමේ මුලඋපායන් නිර්නය විය. විශේෂයෙන්ම ආර්ථික සන්දර්භයන් තුළට පමණක් තම දිවිපෙවත සීමා නොවූ මෙරට වැඩවසම් සන්දර්භයක ජීවත් වූ පුරවැසියන්ට තමන්ගේ අභිලාෂ හා අවශ්‍යතා නිර්ණය කිරීමේ හා තීරණය කිරීමේ ඒකිය හා පරම බලාධිකාරිය වූයේ රජු විසින් දෙනු ලබන නියෝගයන් විය.

එය මෙරට අනුරාධපුර රාජධානියෙන් ආරම්භ වුනු මහනුවර රාජධානියන් අවසන් වුනු මෙරට අඛණ්ඩ ඉතිහාසාත්මක චිත්‍රණය තුළ බහුරූපිකව ඉහත සිද්ධාන්තය අපට දෘශ්‍යමාන වේ. ඒ වූ කලී අද අප හඳුන්වන සමාජ සාධාරණත්වය, යුක්ති සහගතභාවය, නිදහස, හිමිකම ආදී ආර්ථික මූලාශ්‍රයන්ගෙ න් හාත්පසින්ම වෙනස් වූවකි.

එනම් රොබට් නොක්ස්ගේ "එදා හෙළදිව" කෘතියේ අර්ථ ගැන්වෙන ආකාරයට ශ්‍රී ලංකාවේ දේශපාලන දේහයට පමණක් නොව සියලු සමස්ත දේහයන් ඉතා දැඩි ලෙස තම ග්‍රහණය හෙවත් තම ඍජු අධීක්ෂණයට දෘඩ පාගලනයට නතු කොටගෙන පවතින බූවල්ලෙකුගේ චරිත ලක්ෂණ විදහා දක්වන බව තම කෘතිය තුළින් ප්‍රකාශ කරයි.

ඉන් ප්‍රතීයමාන වනුයේ මෙරට ව්‍යුහාත්මක දේශපාලන සන්දර්භය තුළ රජුගේ ආධිපත්‍ය කුමන පරාමීතින් ඔස්සේ විහිදී ඇතිද යන්නයි. ඒ සඳහා සුදුසු උදාහරණයක් ලෙස ප්‍රංශ රජ පෙළපත විවේචනය කරමින් මාක්ස් විසින් "කොමියුනිස්ට් ප්‍රකාශනය" සකස් කරන්නේ එවක සමකාලීන ප්‍රංශ රජ "එදා හෙළදිව" පරම්පරාවන් විසින් අධෝ ව්‍යුහයට අදාළව උපරි ව්‍යුමය හැසිරවීමේ හැකියාව රජ පරම්පරාව වෙත රඳවා තබා ගත් ආකාරය පැහැදිලි කරන්නේ ද බූවල්ලෙකුගේ චරිත ලක්ෂණ මනාව විදහා දක්වමිනි.

මෙමගින් ප්‍රකාශ වන්නේ සමස්ත ශ්‍රී ලාංකීය දේහය තුළ මුළුමනින්ම පාහේ රජුගේ හුදු අභිලාෂ හා අවශ්‍යතාවට පමණක් සමග්‍රාහී වෙමින් රටේ සමස්ත ජනතාවගේ පැවැත්ම නිර්ණය කිරීමේ උපනතීන් නිර්ණය කෙරිණ. ඒ අනුව බලන විට මෙරට ඓතිහාසික විකාශනය තුළ රජු ප්‍රමුඛ රදළ පෙළපත් මගින් සමස්තය හැසිරවීමේ මූලධාතුන් නිෂ්පාදනය, බෙදාහැරීම හා ප්‍රතිව්‍යාප්තිය සිදු කිරීමේ පරම අයිතියද රටේ සමස්ත පුරවැසියනට නොවීය.

## 4. සම්ප්‍රදායික නාට්‍යය ටෙලිනාට්‍යය දක්වා විකාශනයේ පරාමිතීන්

නූතන සමාජ අවකාශය මගින් නිර්ණය වූ සමස්ත හර පද්ධතීන් සමග මුළුමනින්ම පාහේ නිර්ණය වන්නේ එම සමාජ ක්‍රමයේ පැවැත්ම නිර්ණය කරන තීරක බලපැවැත්මයි. බොහෝ පිරිස් සිතන්නේ සම්ප්‍රදාය යනු ඓතිහාසික විකාශනයට පමණක් සීමා වන සාධකයක් ලෙසයි. නමුත් ඉතිහාසය යනු රටක ජාතියක කැඩපතයි. එමගින් ජාතියේ හැඩගැස්ම වන් පිළිවෙත්,ඇදහිලි මෙම ජීවන ශෛලීන්ගේ සමෝධානයන් ලෙස ඉතිහාසය අපට දැකගත හැක.එහිදී ඉතිහාසය තුළ සම්ප්‍රදාය සහ සංස්කෘතියට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. ඊට හේතුව වී ඇත්තේ සංස්කෘතිය මගින් සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලන දිශානතීන්ගේ සංඝාර්ථයන් සමග ඍජු ප්‍රතිබද්ධභාවයක් සංකේතවත් කරනවා පමණක් නොව එය පුද්ගලයා සමග ස්භාවිකව රෝපණය වී ස්භාවිකව වර්ධනය වන බැවිනි. "සංස්කෘතිය පිළිබඳ "ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ" පුද්ගල චරිත ප්‍රකාශනයේදී අපට සංස්කෘතියේ සළකුණු දැක ගත හැක. නමුත් මිනිසා සතුව පවතින සියලු සිද්ධි සමූහයන්ට සංස්කෘතිය යැයි අපි ආදේශ කරන්නේ නැත."(විජේගුණසිංහ, 1995, 98).

මෙයින් පැහැදිලි වන්නේ ඒ ඒ යුගවල ශිෂ්ටාචාරයන් සංකලනයෙන් මිනිසාගේ විවිධාකාර වූ ගති පැවතුම් පෝෂණය වනවා පමණක් නොව එය ස්වභාවික සංසිද්ධියකි. මෙහිදී සංස්කෘතිය තුළ "වැවයි දාගැබයි ගමයි පන්සලයි" ආදිය විවිධ සංඝාර්ථවේදයන් මගින් සමකාලීන සංස්කෘතියේ හා සම්ප්‍රදායික හර පද්ධතීන්හි අවලෝකනය කරයි.ඒ අනුව බලන විට වසර 2500ට වඩා ඇති ඉතිහාසය-ක් සහිත මෙරට අනන්‍යතා මාදිලීන් තුළ සංස්කෘතියේ ප්‍රභවය වනුයේ බුදු දහම, ස්වයංපෝෂිත කෘෂි ආර්ථික ක්‍රමය ආදී විවිධ ජීවන දෘෂ්ටීන් හා ක්‍රම වේදයන්ගේ යථාර්ථවාදී පැවැත්ම පුනර්නිෂ්පාදනය කිරීමට අදාළ කරුණු කාරණා අවලෝකනය කරමිනි. ඒ ලෙස බලන විට මෙරට සංස්කෘතිය තුළ පුනර්ජීවනයක් ලබන සම්ප්‍රදායික ජීවන දෘෂ්ටීන් තුළ ස්වයංපෝෂිත කෘෂි ආර්ථික ක්‍රමය මගින් සමස්ත සමාජයේ නිදහස, සෙනෙහස, විනෝදය, හුදකලාව ආදී දිවි මගේ විවිධ වූ සන්ධිස්ථානයන්හි පූර්ව නිගමනයන් ප්‍රකාශයට පත් කිරීමට මෙරට වැසියා විවිධ ක්‍රම උපායන් භාවිතයට ගත්හ. "ඇමර්සන් ටෙනන්" පවසන ආකාරයට යුරෝපයේ ගොවි කර්මාන්තය බොහෝ අශාස්ත්‍රීය හා අක්‍රමවත් පහත් අඩියක පැවති කාලයෙන් මෙරට මිනිසුන් ඉතා වෙහෙස දරා දක්ෂ ලෙස ශාස්ත්‍රානුකූලව තැනූ වාරිමාර්ගවලින් බොහෝ ප්‍රදේශ සාරවත් විය.එපමණක් නොව, ධන ධාන්‍යයෙන් ආඪ්‍ය වූ පුරවරයක් විය. තම දිවි පෙවෙත සතුව නිදහස හා සෞභාග්‍යය සපිරි ක්‍රමවත්, අර්ථාන්විත දිවි පෙවෙතක් බවට පත් කර ගනුයේ කෘෂිකාර්මික ජන ජීවිතයෙන් ලද සම්ප්‍රදායික හර පද්ධතීන්හි ඍජු ආභාසය බව පැහැදිලි වේ."(Wikramasinha,1961"47).

"මහාචාර්ය ගයිගර්" මෙරට ඉතිහාසය සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නේ ලංකා ඉතිහාසය ලෙසින් අතරතුර විච්ඡේදනය නොවූ ගලා යන ඉතිහාස කථාවක් සමස්ත ඉන්දියානු කලාපයේ කිසිඳු රටක් තුළ නොපවතින බවයි"(මුණසිංහ, 1996, 80). මෙම සියලු අර්ථ දැක්වීම්වලින් පැහැදිලි වනුයේ ශ්‍රී ලාංකීය ඉතිහාසය හා සංස්කෘතික අනන්‍යතාවය කාලීනව පුනර්නිෂ්පාදනය කරමින් මෙරට ස්වයංපෝෂිත කෘෂි ආර්ථික ක්‍රමයට අදාළ හර පද්ධතීන් මගින් හසුරවනු ලැබුවේ කෙලෙසද යන්නයි.

"මාර්ටින් වික්‍රමසිංහ" පවසන ආකාරයට වැවත් බුදු සමයත් නිසා අදීන සංස්කෘතියක් විසින් සකස් කරන ලද හැඟීම්, ආවේග, පැතුම් ඇති සිංහලයන් නොසන්සුන් ක්‍රමවත් අදික කාම සම්පත් අනුභවයෙන් අනුකූලතා දැක්වූ නූතන නාගරික සභ්‍යත්වයෙන් ඉඳුරා වෙනස් විය.

උවමනා හා අතෘප්තිකර ආශාවන් වෙතින් පෙලනු නොලද බවට අපට ලද හැකි කදිම නිදර්ශන නම් සම්ප්‍රදායික නාට්‍ය කලාවේ ගමන් මගයි"(සරත්චන්ද්‍ර,1989,56). ඒ අනුව බලන විට කෘෂිකාර්මික ජන ජීවිතයක් මගින් නව අධ්‍යාත්මික සුරක්ෂිතභාවය ගොඩනගාගත් මෙරට ආදිතම මානවයා විධිමත් අධ්‍යාත්මික පරිසරයකට පා තබන්නේ බුදුදහම මගින් හඳුන්වා දෙන ජීවන දෘෂ්ටීන් ආභාසයට ගනිමිනි.මෙහි දෘෂ්‍යමාන වනුයේ කෘෂිකාර්මික ස්වයංපෝෂිත ජන ජීවිතය තුළ එහි පැවැත්ම නිර්ණය වූ (අත්තම් ක්‍රමය)සම්පූර්ණයෙන්ම පාහේ සම්ප්‍රදායික ජීවන දෘෂ්ටීන් තුළ බොහෝ ගුණාංග ප්‍රතීයමාන කිරීමට සමත් විය.

එනම් නූතන කාර්මික සමාජ අවකාශය තුළ අසීමිත අභිලාෂ හා අවශ්‍යතා සන්තර්පණය කර ගැනීමේ තරගය තුළඅ පට කිසිඳු ලෙසකින්වත් අපේක්ෂා කළ නොහැකි විටෙක ප්‍රබන්ධයක්ව පූර්ව පරිකල්පනයන්ට යොමු කරන ගුණාංගයන්ය.ඒවා නම්, සරල දිවි පැවැත්ම, අන්‍යෝන්‍ය
සහයෝගය, එකිනෙකා අතර අධ්‍යාත්මික බද්ධභාවය, එකිනෙකාගේ අභිලාෂ හා අවශ්‍යතා හඳුනාගැනීමේ හා එකිනෙකාගේ දුකේදී හැකි උපරිමයෙන් එය තමන්ගේ දුකක් කර ගනිමින් පැවැත්ම සුරක්ෂිත කිරීමේ මාදිලීන් වෙත බද්ධ වීමේ කලාව කෝලම්, සොකරි, නාඩග ආදී නාට්‍ය කලාවන් මගින් නූතන සමාජ අවකාශයට දෘෂ්‍යමාන වේ. ඒ අනුව බලන විට කාල් මාක්ස්ගේ ප්‍රකට තර්කයක් වන මිනිසා ඉතිහාසය ගොඩනැගූ බවත්, එමගින් සමස්ත සමාජය යාමනය කිරීමේ පූර්වාදර්ශයන් එම කලාවන් මගින් අපට දායාද කොට හමාරය. එහිදී මෙම තර්කයෙන් අපට පැහැදිලි වන්නේ අතීතය අතීතයට පමණක් අයත් ඓතිහාසික පුස්තකයන්, ඓතිහාසික ස්මාරකයන්ගෙන්, ඓතිහාසික නටබුන් වශයෙන් තවදුරටත් පැවතිය යුතු දෙයක් නොවන බවය.

එදිරිවීර සරච්චන්ද්‍ර සිංහල නාට්‍ය කලාව සම්බන්ධයෙන් ලියා ඇති අතර බොහෝ ලිපි ලේඛන මගින් අප වෙත ලබාදෙන ආදර්ශයක් වෙයි."මෙරට සම්ප්‍රදායික නාට්‍ය වූ කලී ශ්‍රී ලාංකීය ශ්‍රී විභූතිය යශෝරාවය ප්‍රකට කරන පුද්ගල හැඟීම් හා ආවේග අධ්‍යත්මය වෙත පරාරෝපණය කරන සංකේතයක් වුවද තිරයෙන් මෙපිට අසරණ තත්ත්වයන් දුක/ හුදකලාව ජීවිතයේ අස්ථාවරත්වය ආදී ජීවන දර්ශකයන්හි යථා පැවැත්ම ප්‍රතීයමාන කරන මෙරට නාට්‍ය කලාවේ ජීව ගුණයයි"( සරත්චන්ද්‍ර, 1980, 114).
මෙමගින් ද පැහැදිලි වන්නේ ස්වයංපෝෂිත කෘෂි ආර්ථික ක්‍රමය තුළමුළුමනින්ම පාහේ පීතෘමූලික සමාජ භාවිතාවන් මුළුමනින්ම පාහේ ප්‍රකට කරමින් ස්ත්‍රිය කෘෂිකාර්මික ජන ජීවිතයේ ගෙවිලිය යන විෂය ක්ෂේත්‍රය තුළ තම ප්‍රිය ස්වාමි පුරුෂයාගේ විෂය ක්ෂේත්‍රය හැකි උපරිමයෙන් ඇඹුල සැකසීමේ සිට දරුවන් බිහිකිරීම, දරුවන් හදා වඩා ගැනීම ආදී තම විෂය ක්ෂේත්‍රය මූලික සංරචකයන් වෙත සීමා වෙයි. එය ස්ත්‍රිය තම විෂය ක්ෂේත්‍රය තුළ දැඩි අභිලාෂවලින් තොරව සරල අල්පේච්ඡ ජීවිතය තුළ තම පවුල සුරක්ෂිත කිරීම උදෙසා ස්ත්‍රිය මවක්, බිරිඳක්, දරුවෙක්, සහෝදරියක්, අසල්වැසි කාන්තාවක් වශයෙන් සමස්ත සමාජය වෙත දක්වන ආරෝපිතයන් සාම්ප්‍රදායික නාට්‍ය මගින් ධ්වනිත කර බවයි.

ඒ අනුව, මුළුමනින්ම පාහේ තම ජීවන යථාර්ථය තවදුරටත් තම හැඟීම් හා ආවේගයන් සමග සම්මිශ්‍රණය කරමින් පවත්වාගෙන යාමට අදාළ ආරෝපිතයන් පූර්ව නිෂ්පාදනය වන්නේ ගොවිතැන අහරවර වී බැත වී බිස්සෙහි තැන්පත් කිරීමෙන් අනතුරුවයි. එහිදී "කමත" වේදිකාව කොටගෙන තම ගොවිතැන් කාලය තුළ තම ජිවන ක්‍රියාවලියේ විවිධ දුක් කම්කටොලු, සිත් රිදවීම්, නොඑකගතාවයන් හා තම පවුල කෙරෙහි වූ අතපසුවීම්, පවුල් සංස්ථාවේ ඉදිරි අනාගතයට ඒවා ඉවත් කරගැනීමට විනෝදය, සතුට, ජීවන අවබෝධය, ආනන්දයෙන් ප්‍රඥාවට ප්‍රතීයමාන කිරීම සම්ප්‍රදායික සිංහල නාට්‍ය කලාවේ පූර්ව ආභාසයන් විය. "ලෝකයේ පැවැත්ම අනුකරණය කිරීම නාට්‍යය යි භරත මුනිවරයා පවසයි.

නාට්‍යය වූ කලී කිසියම් කාර්යක් අනුකරණය කිරීමයයි ග්‍රීසියේ විසූ ඇරිස්ටෝටල් පඬිවරයා ද කී ය. එහෙත් මේ දෙකෙහිම "අනුකරණය" (ග්‍රීකඃ මිමේසිස්) යන වචනය පොදු ව්‍යවහාරයෙහි එන අර්ථය-න් වටහාහත නොහැකි බව පෙනේ. කලාව අනුකරණයක් යයි කියූ ග්‍රීකයන් මෙන් භරත මුනිවරයාද අදහස් කළේ විශේෂ අර්ථයකි." ( සරත්චන්ද්‍ර, 1989,16). සුඛ දුඃඛ යන දෙකෙන් යුක්ත වූ යම් කිසි ස්-වභාවයක් ලෝකයේ තිබේද එය අංග ආදී අභිනයෙන් ප්‍රකාශිත වූ කල නාට්‍ය නමින් හැඳින්වේ යයි භරත මුනිවරයා විසින් ඉදිරිපත් කරන ලද නිර්වචනය, නාට්‍යයේ මූලික ලක්ෂණය වටහා ගැනීමට මීට වඩා ප්‍රයෝජන වත් යයි හැඟේ. පොදු වශයෙන් ගත් කල මේ නිර්වචනයෙන් නාට්‍ය කලාවත්, කථා කලාවත් අතර පවත්නා වෙනස පැහැදිලි වේ. කථාවක් වූ කලී කිසියම් සිද්ධියක් හෝ කල්පිතයක් වචන මාර්ගයෙන් විස්තර කරන්නකි. එහෙත් නාට්‍යයෙහි එබඳු විස්තර ඇසීමක් හෝ වර්ණනාවක් නැත. එහිදී එම සිද්ධිය හෝ කල්පිතය ඇස් ඉදිරියෙහි දැක්වේ. කථාව ඇසීමට තිබෙන්නකි. නාට්‍යය දැකීමට පිළියෙල කරන ලද්දකි. කථාව ශ්‍රව්‍ය ය. නාට්‍යය දෘශ්‍ය ය.

මේ අර්ථයෙන් නාට්‍යයට දෘශ්‍ය කාව්‍ය කියාත්, රූප හෝ රූපක කියාත් ව්‍යවහාර කරනු ලැබේ. කථා-වෙහි කථනයෙන් පවසන දේ නාට්‍යයෙහි නිරූපණයෙන් දැක්වේ.
විශේෂයෙන්ම "නාට්‍ය" යනු පුද්ගල හැඟීම් හා ආවේග, චිත්ත වේගයන්, හුදු විනෝදාස්වාදය උදෙසා පමණක් නොව සතුට, නිදහස,විනෝදය සමස්ත සමාජය වෙත ආරෝපිත කිරීම නව මෙවලමක් නොවීය. එය ග්‍රීක යුගයේ සිට ඇරිස්ටෝටල්, ප්ලේටෝ වැනි දාර්ශනිකයන් සමස්ත සමාජය හොඳ, නරක, පවතින, නොපවතින පරමාදර්ශයන්, පවතින පාලන ක්‍රමය, සමාජ මූලයන් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම ඇරඹේ.එම නිසාම එලෙස ඇරඹි නාට්‍ය කලාව විවිධ පර්යාව ලෝකයක් පසු කරමින් ඓතිහාසික සංකල්පමය පරමාදර්ශයන් වෙත අවලෝකනය වන්නේ පෙර අපර දෙදිග සබඳතා යා-වත්කාලීන කරමිනි. එනම්, රජුගේ අභිලාෂ හා අවශ්‍යතා තුළ රජු හා රජ පවුල සන්තෘෂ්ටියට පත් කිරීම සඳහා ප්‍රශස්ති ආකාරයෙන් බිහි වූ නාට්‍ය ආභාසය යුරෝපීය නාට්‍ය කලාව ආරම්භ වීමේ සාධකය-න්ගෙන් බැහැර විය. කෙසේ වෙතත්, ශේක්ෂ්පියර් නාට්‍ය සම්බන්ධව දක්වා ඇති අදහස් අවලෝකනය කිරීම වැදගත්ය. එයට හේතු වන්නේ "ලෝකය රඟ මඬලකි. අපි එහි නළුවෝ හෝ නිළියෝ වෙමු." යන ප්‍රකට කියමන මෙන්ම පුද්ගලයාට දුක, සතුට එක ලෙස බෙදා ගැනීමේ සිද්ධාන්තය යථාර්ථව-ාදීව ධ්වනිත කිරීමේ පරම හැකියාව පවතින්නේ නාට්‍යවලට යන්නයි. විශේෂයෙන්ම ශේක්ෂ්පියර්ගේ නාට්‍ය සම්බන්ධව දක්වන අදහස් එදා මෙන් අදටත් එක සේ ගැළපේ.

එනම්, අප ගෙවන ජීවන ගමන් මග එම අවකාශය තුළ අපට විඳින්නට සිදු වන, ජීවිතයේ විවිධ සංධිස්ථානවල අපි විවිධ චරිතවලට පණ පොවයි. එය මොහොතින් මොහොත ව්‍යුහාත්මක, සංඥාර්ථවේදී මානයන් අනුව වෙනස් වේ. එහි ප්‍රමාණයත් තීව්‍රතාවයත් වඩාත් සාධනීය වන්නේ එමිල් ඩර්ක්හයිම් පවසන ආකාරයට සමාජය තුළ එක්තරා ක්‍රමානුකූල අවිච්ඡින්නභාවයක් ආරෝපිත කිරීමට අදාළ ප්‍රස්තුතයන්ගේ කෘෂිකාර්මික ජන සමාජයට ආවේණික වූ විවර වූ බව ඔයැ Division of Labour in Society 1893 කෘතිය තුළ හා Professional Ethics and Civill Morals 1898 කෘතිය තුළ වැඩිදුරටත් ප්‍රකාශ කරයි. කෙසේ වෙතත්, මොවුන් විසින් අවධාරණය කරන ප්‍රස්තුතයන් සම්පූර්ණයෙන්ම සන්නිවේදනය සංකේතමය අර්ථකථනයන් උදෙසා සමස්ත මානව සංහතියම සම්බන්ධ කිරීමේදී සම්ප්‍රදායික කෘෂිකාර්මික ජන සමාජය තුළ නාට්‍ය කලාව ගාමක බලවේග යක් වශයෙන් ක්‍රියාකර ඇති බව මිනිස් ශිෂ්ටාචාරයේ විකාශනය වීමේ ක්‍රියාවලිය තුළ අපට දැක ගත හැකිය. "මිනිසාට ඔහුගේ සහචරයන් හා සන්නිවේදනය කිරීමේ අවශ්‍යතාවය නිරන්තරව පවතී. මෙම මූලික පෙළඹවීම සමකාලීන ශිෂ්ටාචාර තුළ අපගේ පැවැත්ම තහවුරු කරයි"(මුණසිංහ, 1995, 57).

විශේෂයෙන්ම මෙම සමාජ අවකාශය තුළ සනිටුහන් කරන්නන් සන්නිවේදනයෙහි ප්‍රාථමිකම තත්ත්වය ඉක්ම වූ ද්විතීක හා සංයුක්ත හැඩතලවලින් මෙම නාට්‍ය කලාව සංයුක්ත විය.ඒ නිසාම එකිනෙකාගේ මුහුණුට මුහුණ සිදු කරන නාට්‍යානුසාරමය සංවාදයේ සන්නිවේදන කලාවන්ට වඩා සියුම් ඒකකයකි. ඊට හේතුව වන්නේ ගුණයෙන් හා ප්‍රමාණයෙන් විවිධ හා විශාල වන ග්‍රාහක කණ්ඩායමට ග්‍රහණය පිණිස සන්නිවේදන ග්‍රාහක ජාලයක සබඳතාවයේ විනෝදාස්වාදය, සතුට ආදී මිනිස් සන්තානයේ සියලු හර පද්ධතීන් අවලෝකනය කරන්නේ නාට්‍ය වෙතින්ය.

ලාංකික ග්‍රාමීය සමාජය දෙස බලන විට අපට පෙනෙන්නේ ගැමියා අදහන ආගමේ හුදු බෞද්ධ වශයෙන් හැඳින්විය හැකි වන්දනාමාන පමණක් නොව වෙනත් පිදවිලි රාශියක්ද තිබෙන බවය. මේ පිදවිලි එක් අතකින් බුද්ධාගමට අයිති නැතැයි කිව හැකිය. කෙසේ වෙතත් එබඳු පිදවිලි වල උත්පත්තිය සලතන විට, ඒවා මේ රටෙහි ගැමි සමාජයෙහිම හටගෙන ඇති බව මිස, බෞද්ධ පිළිවෙත් සමඟ මෙහි ගෙනෙන ලද ඒවා නොවන බව පෙනේ. එකතුදු වුවත් ඒ පිදවිලි ගිහි බෞද්ධයාගේ ජීවිතය කෙරෙහි බෙහෙවින් බලපාන බවත්, ජීවිත කාර්‍යයට බෙහෙවින් උපකාරී වන බවත් පැහැදිලිය. මෙවැනි ආගන්තුක විශ්වාස බෞද්ධ ජනතාවගේ ජීවිතය කෙරෙහි මේ අයුරින් බලපාන්නේ කෙසේද කියාත්, ඒවා බුද්ධ ධර්මයේ අනුශාසනා හා ගැළපෙන්නේ කවර ලෙසකින් ද කියාත් අප විසින් විභාග කොට බැලීම වටී. "කෝලම් රඟදක්වන්නට යෙදුනේ දොළ දුකක් සන්සිඳවීම නිමිති කොට යයි එන පාරම්පරික පුවතින් එය මුලදී ගර්භනීන් සඳහා පැවැත්වූ අභිචාර කර්මයක් යයි පර්ටෝල්ඩ් පඬිතුමා නිගමනය කරයි" ( සරත්චන්ද්‍ර, 1989, 96). මේ මතය තහවුරු කිරීමට ඔහු බඩදරු කෝලම හා පංචනාරී කොලම වැනි ජවනිකාද සාක්ෂි සශයෙන් සඳහන් කරයි. මේවා සශ්‍රීකත්වය පිළිබඳ අභිචාර කර්මවල ශේෂමාත්‍ර ලෙස සැලකිය හැකැයි ඔහු සිතයි. මේ ජවනිකා දෙකේ මූලික අභිප්‍රාය පිළිබඳ පර්ටෝල්ඩ් පඬිතුමාගේ මතය නිවැරදි වන්නට පුළුවන. එහෙත් ඒ දෙකෙන් පමණක් අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් තොර වූ වෙනත් ජවනිකා රාශියකින් යුක්ත වූ සම්පූර්ණ කොලම් රඟුමේ අභිප්‍රාය නිගමනය කිරීම යුක්ති යුක්ත නොවන්නා සේ පෙනේ. තවද ගර්භණීන් සඳහා කරන වෙනම පූජා කර්මයක්ද ඇත. එනම් රට යකුම ය. ස්ත්‍රිය බිළිඳෙකකු නලවමින් එන ජවනිකාවක් එහි ඇත. ගැබ් ගත් ළඳුන් ලෙස වෙස් පෑම වෙනත් ශාන්තිකර්මවලද තිබේ. එබැවින් බඩදරු කෝලම ආදිය මේ ශාන්තිකර්ම බලා සකස් කරගත් ජවනිකා විය හැකි ය.

"කොලම් නාටකයේ රසය විඳිය යුත්තේ එය ගැමි කලාවක් බව සිතෙහි තබාගෙනය. අපි ගැමි කලාවන්ගේ රසය විඳින්නට කැමැත්තමෝ නම් ශිෂ්ටත්වය නිසා අප තුළ යම් ප්‍රතිසචිත්ත පහළ වී ඇත්ද එම ප්‍රතිසචිත්ත දුරු කොට මානසික අනුකූලතාව වැඩිය යුතුය. ගැමි කලාවන්ගේ රසය විඳිය හැක්කේ ගැමියන්ගේ අප්‍රහත දෘෂ්ටියෙන් ජීවිත දෙස බැලීමට අප සූදානම්ව සිටිය හොත් පමණි. ගැමි කලාවන්ගෙන් ලැබෙන ආස්වාදයේ වටිනාකමද මේ දෘෂ්ටියෙන් ජීවිත දෙස බලන්නට හැකි වීමය" (සරත්චන්ද්‍ර, 1980, 104). සොකරි නාට්‍ය වනාහි උඩරට පළාත්වලටත් වන්නියන්ටත් සතර කෝරලේ ඇතැම් පෙදෙස් වලටත් සීමා වූ ගැමි නාට්‍ය විශේෂයකි.

මේ නාට්‍යය මුහුදුබඩ පෙදෙස්වල හෝ සාමාන්‍යයෙන් දකුණු පළාතෙහි හෝ රඟ දක්වන බවක් අප අසා ඇත.සොකරි නාටකයේ විශේෂ ලක්ෂණය නම් අනුරූපණ මාධ්‍යයෙන් කථාවක් කීමය. කණ්ඩායමේ නායකයා විසින් කිසියම් ස්ද්ධියක් කවියෙන් විස්තර කෙරෙන අතර නළුවෝ එය අනුකරණාත්මක නැටුමකින් දක්වති. සමහර නළුවෝ වෙස් මුහුණු පළඳිති. නැටුමට හා ගැයුමට උපයෝගී කොට ගන්නා බෙරය වනාහී උඩරට භාවිතා වන ගැට බෙරය ය. ඇතැම් පළාතක දවුල පරිහරණය කරති.

වන්නියෙහි පමණක් උඩැක්කි භාවිත කරනු ලැබේ. සොකරි කථාවේ ස්වරූපය පළාතින් පළාතට මඳ මඳ වශයෙන් වෙනස් වේ. ඊට අනුව නාට්‍යයේ ස්වරූපය ද වෙනස් වේ. මහනුවර අවට සමහර පෙදෙස් වල මුල් සොකරි කථාවට නූතන ස්වරූපයක් ආරූඪ කොට එය ගතානුගතික ත්‍රිකෝණ ප්‍රේමකථාවක් වශයෙන් නැතහොත් අඹුවක සොර මිනිසකු සමඟ පලායාම පිළිබඳ සුලබ පුවතක් ලෙස ඉදිරිපත් කරන බව පෙනේ. මෙසේ වූ විට සොකරි නාටකයේ මුල් ස්වරූපයට හානි පැමිණෙනු පමණක් නොව, එහි නියම අර්ථය ද වැසී යනු ඇතැයි කිව හැකි ය.

"සොකරි නාටකය සාමාන්‍යයෙන් රඟ දක්වනු ලබන්නේ ගොයම් කපා පාගා අවසන් වූ විට කමත රංග භූමිය කොට ගෙනය. මේ වනාහි ගම්මුන් විවේකයෙන් ගත කරන කාලයයි. වටකුරු කමතද කදිම රඟ මඩලකි. හාස්‍යජනක සිදුවීම් වලින් පිරුණු සොකරි නාටකය මෙවැනි අවස්ථාවකට ඉතා සුදුසු වූ විනෝදාස්වාද මාර්ගයකි"(සරත්චන්ද්‍ර, 1980, 112). කමත වේදිකාව කරගෙන සිදු කරන මෙම නාටකය සෘජුවම කෘෂිකර්මය සමග බද්ධ වේ. බදුල්ලේ නළු කණ්ඩායම විසින් සොකරි නාටකයට විනෝදාර්ථයක් පමණක් නොව සුළු වසයෙන් වුව ද කිසියම් ආගමික සම්බන්ධතාවක් ද ආරූඪ කරන ලද බව පෙනිණි. ඔවුන් විසින් සොකරි නාටකය පත්තිනි ඇදහිල්ලටත් කතරගම දෙවියන් පිළිබඳ ඇදහිල්වලටත් ඈඳා තිබුණි. සිංහල අවුරුද්දෙන් පසුව වෙසක් හා පොසොන් මාස වලදී ඔවුහු සොකරි උත්සවයක් පවත්වති.

එළිමහන් බිම් කැබැල්ලක් රඟ මඩල කොට ගෙන නැතහොත් එළිමහනේ ලෑලි ගසා තනන ලද වේදිකාවක් මත පන්දම් එළියෙන් හෝ කිට්සන් පහන් එළියෙන් රඟ දක්වන ලද රැඟුම් වලින් යුක්ත ගැමි කලාවක් වශයෙන් මෙතෙක් කල් පැවැති සිංහල නාට්‍ය කලාව දහනව වෙනි සියවසෙහි අවසාන භාගයෙහි ස්ථාවර රංග මණ්ඩප, නූතන රංග භූමි හා නවීන රංගෝපකරණ පරිහරණය කරන නවීන නාට්‍ය කලාවක් බවට පත් විය. මේ නවීන නාට්‍ය කලාව එක් අතකින් පැරණි නාඩගම් කලාවෙහි මුල් බැසගත්තක් ලෙස සැලකිය හැකි නමුත් අනිත් අතින් එහි ස්වරූපය හැඩගැසුනේ භාරත දේශයෙන් මෙරටට පැමිණි පාර්සි සංචාරක නාට්‍ය කණ්ඩායම් විසින් දක්වන ලද රංග ශිල්පය ආදර්ශ කොටගෙන බව කිව යුතුය. ඊට පෙර පටන්ම මෙහි

නිෂ්පාදනය කරන ලද ඉංග්‍රීසි නාට්‍යයන්ගේ මාර්ගයෙන් සිංහල නාට්‍ය කරුවන් හඳුනාගත් බටහිර රංගභූමි ශිල්පය පැරණි නාඩගම් ශෛලිය කෙරෙහි ද ප්‍රභාවය බලපෑ තිබුණි.

අලුත් නාට්‍ය කලාවෙහි රසිකයන්ගේ සිත් බෙහෙවින් වසීකෙරුමෙහි සමත් වූ තවත් අංගයක් නම් එහි සංගීතය ය. ස්වර නිනයාසය අතින් එතරම් විවිධත්වක් නොදැරූ නාඩගම් සංගීතය කලකදී ප්‍රේක්ෂකයන්ට අරුචි වන තරමට ඒකාකාර ස්වභාවයට පත්වන්නට ඇතැයි සිතීමට ඉඩ තිබේ. බෝහෝ සින්දු වලට ඈඳා තිබුණු උරුට්ටු එක සමාන වීම මීට එක් හේතුවකි. මේ හැරුණු විට ස්වර දීර්ඝ කොට ඇද පැද ගායනා කිරීමත් හැම පේළියක්ම අගට යොදන ලද එක සමාන ස්වර වලින් අවසන් කිරීමත්යන මේ ලක්ෂණ නිසා නාඩගම් සින්දු වල ගායන ශෛලිය කවි ගායනයට සමාන වුවත් සංගීත රසය අතින් ඌන විය. නාඩගම් සංගීතය ජනප්‍රියත්වයෙන් පිරිහීමටත් නාඩගම් බැලීම ප්‍රේක්ෂකයන්ට එපා වීමටත් මේ හේතු වලට අතිරේකව තවත් හේතු තිබිණැයි සිතිය හැකිය. මින් පැහැදිලි වන්නේ සම්ප්‍රදායික ටෙලි නාට්‍ය කලාව තුළ මුළුමනින්ම පාහේ නිර්ණය වූ සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික පද්ධතීන් තුළින් නිර්ණය වන්නේ සියලු සමාජ සංස්ථාවන් තුළ, විශේෂයෙන් පවුල වැනි අන්තර් පරායක්තභාවයේ මූලික අභ්‍යුපගමනයන් සමග පරාවර්තනය වෙමිනි. මේ ආකාරයට සම්ප්‍රදායික සංස්කෘතික මොඩලයන් මගින් පුද්ගල චිත්ත සන්තානයට එකතු කරන ලද නාට්‍ය කලාව සහ ඉන් ඇති කරන ලද අනුපමේය බලපෑම නූතන සමාජ අවකාශය තුළින් ඉවත් වේ. ඊට හේතුව වන්නේ නූතන සමාජ ස්ථරය තුළ නිර්ණය වූ පුද්ගල බහුවිධ අභිලාෂ සමගින් අත්‍යන්තයෙන් ම බද්ධ වන නව කලා මාධ්‍යයක් ලෙස සම්ප්‍රදායික නාට්‍ය කලාව වියෝජනය කරමින් ප්‍රතිබද්ධ වන්නේ රූපවාහිනී මාධ්‍යයයි.

"රොබට් පී ස්නෝක් පවසන ආකාරයට සියලු මානවීය කලාවන් ප්‍රාග් ඓතිහාසික සම්භවයක් දරන අතර වාර්තාගත මිනිස් ඉතිහාසය තුළ පහළ වූ කලාවක් වන්නේ රූපවාහිනියයි"(Mahendra, 2000, 69) .මෙයින් පැහැදිලි වන්නේ සම්ප්‍රදායික නාට්‍ය කලාවන් බැහැරව නූතන සමාජ අවකාශය තුළ නිෂ්පාදනය වන රූපවාහිනිය එනම්, කුලය, ජනවර්ගය, ජාතිය ආදී පටු විභේදනයන්ගෙන් තොරව සියලු සමාජ සංස්ථාවන් ඒකාග්‍රකරණය කිරීම දැකිය හැක. එහිදී බටහිර කලාපයන් සමග සන්සන්දනය කරන විට රූපවාහිනිය එයින් පූර්වාදර්ශ පුනරාවර්ජනය කිරීමට හැකිතාක් උපරිම ලාභ පරමාර්ථයෙන් වෙත සියලු සමාජ සංඝටකයන් මෙම මාධ්‍ය වටා ඒකරාශී කර ගැනීමේ ප්‍රබල තරගයක නිරතව සිටී.

"රූපවාහිනිය ප්‍රබල වානිජ අධිකාරියක් උසුලන නිරන්තර තරගයක යෙදී සිටී. ඒ නිසා ම එය වනාහී වර්තමාන මාධ්‍ය සංස්කෘතියෙහි ප්‍රකට රූප කාර්යයකි"( ඇතුගල,1995,56). ඒ අනුව අපට පැහැදිලි වන්නේ සමස්ත සමාජය යාමනය කිරීමේ ප්‍රබල බලවේගය වන්නේ රූපවාහිනී මාධ්‍යය වන බවයි.මෙයාකාරයට ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය තුළ ජනතාවගේ ජීවන ශෛලින් පුනර්නිෂ්පාදනය කළ සාම්ප්‍රදායික නාට්‍යය කලාව නූතන රූපවාහිනී මාධ්‍යය මගින් වියෝජනය වනු දැකිය හැක.

5. ජනමාධ්‍යය ගුවන් විදුලියේ සිට රූපවාහිනිය දක්වා විතැන්වීම

"ගුවන් විදුලිය එක පැත්තකට ගලාගෙන යන බෙදා හැරීමේ මාධ්‍යයක් වෙනුවට දෙපැත්තට ගලා යන ද්වී පාර්ශවික සන්නිවේදන මාධ්‍යයක් බවට පත් කරන්න. ගුවන් විදුලිය ජන ජීවිතය තුළට කිඳා බසින අසිරිමත් සන්නිවේදන මාධ්‍යයක් වනු ඇත"(Brecht, 1929, 49). බ්‍රෙෂ්ට් අන්තර්ජාලය ගැන දැන නොසිටින්නට ඇත. එහෙත් සන්නිවේදන මාධ්‍යයකට පුළුල් සමාජ සබඳතා පද්ධතියක් පෝෂණය කිරීමට පුළුවන් වූ කල්හි අසිරිමත් ජාලයක් සෑදෙන බව ඔහු නිසැක වශයෙන්ම දැන සිටියේය. බර්ටෝල් බ්‍රෙෂ්ට් නාට්‍යවේදියා හට අන්තර්ජාලයේ සැරි සැරීමට වරම් ලැබුණේ නම් නිසැක වශයෙන්ම අන්තර්ජාලය හා ගුවන් විදුලි මාධ්‍ය අතර සහසම්බන්ධයක් ගොඩනැගෙන හැටිත් ඒ ඔස්සේ පුළුල් මිනිස් සබඳතා පද්ධතියක් හැදෙන හැටිත් අපට බොහෝ දේ කියා දෙන්නට ඉඩ තිබිණ.

ශ්‍රී ලංකාව් ගුවන් විදුලි නාලිකා සාපේක්ෂ වශයෙන් සීඝ්‍රයෙන් ප්‍රසාරණය වී ඇතත් මේ නාලිකාවන්ගෙන් අපේ බුද්ධිමය නිම් වළලු පෝෂණය කර ගැනීමට, ජීවන අරගලයේ සරතස නිවා ගැනීමට, අපට හිතෙන දේ සහ දැනෙන දේ හඩගා කීමටත් අනුන් හා බෙදා හදා ගැනීමටත් ලැබෙන පිටුවහල අතිශයින්ම සීමිතය. මේ සීමාකම් ප්‍රජා ගුවන් විදුලිය වැනි හෘදය සංවේදී මාධ්‍යයක් සඳහා තාර්කික රික්තකයක් සපයයි.

ගුවන් විදුලිය තරමක් පැරණි සන්නිවේදන මාධ්‍යයක් වුවද නූතන සමාජය තුළ ද ජනමාධ්‍යයක් වශයෙන් එහි ඇති වැදගත්කම අඩු වී නොමැත. සංවර්ධිත රටවල මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවලටද ගුවන් විදුලි මාධ්‍යය පොදුජන ජීවිතයේ අනිවාර්ය අංගයකි. සංවර්ධනය වෙමින් පවතින රටවල බිම් මට්ටමේ (grass-roots) ජනතාවගේ හා ආන්තික ප්‍රජාවගේ (Marginalized Groups) දෛනික සන්නිවේදන හා අධ්‍යාපන අවශ්‍යතා ඉටු කරන ප්‍රධානතම මෙවලම වන්නේ ගුවන් විදුලියයි. පුරවැසි යාවජීව අධ්‍යාපනයෙහි ලා (Life Long Learning) ගුවන් විදුලිය වර්තමාන සමාජය තුළ ඉටු කරන භූමිකාව සුවිශේෂීය.

''වර්තමාන ලෝකයේ තිබෙන ගුවන් විදුලි මධ්‍යස්ථාන ප්‍රමාණය විසිදහස ඉක්මවයි. ගුවන් විදුලි යන්ත්‍ර ප්‍රමාණය බිලියන 2කට වැඩිය. ගුවන් විදුලි මාධ්‍යයට හිමි ස්ථානය, රූපවාහිනී මාධ්‍යයට හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකට ලබා ගත නොහැකිය. එය දිනෙන් දින අනාගතයට අමතන මාධ්‍යයක් බවට පත්ව තිබේ. ගුවන් විදුලි තරංගවලට පෘථිවියේ සෑම ස්ථානයකටම ගමන් කිරීමේ හැකියාව තිබේ. එය දුගී ජනතාවගේ ප්‍රධානතම සන්නිවේදන මාධ්‍යයි. ගුවන් විදුලි මාධ්‍යයට ඉතා දුර බැහැර දුෂ්කර ප්‍රදේශ වෙත ළඟා වීමට හැකියාවක් ඇත. ගුවන් විදුලි මාධ්‍යය පරිහරණය සඳහා සාක්ෂරතාවයද අවශ්‍ය නොවේ (ප්‍රෙසර් සහ ස්ට්‍රාඩ්, 2001,57).

"උතුරු ඇමෙරිකාවේ හා යුරෝපයේ පුරවැසියෙක් දිනකට පැය තුනක් පමණ ගුවන් විදුලිය ශ්‍රවණය කරයි. ව්‍යාපාරික සමාගම් තම නිෂ්පාදන භාණ්ඩ ශ්‍රාවකයන්ට අලෙවි කිරීම සඳහා දිනපතා ඩොලර් බිලියන ගණනක් වියදම් කරනු ලැබේ. ගුවන් විදුලිය තම ජයග්‍රහණයේ ප්‍රධාන කොටස් කරුවෙක් වශයෙන් දේශපාලනඥයෝ හඳුනාගෙන සිටිති. දුගී ජනතාවගේ සන්තුෂ්ටියේ, අපේක්ෂාවෙන්ගේ, දුක්ඛ දෝමනස්සයන්ගේ මෙන්ම සොම්නසේද ප්‍රධාන කොටස්කරුවා ගුවන් විදුලියය'' (ප්‍රුනේව් "1996, 63). 1994 වසරේදී 'දි ඉකොනොමිස්ට්'' (The Economist) සඟරාව රූපවාහිනී මාධ්‍යය පිළිබඳව විවේචනයක යෙදෙමින් ණිරූපවාහිනිය විසින් ලෝකය වෙනස් කළ ද රූපවාහිනී මාධ්‍යය වෙනස් කිරීමට ලෝකය අසමත් වි තිබෙන බවට තර්ක කරයි.

රූපවාහිනී මාධ්‍යය ඒකපාර්ශවික සන්නිවේදන ක්‍රමයකි. එහි ග්‍රාහකයා නිෂ්ක්‍රීය පුද්ගලයෙකි. රූපවාහිනිය පෙන්වයි. ඔබ නරඹයි. එක් රූපවාහිනී නාලිකාවක් ඔබ අපේක්ෂා කරන දෙය ලබා නොදෙයි නම් ඔබට වෙනත් රූපවාහිනී නාලිකාවකට මාරු විය හැකිය. එහෙත් අවසානයේ ඔබට කිසිවක් ලැබී නොමැත. එහෙත් ගුවන් විදුලි ශ්‍රාවකයා සක්‍රීය පුද්ගලයෙකි'' ( ජුනේව්.1996 71)

1989 වසරේදී ජෝන් හබමාස්ගේ "Structural Transformation of the Public Sphere" කෘතිය ශාස්ත්‍රීය කතිකාවන්ගේ අවධානයට ලක්වීමත් සමග ජන ජීවිතය තුළ ජනමාධ්‍ය භූමිකාව ප්‍රබල ලෙස සාකච්ඡාවට පොදු අවකාශවලදී (Public Sphere) සහභාගී විය හැකි බව (මැක්ක්වේල්, 2000, 67). ඒ අනුව බලන විට රටේ පොදු ජනතාවට තම මතය සකස්කර ගැනීමටත් විවෘත කතිකාවන්ට සහභාගී වීමට පොදු වේදිකාවක් සැපයීම ජනමාධ්‍යය භූමිකාවක් බව මෙමගින් අවධාරණය කරනු ලැබේ. මෙය එක් අතකින් පැරණි ග්‍රීසිය හා රෝමය ආශ්‍රිත වූ පාලන ක්‍රියාවලියට මහජනතාව සම්බන්ධ වන ඍජු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය හා සම්බන්ධය. හබමාස්ට අනුව පුරවැසියාගේ සමාජ හා දේශපාලන ජීවිතයේදී ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාවන් සඳහා ජනමාධ්‍යය ලබා දෙන අවස්ථා තුළින් මහජන සේවා මාධ්‍යය සංකල්පය හඳුනාගත හැකිය. ගුවන් විදුලි සන්නිවේදනය ''පොදු අවකාශයි'' (Public Sphere) තුළ සිදු වේ. එහිදී මහජනයා පුරවැසියන් ලෙස මෙන්ම පාරිභෝගිකයන් ලෙස ද ගුවන් විදුලි සන්නිවේදන ක්‍රියාවලියට සහභාගී වේ.

ඉහත සියලු ගති ලක්ෂණවලින් සමන්විත මහජන සේවා ගුවන් විදුලි භාවිතාවන් වර්තමාන ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන වටපිටාව තුළ අපේක්ෂා කිරීම යථාර්ථවාදී අදහසක් නොවේ. එහෙත් මෙම ගති ලක්ෂණ අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙන ගුවන් විදුලි නාලිකා යුරෝපයේ මෙන්ම ආසියානු කලාපය තුළ ද දක්නට ලැබේ.

## 6. රූපවාහිනියේ ඉතිහාසය හා ශ්‍රී ලංකාවට රූපවාහිනිය හඳුන්වාදීම

වර්තමාන මානව සංහතියේ සංවර්ධන මට්ටම එහි සංවිධාන ස්වරූපය සහ එහි සමාජ පරිණාමයේ අනාගත දිශානතිය කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදු කිරීමට සමත් සංහතික මාධ්‍ය පද්ධතයක් වශයෙන් විද්යුත් මාධ්‍ය පද්ධතීය හඳුන්වාදිය හැකිය. ඉතිහාසය පුරාවටම මානවයා තම ප්‍රාථමික අවශ්‍යතාවයන් සපුරා ගැනිමට නොයෙක් මාර්ග ඔස්සේ තොරතුරු හුවමාරු කර ගැනිමට පෙළඹුනි.

මේ හේතුවෙන් කාලයෙන් කාලයට විවිධ සන්නිවේදන මාධ්‍යයන්ගේ ප්‍රභවය හා විකාශය සිදු වු අතර වර්තමානය වන විට මුලු මහත් ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත් කිරීමට සන්නිවේදන මාධ්‍යය ඉවහල් වී ඇත. ''ගුවන් විදුලිය, නිශ්චල ඡායාරූපය, සිනමාව වැනි මාධ්‍යයන්හි තාක්ෂණික ශක්‍යතාවකන් ඇසුරු කොට ගෙන ක්‍රමිකව වර්ධනය වු මාධ්‍යයක් වශයෙන් රූපවාහිනිය හැදින්විය හැකිය. වර්තමානයේදි මානව සමාජ සතු ප්‍රාදේශීය, ජාතික, කලාපීයව සහ ගෝලියව ක්‍රියාත්මක ව රූපවාහිනි නාලිකා සංඛ්‍යාව 15000කට අධිකය''(ඇතුගල, 1998, 29). මින් පැහැදිලි වන්නේ නුතන මාධ්‍යයන් අතර අග්‍ර ස්ථානයක් හිමි කොටගෙන ඇති මෙම මාධ්‍ය සුවිශේෂිතාව වන්නේ ශ්‍රව්‍යමය හ දෘශ්‍යමය ඉන්ද්‍රියන් ද්විත්වයක් එකවර උත්තේජනය කිරිමේ ශක්‍යතාවය රූපවාහිනිය වෙත පවතින බැවිනි. වර්තමාන ලෝක සංහතික මාධ්‍ය පද්ධතිය තුළ රූපවාහිනිය වඩාත් ප්‍රබලතම සහ බලපෑම් සහිත මාධ්‍ය ලෙස ක්‍රියා කරන බව ප්‍රකටය. කිසිම සැකයකින් තොරව සමකාලීන රූපවාහිනය ගෝලීය සංහතික සහ විඥපනික ප්‍රපංචයක් වශයෙන් ක්‍රියා කරමින් ගෝලීය ජිවිතයේ සියලු ක්ෂේත්‍ර කෙරෙහි තිරණාත්මක නොඑසේනම් සැලකිය යුතු මැදිහත් වීමක් සිදු කරයි. "මේ සියවසේ ප්‍රථම දශක අවසාන වන විට ලෝකයේ රූපවාහින යන්ත්‍ර සංඛ්‍යාව කෝටි 350ක් දක්වා ද එහි ප්‍රේක්ෂක සංඛ්‍යාව කෝටි 450ක් දක්වා ද වර්ධනනය වී ඇති අතර, එය ලෝකයෙහි රටවල් 200 කට ආසන්න සංඛ්‍යාවක පැතිර පවතී''( දිසානායක,2007, 17).

ජාතික සහ ගෝලිය රූපවාහිනි වැඩසටහන් අනෝන්‍ය වශයෙන් සම්මිශ්‍රගතව කරනු ලබන බලපෑමද සැලකිල්ලට ගත යුතු වන්නේ රූපවාහිනිය පාදක කොට ගෙන සිදුවන සංස්කෘතක ගෝලියකරණය කෙරෙහි පමණක් නොව සමස්ත සමාජ සංවර්ධන ක්‍රියාවලිය කෙරෙහි සක්‍රිය බලපෑමක් සිදු කරනු 20 ලබන නිසාය. මානව සමාජ සංවර්ධනය සහ එම සමාජයේ විඥපන ක්‍රියාකාරිත්වය අතර අනෝන්‍ය සම්බන්ධතාවක් හා අනෝන්‍ය බද්ධභාවයක් පවති.එබැවින් සංහතික තොරතුරු සංවරන ක්‍රියාවලියේ සංහතික මාධ්‍යකරණයේ, සංහතික ප්‍රවෘත්තිකරණයේ ඉතිහාසය අධ්‍යනය කිරිම තුළින් පුද්ගලයාගේ සංවර්ධනය සහ ඔහුගේ මනඃකල්පිත ආරෝපිත තත්ත්වයන් අවබෝධ කර ගැනිමට අවශ්‍ය සාධකය පමණක් නොව සමස්ත සමාජ සංවර්ධනය සඳහා සංහතික තොරතුරු ක්‍රියාවලියේ ස්වාභාවය සහ එහි නිර්ණයන් හා තීරණ බලපාන ආකාරය වටහා ගැනිම අතිශයින්ම වැදගත් වේ. පශ්චාත් යුද සංවර්ධන අදියරක පසුවන ශ්‍රී ලංකාවේ රූපවාහිනි මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කර බැලීමේ කාලින සහ ජාතික අවශ්‍යතාවක් සලකා බැලීම වැදගත්ය.

"විශේෂයෙන්ම සමකාලින ශ්‍රී ලාංකික රූපවාහිනයේ සමාජ සැකැස්ම සකස්වී මෙහිලා මුලික වු සමාජ,දේශපාලන, සහ සංස්කෘතික සාධක ත්‍රිත්වයම අඩු වැඩි ආකාරයෙන් පාදක වී ඇති බව අපට පෙනේ. දශක 6කට අධික කාලයක් තිස්සේ පැවැති පශ්චාත් යටත් විජිතවාදයය, දශක 3කට අධික කාලයක් පැවතියේ ග්‍රාමිකවාදයයි, සිංහල, බෞද්ධ ජාතිකවාදයයි '' (ධර්මදස,1989, 56). වර්තමානයේ පශ්චාත් යටත් විජිතවාදය ක්‍රියාත්මක වන්නේ බටහිර ගෝලියවාදය තත්ව ස්වරූපයෙනි. ඉහත සාධක පාදක කොට ගෙන සමකාලීන ශ්‍රී ලාංකේය රූපවාහිනියේ සමාජ සැකැස්ම නිර්මාණය වී ඇති අතර එය අදත්‍යන ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික සංවර්ධන ක්‍රියාවලිය කෙරෙහි තීරණාත්මක බලපෑම් සිදු කරන බව මෙහිදි අවධාරණය කළ යුතුයි.

''ඕනෑම මාධ්‍ය පඨිතයක අන්තර්ගත මූලික ගතිලක්ෂණ හතරක් තිබේ. භාව, ප්‍රතිරූප,සන්දර්ශක, පරමාර්ථ සහ අර්ථ යනු ඒ චතුර්විධ ලක්ෂණ වේ.ඒ අනුව අදාළ පඨිතයේ ගුණාත්මක භාවය, ගැඹුර ,සරලත්වය, අන්තර්ගතය, ආකෘතිය ආදිය මගින් මාධ්‍ය පඨිතයක අදාළ මට්ටම තීරණය වේ'' (මහේන්ද,1997,16).

වර්තමාන ගෝලීය මාධ්‍ය සංස්කෘතිය තුල ක්‍රියාත්මක වන රූපවාහිනී වැඩසටහන්වල පොදු සාමාන්‍ය තත්වයක් දක්නට ලැබෙන අතර ඒවා කුමන මහද්වීපයේ කුමන රටේ ක්‍රියාත්මක වුවද ඒවායෙහි වැඩසටහන් අතර දකිය හැක්කේ සමජාතීය ලක්ෂණයන් බව කිව යුතුය. මින් පැහැදිලි වන්නේ යුරෝපීය සන්දර්භය තුළ යුරෝපිය නිර්ණයන්ට සමපාතිකව නිර්මාණය වු රූපවාහිනී නාට්‍යය සන්දර්ශන කෙරෙහි පුද්ගල මනසේ ආරෝපිතයන් කෙබඳු ද යන්නයි. ඒ අනුව ශ්‍රී ලංකීය රූපවාහිනිය යුරෝපිය අර්ථයෙන් ගත් කල යථාකාර රූපවාහිනී වැඩසටහන් නොමැති වුවත් ඒවායෙන් විකෘති වු ස්වරූපයේ වැඩසටහන් දකගත හැකිය. එම නිසා එම වැඩසහන් නැරඹීමෙන් ප්‍රේක්ෂකයා තුළ යථාර්ථය කෙරෙහි ප්‍රජනන උත්තේජනයක් ඇති නොවේ.

7. මානව අභිමතාර්ථ සන්තර්පණයේ දී රූපවාහිනිය

සමකාලීන මානව සංහතියේ මානව පැවැත්ම නිර්ණය කිරීමේ හා හැඩගැස්වීමේ ක්‍රියාවලිය තුළ තීරණාත්මක භූමිකාවක් ඉටු කර ඇත්තේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයි. විශේෂයෙන්ම එහිදී රූපවාහිනිය වෙත අති විශාල කාර්යභාරයක් පැවරී තිබිණි. දෙවන ලෝක යුද්ධයෙන් පසු ඉතා පුළුල් ලෙසත් ගැඹුරු ලෙසත් මානව අවකාශය වෙතට අවතීර්ණය වූ රූපවාහිනිය මානව වර්ගයාගේ සමාජ,දේශපාලන, සංස්කෘතික, අධ්‍යාත්මික පරිණාමයන් කෙරෙහි බහුවිධ විපරිවර්තනයක් ඇති කරමින් මානව සංහතියේ අනාගත පරිණාමය පිළිබඳව නව මානයක් ඇති කිරීම කෙරෙහි සෘජු බලපෑමක් කරන ලදී.

''ශ්‍රී ලංකාවේ මාධ්‍ය අතර ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය කලාව වෙනත් මාධ්‍ය හා සසඳන විට තම බලය වඩා සංකේතාත්මකව ජනතාව වෙතට පත් වීමේ හැකියාව නිසාම රූපවාහිනිය ඉදිරියෙන් සිටී. විශේෂයෙන්ම මාධ්‍ය අවකාශය තුළ තිරස් සහ සිරස් බවද ගැඹුරු, සහ පුළුල් විපර්යාසයන් රාශියක් සිදු කරමින් ඒවා මහා පරිමාණී සහ ආපසු හැරවිය නොහැකි ගතිලක්ෂණ අත්පත් කරගත් ප්‍රවණතාවන් ඔස්සේ ගමන් කරමින් සිටී'' (ඇතුගල, 1998, 47).

මින් පැහැදිලි වන්නේ ලොව සෑම රටකම සංස්කෘතිකයට සහ ජනවිඥනයට රූපවාහිනිය දැවැන්ත බලපෑමක් එල්ල කරමින් සිටි බවයි. මෙහි බලපෑම නිසි ලෙස තක්සේරු කර ඒ පිළිබඳ ජනතාව අවදි කරන්නට බටහිර රටවල මේවන විටත් බලපෑම් කණ්ඩායම් බිහි කරගෙන ඒ වෙනුවෙන් ක්‍රියා කරමින් සිටී. මේ පිළිබඳ ලංකාවේ විඥාපන මාධ්‍යයන්හි බලපෑම පිළිබඳ ඉතා වැදගත් පර්යේෂණයක් සර්වෝදය වෙනුවෙන් මහාචාර්ය එදිරවීර සරච්චන්ද්‍රයන් මීට වසර ගණනාවකට ඉහත ද සිදු කළේය.

එහිදී ඔහු පෙන්වා දුන්නේ එවකට දෙහිවල, ගල්කිස්ස, ලුනාව, අගුලාන, පෙදෙස්වල වෙරළබඩ නිවෙස් තනා ගෙන ඉන්නා ජනී ජනයා වැසිකිලි කැසිකිළි ආදිය තනා ගැනිම පසෙකලා රූපවාහිනය තමන්ගේ මූලික අවශ්‍යතාවක් සේ සලකා එය මිලදී ගත් බවයි. එහෙත් අද රූපවාහිනිය නගරයෙත් ගමේත් සාමාන්‍යකරණයට ලක් වූවකි. රූපවාහිනියට මෙරට සංක්‍රමණය වූ කාලයේ පටන් අද දක්වාම ටෙලි නාට්‍ය අතිශයින්ම ජනප්‍රියය. එහෙත් මෙම ජනප්‍රිය තත්ත්වය මත සමාජයට උකහා ගත හැක්කේ කවරාකාරද ග්‍රාම්‍ය ආලය, ව්‍යාජ සෙනෙහස, රැවටීම, විරහව,කාමය, අනියම් සබඳතාවන්, ආදියයි(ධර්මදාස,1989, 76).

සරත් චන්ද්‍රයන්ට අනුව ලාංකික සමාජ තලයට රූපවාහිනියේ බහුවිවිධ වැඩසටහන් මගින් පුද්ගල හැඟීම් හා ආවේග, කාමය, ඊර්ෂ්‍යාව, පළි ගැනිම, ක්‍රෝධය වැනි ප්‍රාථමික ගුණාංග මිනිස් චිත්ත සංතානයන් වෙත ආරෝපිත කරවීමට සමත්වන බවයි. මෙහි වඩාත් බරපතල තත්වය වන්නේ කිසිදු කරුණ නියමිත මානයන්ට අනුව තෝරා බේරාගැනිමට හැකියාවක් නැති කුඩා දරුවන් වෙත මෙවැනි ආරෝපිතයන් වෙතින් කරන බලපෑමයි. එහිදී බොහෝ විට විශ්වාස කරන්නේ ඔහුන් දකින සියල්ල සැනකින් යථාර්තයක් බවට පත් කර ගැනිමට හැකියාවක් පවතින බවයි.

මේ තත්ත්වය බටහිර සමාජ විද්‍යාඥයන් දකින්නේ රූපවාහිනි ප්‍රචණ්ඩත්වය T.V. Violence) ලෙසටය. වත්මන් සමාජයේ රූපවාහිනි නාලිකා කාටුන්, චිත්‍රපටි, මැදියම් රැය දක්වා විකාශය කරනු ලබන විවිධ වර්ගයේ වැඩසටහන් ඉංග්‍රීසි, සිංහල, හින්දි, දමිළ චිත්‍රපටි සහ ටෙලි නාට්‍ය විමසා බලන්නකුට රූපවාහිනි ප්‍රචණ්ඩත්වයට අපේ කාන්තාවන් කොතරම් ගොදුරු වන්නේ ද යන්න වටහා ගත හැකියි.

මෙහිදි පැහැදිලි වන්නේ සමාජානුයෝජන ක්‍රියාවලිය තුල හා කාන්තා අභිලාෂ සන්තර්පණය කිරිමේදි හරයාත්මක ගුණධර්ම මගින් ඔවුන්ගේ හැගීම් හා ආවේග අභිලාෂ හා අවශ්‍යතා නිර්ණය කිරිම සම්බන්ධව රූපවාහිනිය වෙත පැවරෙන්නේ අද්විතීය කාර්යාභාරයකි. එපමණක් නොව අද්විතීය වගකීම් සමුදයකි. මෙම වගකීම් සමුදය ඉටු කිරිමේදි රූපවාහිනිය තම දීශානතීන් මෙහෙයවීම ප්‍රමාණය කෙබදු ද යන්න සිදු කරන ලද බොහෝ පර්යේෂණ තුලින් අපට පැහැදිලි කර ගත හැකිය. ඊට උද- වශයෙන් ඇමෙරිකාවේ ක්‍රියාත්මක වන්'ජඑ'ට්සබිඑ ඪසදකැබඑ ෂරදවැජඑ හි ගවේෂණ වාර්තාවලට අනුව ඇමෙරිකා-වේ රැකියා විරහිත කන්තාවන් දිනකට පැය 2ත් 4ත් අතර කාලයක් රූපවාහිනිය ඉදිරියේ කාලය ගත කරයි. දෙදහස් තුන වසරේදි මාර්තු මාසයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ මිචිගන් සරසවියේ (University of Michigan) සමාජවිද්‍යාත්මක පර්යේෂණයකින් මෙය තවදුරටත් තහවුරු කර ඇත (ඇතුගල, 2004, 59).

මෙමගින් ද පැහැදිලි වන්නේ කාන්තාවගේ ලෝකය ගොඩනැගිමේ කාර්යය තුළ මුළුමනින්ම පාහේ ඔවුනගේ මනසේ උද්දීපනය වන හැගීම් හා ආවේග ඒ ආකාරයෙන්ම සංතර්පණ කර ගැනිමේ දි ඔවුන් හැම විටම පුර්වාදර්ශ කරගනු ලබන්නේ ඔවුන් විසින් නරඹන ලද ඔවුන්ට සමීප වු රූපවාහිනි මාලා නාටක වලින් උද්දීපනය කරනු ලැබු සංඥර්ථයන්ය. ඒවා බෝහෝ විට ළමා මනස සකස්වීමට කිසි සෙලකින්වත් අදාළ නොවුවත් ඔහුන්ට ඒවා වර්නීයව තෝරා බේරා ගැනිමට අවබෝධයක් නැත. ඒ අනුව ඔවුන්ගේ සිත් සතන් වෙත කා වැදුනු චරිත අනුකරණය කරගනිමින් තම ලෝකය ගොඩ නගා පිතෘමුලික අවශ්‍යයතාවයන්ට අනුකුලව ගොඩනගා ගැනිමේ ප්‍රබල උභතෝකොටිකයකට ඔවුන් මුහුණ දෙයි. ඒ අනුව බලන විට ඉහත පර්යේෂණ මගින් සොයා ගත් උපකල්පන ලාංකීකය සමාජයට ද එකසේ අදාළ කරගත හැකි ප්‍රස්තුතයකි.

## 8. රූපවාහිනී ටෙලිනාටක හා එහි දිශානතීන්

"ජනප්‍රිය රූපවාහිනි නාට්‍ය ස්ථානගත වන්නේ සොප් ඔපෙරාව (Soap Opera) නමින් හැඳින්වෙන ආකෘතිය තුළය. සොප් ඔපෙරාව ඊට ආවේණික ෂෝනරවලින් (Genre) සමන්විත වේ. ෂෝනරය යනු ප්‍රභේදය (Type) යන අරුත දෙන ප්‍රංශ වචනයකි. බ්‍රිතාන්‍ය සොප් ඔපෙරාව "Brook Side, Emmerdale, East Enders" වැනි ආකර්ශනීය තේමා සහිත ටෙලිනාට්‍යවලින් පෝෂණය වී ඇත" (මහේන්ද්‍ර,1996,59).

ඒ පිළිබඳව මෙසේ කිව හැකිය. සොප් ඔපෙරාවක් හඳුනාගත හැක්කේ අදාළ තේමාමය අවකාශ තුළ ඒ අදාළ චරිත සිර වූ විට පමණි. ඒ ප්‍රකාශයෙන් අප වටහා ගත යුත්තේ සොප් ඔපෙරාවට ආවේණික ලාක්ෂණික තත්ත්වයෙන් මිදී වෙනත් සාධනීය අත්හදා බැලීම් ප්‍රතිනිර්මාණය කෙරෙන නාට්‍ය සොප් ඔපෙරා ගණයට නොවැටෙන බවය. නිර්මාණාත්මකභාවයේ උපරි තත්ත්වයන් කරා යමින් එසේ නිර්මාණය කරන ලද ටෙලිනාට්‍ය ලෙස ජයන්ත චන්ද්‍රසිරිගේ "දඬුබස්නාමානය", ධර්මසේන පතිරාජගේ "කඩුල්ල", ප්‍රසන්න ජයකොඩිගේ "ඉමදිය මංකඩ", "නිසල විල", "සඳ අමාවකයි", "හදවිල සක්මන" යන ඒවා හැඳින්විය හැකි බව එක් ලේඛකයෙකුගේ අදහසකි. එහෙත් වත්මන් ජනකාන්ත ජීවිත මෝස්තරය හා වේගවත් දිශානතීන් මධ්‍යයේ මෙවැනි ටෙලි නිර්මාණ අදාළ ජීවිත සෞන්දර්යය පිළිබඳ අවබෝධයක් ඇති ඒ සඳහා කැප වූ ප්‍රේක්ෂක පිරිසකට සීමා වෙයි. බ්‍රිතාන්‍ය රූපවාහිනි වැඩසටහන් පිළිබඳ ග්‍රන්ථයක, රූපවාහිනී වැඩසටහන් කෙරෙහි වූ ගතානුගතික ඇබ්බැහිය හැඳින්වෙන්නේ "Habitual viewing" ලෙසය. ඒ රටාවෙන් පරිබාහිර වූ නිර්මාණාත්මක අභිනතීන් එහි හැඳින්වෙන්නේ "Shows that are not simply part of a habitual flow" වශයෙනි. එසේම එබඳු ඵලදායක හා නිර්මාණාත්මක වැඩසටහන් බැ සඳහා සිත් සකස් කරගත් හා කැප වූ ප්‍රේක්ෂකයන් ඒ ග්‍රන්ථයේ හඳුන්වා ඇත්තේ "Compulsive viewing practices of dedicated" හෙවත් කැප වූ පෙළඹීම් නැඹුරුවක් සහිත ප්‍රේක්ෂකයන් යනුවෙනි.

සංවර්ධන සහායක ටෙලි වෘත්තාන්ත පිළිබඳ ලිපියක් ලියන ලේඛකයෙකුට අනුව පසුගිය දශක දෙක තුළ සොප් ඔපෙරා ආකෘතීන් හැඩගැසුණේ හුදෙක් වෙළඳ දැන්වීම් සඳහා බාධා පනවන්නාවූත් (Interruption) දෙර commercials), ප්‍රේක්ෂකයන් පිනවන්නාවූත් (Entertain the audience) සහ අනපේක්ෂිත දිශානතීන් සහිත වූත් (Unexpected turns in the Story line) කලා ව්‍යාපාරයක් ලෙසිනි.

තුන්වැනි ලෝකයේ රටවලට ටෙලිනාට්‍ය යනු ප්‍රධාන වශයෙන්ම රසවින්දන මාර්ගයකි. එම නාට්‍ය තුළ ද ගැබ් වන්නේ අනවරත ආර්ථික පීඩනය (Continual Economic Pressure), මානසික ආතතිය (Mental Stress) හා සමජීය අනාරක්ෂිතතාවය (Social insecurity) යන කරුණුය. මෙබඳු තේමා රැගත් ටෙලිනාට්‍ය තුළ ඉහත සඳහන් කරන ලද සාධක හෝ ඒ හා සමාන්තරව ගමන් ගන්නා භීතිය, ත්‍රාසය, ද්‍රෝහිභාවය, වියරුව, තෘෂ්ණාව ආදී මනුෂ්‍ය අවනතීන් ද දක්නට ලැබේ. නිදසුනක් ලෙස නිධානයක් ගැනීම සඳහා තම පුත්‍රයා බිලි දීමට සැරසුණු රදළයෙකුගේ චරිතය පදනම් කරගත් යක්දෙහි ගෙදර යන නාට්‍යයේ මූලික කෘතිය (Motif) පිළිබඳ අන්තර්ජාලයට ලියූ ලේඛකයෙකුගේ වචන මෙපරිදි වේ. "Yaddwhigedara is a tele drama on the tragic fall of a high caste walawwa owner" මෙබඳු අන්තර්ගතයක් සහිත ටෙලිනාට්‍යයන්හි යන්ත්‍ර මන්ත්‍ර, පළිගැනීම්, කුලවාදය, ඇති නැති පරතරය, ආදරයේ සංවේදනාව ආදී සුලබ මාතෘකා දක්නට ලැබේ.

සංවර්ධන සහයක ටෙලිනාට්‍ය යන්න තවදුරටත් තුන්වැනි ලෝකයේ රටවල අත නොගසන ලද ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙස (Untapped source of Strong communicative medium) පවතී. ඇමෙරිකානු රූපවාහිනියෙහි ප්‍රචාරණය වූ මේ වර්ගයේ නාට්‍ය මගින් මැක්සිකන් සමාජය තුළ නව සංවර්නාත්මක ආකල්ප පතුරුවා හරින ලදී. ඉන්දියානු රූපවාහිනිය මගින් ප්‍රචාරය කර හරින ලද හැම්ලොග් (Ham Log) සංවර්ධන සහායක ටෙලිනාට්‍ය පවුල් සංවිධානය පිළිබඳ තේමාවකින් සමන්විත විණි. මෙබර්ධනාත්මක ටෙලිනාට්‍ය සඳහා භාවිතා කෙරෙන නව විධික්‍රමය හැඳින්වෙන්නේ "සංවර්ධනය සඳහා නව විධික්‍රමය සහිත සන්නිවේදන උපායමාර්ගය" (An innovative communication strategy) ලෙසය. මැක්සිකෝවේ ප්‍රචාරය වූ "come with me" නම් රූපවාහිනී නාට්‍යය අරමුණු කරගත්තකි. නව සංවර්ධන තේමාව යනු හුදු ආර්ථික සංවර්ධනය පමණක් ඉලක්ක වූවක් නොවේ. යම් සමාජයක චිරාත් කාලයක් තිස්සේ වර්ධනය වූ සංස්කෘතික හැඟීම් ප්‍රතිනිර්මාණාත්මක ලෙස පවත්වා ගැනීම ද ඊට අයත්ය. පාකිස්තාන රූපවාහිනියෙන් ප්‍රචාරය වූ "ඊව්ගේ දියණිය" (Daughter of Eve) නම් ටෙලිනාට්‍යය එබන්දකි. එම වෘත්තාන්තය තුළින් ස්වයං විශ්වාසය, ගෞරවය ප්‍රමුඛ කරගත් වැඩිහිටි සාක්ෂරතාවය, වැඩි දියුණු කරන ලදී.

චිරස්ථායි සංවර්ධනය යන්න යුනෙස්කෝ (2011) සමුළුවේදී අර්ථ දැක්වූ ආකාරය, අන්තර්ජාලයේපළවූලිපියකසඳහන්වූයේමෙපරිද්දෙනි.මෙහිදීසංස්කෘතිකවිවිධත්වය(Cultural Diversity) යන්නද, ජීවයේ විවිධත්වය (Biodiversity) සේම මානව වර්ගයාට අවශ්‍ය කරුණකි. සංවර්ධනය වටහා ගත යුත්තේ හුදු ආර්ථික වර්ධනය යන සරල යෙදුමෙන් නොව ආධ්‍යාත්මික, භාවාත්මක හා බුද්ධිමය පැවැත්ම පිළිබඳ සංතෘප්තියේ වර්ධනයක් වශයෙනි. ඒ සඳහන සපුරා මානව සංස්කෘතික සන්දර්භයක් ස්පර්ශ කරයි. ටෙලි නිර්මාණය සම්බන්ධයෙන් ද මේ සන්දර්භය වලංගු වේ. ශ්‍රී ලාංකේය ටෙලිනාට්‍ය පිළිබඳ ග්‍රන්ථයක් ලියන පර්යේෂකයෙකු කරන සඳහනකින් ද ඉහත දැක්වූ ස්ථාවරයට ආලෝකයක් ලැබේ. "කුමන හෝ කතාවක් ටෙලිනාට්‍යයක් බවට පත් කොට පෙන්වන්නට හැකි මුත් ජන මනස තුළ රැඳී පවතින්නේ ඔවුන්ගේ හෘදය කම්පනයට පත් කළ නිර්මාණ පමණක් බව නොරහසකි." යම් ප්‍රජාවක් සතුව ශතවර්ෂ ගණනාවක සම්ප්‍රදායයක් තිබේ නම් ඒ ප්‍රජාව තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීමට පරිහරණය කළ යුතු ප්‍රමුඛ පසුබිම වන්නේ එකී ජන සම්ප්‍රදාය බව මෙක්සිකෝව, බෙංගාලය ආදී ප්‍රදේශවල සංවර්ධන සන්නිවේදනය හා ගැමි මාධ්‍යය ආශ්‍රිතව කරන ලද පර්යේෂණ ඔස්සේ හෙළ වේ.

## 9. රූපවාහිනිය, ටෙලි නාට්‍ය හා කාන්තාව

නව ඩිජිටල් මාධ්‍යයන්ගේ(New Digital Media) ආගමනය හමුවේ වුවද, රූපවාහිනිය එහි මාධ්‍යමය ජනප්‍රියත්වය රඳවා ගැනීමට සමත් වී සිටී.ඊට හේතුව වන්නේ රූපවාහිනියේ විකාශය කෙරෙන බොහෝ වැඩසටහන් අතරින් බහුල ලෙස ජනකාන්තභාවයට පැමිණ ඇත්තේ රූපවාහිනී මාලා නාට්‍යයන් බව පෙනී යයි. මෙය ලොව පුරා දක්නට ලැබෙන ප්‍රවණතාවක් වන අතර එම නාට්‍ය හා කාන්තාව අතර සබ-ඳතාව පිළිබඳව ද ලෝකයේ බහුතර රටවල සාකච්ඡාවට බඳුන්වේ. 1950 දශකයේදී ඇමෙරිකාවේ ඉස්මතු වූ රූපාවහිනී මාලා නාට්‍ය සිය පිවිසුම සඳහා වන ඉඩකඩ ලෙස දුටුවේ කාන්තාවන්ගේ ගෘහස්ථ හුදකලාභාවයයි. මෙම දිවා කාල රූපවාහිනි නිෂ්පාදන නිසා ඇමෙරිකාවේ පරමාදර්ශී කාන්තාව පිළිබඳ මානය නැවත හැඩ ගැස්වුණ බවට ද අදහසක් පවතී.

රූපවාහිනි මාධ්‍යයේ සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට ඍජුව බලපාන ප්‍රධානතම සාධකය ප්‍රේක්ෂකාගාරයයි. ප්‍රේක්ෂකයා වැඩසටහන් කෙරෙහි දක්වන ආකල්පය යම් රූපාවහිනී මාධ්‍ය ආයතනයක අනාගතය තීරණය කරයි. මෙම ප්‍රේක්ෂක ආකල්පයන් බොහෝ සමාජ ආර්ථික දේශපා-ලනික සාධක මත පදනම් වේ .රූපවාහිනී වැඩසටහන්හි ප්‍රේක්ෂකයා පූර්ව නිශ්චය කිරීම අතිශයින් අසීරුය. ප්‍රේක්ෂකයාගේ ස්ත්‍රී පුරුෂ භාවය, අධ්‍යාපනය, වයස, ජාතිකත්වය හෝ සමාජ මට්ටම වැඩස-ටහන් රස විඳීම කෙරෙහි තීරණාත්මකව බලපාන ප්‍රධාන සාදක වන අතර සුවිශාල භූගෝලීයපරාසයක විසිරුණ අවිනිශ්චිත ලක්ෂ සංඛ්‍යාත ප්‍රේක්ෂක සමූහයක් ඉලක්ක කොට නිර්මාණයේ යෙදීම සැබෑ අභියෝගයක් වෙයි. එහෙයින්ම "රූපවාහිනී නරඹන්නා" යනු ප්‍රබන්ධයකැයි කියමනක් ද තිබේ. බහු නාලිකාමය ඩිජිටල් මාධ්‍ය පරිසරය තුළ ප්‍රේක්ෂකාගාරය දෙස නව මානයකින් බැලීමට ද සිදු වී තිබේ. වැඩසටහන් "නිෂ්පාදනය" හා "පරිභෝජනය" යන පැරණි සංකල්ප මැකී ගොස් අන්තර් ක්‍රියාකාරී නව මාධ්‍යයන්ට හුරු වූ ප්‍රේක්ෂකාගාරයක් ඉස්මතුව ඇත.එය නව අභියෝගයක් රැගෙන එයි. බහු මාධ්‍ය පරිසරයකදී සන්දේශයක අන්තර්ගතය නිසැක ලෙස ම බලපෑමට හසු වේ. මෙය කොතරම් භයා-නක ද යත් ප්‍රේක්ෂකාගාරය ඵනොපෙනී යාමට ඉඩ ඇතැයි මාධ්‍ය විචාරකයෝ පවසති. ප්‍රේක්ෂකාග ාරය එතරම් සංකීර්ණ බව පෙනෙමින් තිබියදී ම රූපවාහිනී මාලා නාට්‍යයන් කාන්තාවන් ඉලක්ක කොටගෙන නිෂ්පාදනය කිරීමේ ප්‍රවණතාවක් ලොව පුරා පවතී. වර්තමානය වන විට රූපවාහිනිය අන්තර්ජාලය හරහා නැරඹීමද සුලබය. "ජෝන්රෝස් මෙය විග්‍රහ කරනුයේ මෙසේය:"අන්තර්ගතය වඩාත් විසිරුණ තත්වයකට පත්ව තිබේ. අප වැඩසටහන් සමග සම්බන්ධ වන තලයන් විවිධාකාරය. සමකාලීන මාධ්‍ය සමග අපගේ අත්දැකීම් ඒකාග්‍ර වන්නේ හෝ කේන්ද්‍රගත වන්නේ නැත. එය නූතන තාක්ෂණය සමග බැඳී තිබේ. අපගේ නැරඹුම් රටා තීරණය වන්නේ ඒ අනුවය. විකාශකයන් හා ප්‍රේක්ෂකයන් යන දෙඅංශයටම තෝරා ගැනීම තිබේ"( Walersten 2004, 72).

රූපවාහිනී මාලා නාට්‍ය පිළිබඳ කතිකාව රූපවාහිනිය පිළිබඳ සමාජ සංවාදයේ ඉදිරියෙන්ම පවතින තේමාවකි. රූපවාහිනී මාධ්‍ය අධ්‍යයනයේදී රූපවාහිනි මාලා නාට්‍ය යන්න වේදිකා නාට්‍ය හෝ සිනමාවෙන් සපුරා වෙනස් වන ලක්ෂණ සහිත සුවිශේෂ රූපවාහිනී වැඩසටහන් ශානරයක් බැව් අවධානයට ගනී. එහි මාලාමය මාදිලියම එම විශේෂත්වය වෙයි. වර්තමානයේ රූපවාහිනී අධ්‍යයනයන් රූපවාහිනිය පිළිබඳ ස්ත්‍රීවාදී පිවිසුමක් ලෙස හැඳින්වෙන අතර අනෙක් අතට එය අන්තර් සංස්කෘතික එළඹුමක් ලෙස ද වටහා ගනී. රූපවාහිනි මාලා නාටක යන්න දේශපාලන, වානිජ හෝ ක්‍රීඩා බඳු වැඩසටහන් මෙන් නොව ඇබ්බැහි වන සුලු වැඩසටහන් ප්‍රභේදයක් ලෙස හුවා දැක්වේ. ඇතැම් විට එය කාන්තාවන් සඳහාම නිෂ්පාදනය වන්නක් ලෙස ද ඉස්මතු කෙරේ. රූපවාහිනිය පිළිබඳ න්‍යායික අධ්‍යයනයන්හි දී මෙම වැඩසටහන් ප්‍රභේදය ස්ත්‍රීවාදී සිනමා න්‍යාය යටතේ විග්‍රහ කිරීමට උත්සහ කරනු දැකිය හැකිය.

"ටානියා මොඩලෙස්කි විසින් එක්සත් ජනපදයේ දිවා කළ රූපවාහිනී මාලා නාටක පිළිබඳ කළ විමසුමකදී එය ඇවන්ගාඩ් සම්ප්‍රදායට සමපාත වන බවද, දෙබස් හා එයින් අපේක්ෂිත අර්ථය අතර වෙනසත් කෙළවරක් නැති ආකෘතියත් කාන්තාවන් එයට ආකර්ෂණය කර ගැනීමට හේතු වෙතැයි ද මතයක් ඉදිරිපත් කරන ලදී"( Jayawardana, 2000, 57). එනමුදු කාන්තාවන් හුදු ගෘහණියන් ලෙස සළකා මෙම වැඩසටහන් මගින් ඔවුන්ට ලබා දෙන අදහස් මතවාද ගැන විග්‍රහයක් කර නැත.

රොබර්ට් ඇලන් හා ජස්ටින් ග්‍රිප්ස්රඩ් ආදීන් මේ පිළිබඳව මතවාදීව ගැටුණ ද පොදුවේ ගත් කළ පෙනී යන්නේ රූපවාහිනී මාලා නාට්‍ය ස්ත්‍රී කේන්ද්‍රීය ආඛ්‍යාන රටාවකින් යුතු බවයි. ස්ත්‍රීවාදී සිනමා ස්ත්‍රී ප්‍රේක්ෂකයා පිළිබඳ අර්බුද ඇති වුව ද රූපවාහිනී මාලා නාට්‍යයන් ස්ත්‍රීන්ගේ අභිලාෂ වටහා ගනිමින් සෘජුවම ඔවුන්ට අවශ්‍ය කතා පුවත් ගොඩනගන බව පෙනී යයි. එමෙන්ම රූපවාහිනී මාලා නාට්‍යයන් බෙහෙවින් සංකීර්ණ පෞද්ගලික කරුණු කේන්ද්‍ර කරගනු ලබන අතර එම තේමාවන් වෙනත් කිසිඳු රූපවාහිනී වැඩසටහන් ආකෘතියක් විසින් ස්පර්ශ කරනු දැකිය නොහැකිය. හැඟීම්බර සබඳතා දෘශ්‍යමය වශයෙන් ගොඩනගන ආකාරය තුළ රූපවාහිනී නාටකයන්ගේ අගය ගැබ් වී තිබේ. එය කාන්තා අවකාශයක් ලෙස පෙනී යන්නේ ද එහෙයිනි.

රූපවාහිනී මාලා නාට්‍යයන් ඉතා ඉහළ ලෙසම ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංස්කෘතික නිෂ්පාදනයක් වුව ද, සමකාලීන යථා ලෝකය තුළ ස්ත්‍රීත්වයේ ස්වභාවය පිළිබිඹු කිරීම සඳහා පහළම අවකාශයන් ලබා දෙන්නේ ද එයයි. එසේ වුවද හියු "ඕඩොනල් යුරෝපීය රූපවාහිනී මාලා නාට්‍ය සම්බන්ධයෙන් කළ අධ්‍යයනයක දී පළ කළ අදහස නම් යුරෝපීය සෝප් ඔපෙරාව තුළ නිරූපිත සාමාන්‍ය ගැහැණියගේ භූමිකාව පුරුෂයාට වඩා ඉහළ ස්ථානයක තිබෙන බවයි"( Juliet, 2007, 96). "පූර්ණිමා මන්කේකාර්ට අනුව ඉන්දීය රූපාවාහිනී නාට්‍ය තේමාවන් ස්ත්‍රීන් ඉලක්ක කරගනු ලැබුවද විග්‍රහාත්මක යටි පෙළ තුළ ස්ත්‍රී තේමාවන් සාකච්ඡා නොකෙරෙන බවයි"( Juliet ,2007, 96). "තායිවානයේ අදහස් පළ කරන යිආන් ත්සායි පවසනුයේ ඒවායේ වඩාත් අඩංගු වන්නේ ස්ත්‍රීන්ගේ බල අරගලය බවයි"( Juliet, 2007, 97).

කෙසේ වුවද ස්ත්‍රීන් ඉලක්ක කරගත් තේමාවන් සහිත වීමත්, ගෘහමය අවකාශයන් නිරූපණය කිරීමත් නිසා, රූපවාහිනී මාලා නාට්‍ය කාන්තා චිත්‍රපට හෝ වේදිකා නාට්‍යවලින් ප්‍රභේදමය වශයෙන්ම වෙනස් වෙයි. එහෙයින්ම ජනප්‍රිය සංස්කෘතිකාංගයක් ලෙස එහි ස්ථානය හා අනන්‍යතාවය ද තහවුරු කර ගනී.

රූපවාහිනී මාලා නාට්‍ය ස්ත්‍රී ප්‍රබන්ධ වනුයේ ඒවා මගින් වීරවරියන් හෝ දුෂ්ට ගැහැනුන් ඉදිරිපත් කරන නිසාම නොවේ. නරඹන්නන්ට දැනෙන හැඟීම් ද එබඳු වන නිසාය. කෙසේ වුව ද රූපවාහිනී මාලා නාට්‍ය ස්ත්‍රී ප්‍රබන්ධයකට වඩා ස්ත්‍රීන්ගේන් පුරුෂයන් බලාපොරොත්තු වන ලෝකය ප්‍රත්‍යක්ෂ කිරීමකි "මීරා ඕඩොනල්ඩ් පවසනුයේ මෙම නාට්‍ය ස්ත්‍රීවාදී අරුමැසිය තුළ දැවටීම නිසා ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අසමානතා හා ස්ත්‍රීත්වය පිළිබඳ මිථ්‍යාවන්ට අභියෝග කරනු වෙනුවට ඒවා තහවුරු කරන බවයි"( Juliet, 2007 ,106).

1995 සිට ඉන්දීය රූපවාහිනී මාලා නාට්‍ය පිළිබඳ අධ්‍යයනයක යෙදෙන CFAR (Center For Advocacy and Research) ආයතනයෙහි නිරීක්ෂණය නම් ස්ත්‍රිය පිළිබඳ සමාජයේ ගතානුගතික මතයන් තහවුරු කිරීමට හින්දි භාෂීය මාලා නාට්‍ය කටයුතු කරන බවයි.( Jayawardana, 2000, 87). විශේෂයෙන්ම පවුලේ යුතුකම් පිළිබඳව එයින් අවධාරණය කරන අතර ඇතැම් විට ඒවා සත්‍ය ජීවිතයේ පවතිනවාට වඩා විශාලනය කොට අතිශෝක්තියෙන් දක්වයි. සැබැවින්ම මේවා මගින් යුතුකම් හා වගකීම් අවධාරණය කරනු විනා කාන්තාවන්ගේ අයිතිවාසිකම් අවධාරණය කරනු නොලැබේ. පවුලේ ගෞරවය වෙනුවෙන් සිය සතුට කැප කරන, නොමග ගිය සැමියා සුමගට ගැනීමට කැප වීමෙන් කටයුතු කරන කාන්තාවන් මෙම නාට්‍යවල නිරූපණය කරන අතර එයට පොදුවේ කාන්තා ප්‍රේක්ෂකාගාරයේද අනුග්‍රහය හිමි වී තිබේ.

රූපවාහිනී මාලා නාට්‍ය පිළිබඳ කළ බ්‍රිතාන්‍ය අධ්‍යයනයකින් හෙළි වූ කරුණක් නම් ඒවායේ වැඩි වශයෙන් නිරූපණය වන්නේ වැඩ කරන පන්තිය වන බවයි. එහෙත් විචාරකයන්ට අනුව නම් එය ව්‍යාජ වැඩ කරන පන්තියක් වෙයි. මක් නිසාද යත්, ඒවායේ අඩංගු වන්නේ ඒවා රචනා කරන මධ්‍යම පන්තිකයන්ගේ දෘෂ්ටීන් වන නිසාය. බොහෝ බ්‍රිතාන්‍ය මාලා නාටක කළු ජාතීන් හා සුදු ජාතීන් මිශ්‍ර කොට කතා පුවත් සකසනුයේ ජාතිවාදී නොවන බව පෙන්වීම සඳහාය. එසේම ඒවා ස්ත්‍රී කේන්ද්‍රීය ආඛ්‍යාන ශෛලියකින් යුතු වීමද දැකිය හැකිය. නවක නිළියක සිය සම්මුඛ සාකච්ඡාවකදී පවසා ඇත්තේ තමා කළු ජාතිකයෙකු ලෙස සිතා රඟපානවාට වඩා ගැහැණියක මවක ලෙස රංගනයට අවතීර්ණ වන බවයි. එය එක්තරා අයුරකින් කාන්තාව පිළිබඳ සාම්ප්‍රදායික දැක්මක් පුනරුච්චාරණය කිරීමක් වෙයි. එසේ වුවද බ්‍රිතාන්‍ය රූපවාහිනී මාලා නාට්‍ය ගැහැණු දරුවන් ලිංගික අපයෝජනයට ලක් කිරීම වැනි තේමා තෝරා ගනිමින් හුදු බොළඳත්වය ඉක්මවා ගිය කාන්තා ප්‍රස්තුතයන් සිය කතා පුවත් සඳහා පදනම් කරගනු දැකිය හැකිය.

ජාත්‍යන්තර වශයෙන් රූපවාහිනි නාට්‍යන්හි තේමාව හා ආකෘතිය පිළිබඳ පවතින ආකල්ප, ශ්‍රී ලංකාවේ රූපවාහිනී නාට්‍යයන්හි ගති ලක්ෂණ වටහා ගැනීමෙහි ලා අඩු වැඩි වශයෙන් ප්‍රයෝජනවත් වෙයි. වඩාත්ම වැදගත් දෙය නම් වර්තමාන ලාංකේය රූපවාහිනී නාට්‍ය වෙතින් දක්නට ලැබෙන යහපත හෝ අයහපත මෙරටෙහිම උද්ගත වූ සුවිශේෂ තත්ත්වයන් නොව ලෝක ප්‍රවාහයට අයත් වන්නක් බව වටහා ගැනීමයි. ජාත්‍යන්තර වශයෙන් වන යහපත් ලක්ෂණ ශ්‍රී ලාංකේය රූපවාහිනී නාට්‍ය ක්ෂේත්‍රයෙහි ඉස්මතු කර ගන්නේ කෙසේද යන්න නිර්මාණ ශිල්පීන්ගේ දැඩි අවධානයට ලක් වීම අත්‍යවශ්‍යය.

මෙහිදී පෙනී යන්නේ ලාංකේය රූපවාහිනී මාලා නාට්‍යයද කාන්තාවන්ගේ නෙත'ග කඳුළු උපදවන ආකාරයේ අනුවේදනීය කතාන්දරවලින් පිරී ගොස් ඇති බවයි. එසේ වුවද ගත වූ වසර 30ක පමණ කාලයක ලාංකේය රූපවාහිනී නාට්‍ය දෙස බලන විට හඳුනා ගත හැකි සුවිශේෂ ප්‍රවණතා දෙකක් තිබේ. රජය සතු ජනමාධ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ආරම්භයේ සිටම රූපවාහිනී නාට්‍ය නිෂ්පාදයේ යෙදී සිටීම එහි ප්‍රමුඛ ප්‍රවණතාව ලෙස සැළකිය හැක. අනෙක් ප්‍රවණතාව නම් ජාතික හැඟීම් ඉස්මතු කරවන ඓතිහාසික තේමාවන් හා චරිත පදනම් කරගත් මාලා නාට්‍ය දහරාවයි. මතුපිට තලයේදී පෙනී යන පරිදි දිනපතා ජීවිතයේ කතා පුවත් රැගෙන නාට්‍ය හා හඬකැවූ ඉන්දීය නාට්‍ය ලාංකේය ප්‍රේක්ෂකාගාරය තුළ වඩාත් ජනප්‍රිය සේ වැටහී යන නමුදු මෙම ඓතිහාසික වීර චරිත රැගත් රූපවාහිනී නාට්‍යයන් කෙරෙහි වන ප්‍රේක්ෂක ආකර්ෂණය නොතකා හැරිය නොහැකි මට්ටමක පවතී. ඉන්දීය ජනප්‍රිය සිනමාව විසින් සංවේදී ලෙස ග්‍රහණය කරගත් මෙම ජාතිකත්වය පිළිබඳ මනෝභාවය ශ්‍රී ලාංකේය සිනමාකරුවන් අතින් පැහැදිලි ලෙසම මගහැරී ගිය තත්ත්වයක් තුළ එය රූපවාහිනි මාලා නාට්‍ය මගින් ග්‍රහණය කරගනු දැකිය හැකිය.

ලංකාවේ ප්‍රථම රූපවාහිනි මාලා නාට්‍ය නිෂ්පාදනය කරනු ලැබුණේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වන අතර අද රූපවාහිනි මාලා නාට්‍ය නිෂ්පාදනය යනු කාර්ය බහුල විනෝදාස්වාද කර්මාන්තයක් ලෙස ප්‍රසාරණය වී තිබේ. ශ්‍රී ලංකාවේ සිනමාව අත්පත් කර නොගත් කාර්ය බහුල වෘත්තීමය වානිජ නිෂ්පාදන ප්‍රවණතාවක් රූපවාහිනී නාට්‍ය ක්ෂේත්‍රයේ පැන නැගී තිබේ. මෙම නිෂ්පාදනයන් පෞද්ගලික හා රජය සතු නාලිකා ඔස්සේ දිනපතා ප්‍රදර්ශනය කෙරෙනු දැකිය හැකිය. එහෙත් මෙසේ නිෂ්පාදනය වන නාට්‍ය සමූහය අතර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ නිෂ්පාදනයන් සතුව විශිෂ්ට අනන්‍යතා ලක්ෂණ පවතී. එම නාට්‍යන්හි තේමාවන් හුදු කඳුළු උපදවන පවුලේ තේමා නොවේ. එහෙත් සමකාලීන ජනප්‍රිය ප්‍රවණතා මගහැර යාම නිසා රූපවාහිනී සංස්ථාවේ නිෂ්පාදන පුළුල් ප්‍රේක්ෂක අවධානයෙන් බැහැර වූයේද නැත. ලාංකේය රූපවාහිනී ප්‍රේක්ෂකාගාරය පිළිබඳ හඳුනා ගත යුතු වැදගත් ප්‍රවණතාව වනුයේ එයයි.

ඉදිරිගාමී සමාජ දැක්මක් සහිත වෙනස් තේමාවන් පදනම් වූ ස්වතන්ත්‍ර නාට්‍ය මෙන්ම අනුවර්තන ද රූපවාහිනී සංස්ථාව විකාශය කරයි. ඒවා සංවර්ධන සන්නිවේදනාත්මක තේමාවන්ගෙන්ද ස්ත්‍රිය පිළිබඳ පුළුල් විග්‍රහාත්මක දැක්මෙන්ද යුතු වන අතර පසුගාමී සමාජ විශ්වාසයන්ට විවේචනාත්මකව පහර දෙන අවස්ථාද තිබේ. එය වූ කලී ජනමාධ්‍ය වෙතින් සමාජය ඉල්ලා සිටින ප්‍රශංසාත්මක සමාජ මෙහෙවර වෙයි. රූපවාහිනී සංස්ථාව එදා මෙදාතුර නිෂ්පාදනය කළ බොහෝ නාට්‍ය මෙම ලක්ෂණ ප්‍රකට කරයි. අඹ යහළුවෝ, ඉසිවර අසපුව, ගජමන් නෝනා, මනෝකාය, ඉසුරු යෝගය, වසන්ත කුසලාන ආදිය ඒ අතරින් කැපී පෙනෙන නිදර්ශන ලෙස දැක්විය හැකිය. සිය නිෂ්පාදනයන්ගේ ප්‍රමිතිය ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට අමතරව රූපවාහිනි සංස්ථාව වඩා ගවේෂණාත්මක නිර්මාණ ලක්ෂණ දරන නාට්‍ය බැහැර නිෂ්පාදකයන් වෙතින් ද ලබා ගනී. ජයන්ත චන්ද්‍රසිරි, සුදත් මහදිවුල්වැව වැනි පර්යේෂණාත්මක

රූපවාහිනී නාට්‍ය නිර්මාණකරුවන් පුළුල් ප්‍රේක්ෂකාගාරයට විවෘත වූයේ රූපවාහිනී සංස්ථාවේ ගුවන් කාලය මගින් බැව් නිසැකය. සංවර්ධනය වෙමින් පවතින රටවල ජනමාධ්‍ය ආයතන කෙරෙහි පැනනැගෙන සුලබ දෝෂාරෝපණයක් වනුයේ බලයේ පවතින රජයන් ඉහත ආයතනයන්ගේ වැඩසටහන් මගින් ප්‍රචාරණ කටයුතු පවත්වා ගෙන යන බවයි. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ නාට්‍ය නිෂ්පාදනයන්හි අන්තර්ගතය හෝ කිසි කලෙකත් ඒ ඒ යුගයන්හි පැවති දේශපාලන බලාධිකාරයේ මතයන් සමග කිසිඳු අයුරකින් හෝ සබඳතාවක් නොදැක්වීමද එහි ගුණාත්මක බවෙහි තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වෙයි. සමස්තයක් ලෙස සළකා බලන විට රූපවාහිනී සංස්ථාව විසින් නිෂ්පාදනය කළ මාලා නාට්‍යයන්හි ස්ත්‍රී භූමිකාව නිරූපණය වී ඇත්තේ ඉතා පුළුල් දැක්මකින් යුතුවය. කිසිඳු විටෙක ගතානුගතික සාම්ප්‍රදායික මතයන් තහවුරු කරන ලෙස ඒවා නිර්මාණය වී නැත.

විශේෂයෙන්ම ජීවිතය සඳහා අරගල කරන සමකාලීන සමාජයේ ජීවත් වන කාන්තාවන් විනා සිහිනමය චරිත ඒවායේ නිරූපණය නොවේ. නිදසුන් ලෙස 'ගජමන් නෝනා' නාට්‍යය දැක්විය හැකිය. එය හුදෙක් අතීතයේ දිනෙක ජීවත් වූ කාන්තාවකගේ පෞද්ගලික ජීවන පුවතක් ලෙස පමණක් නිරූපණය නොවේ. සමස්ත ලාංකේය කාන්තාවන් ජීවිතය පුරා මුහුණ දෙන අනේක විධ දෝමනස්සයන් අභියෝග හා ජීවන අරගලයද එහි සංකේතාත්මකව නිරූපණය වෙයි. ජන ප්‍රවාදයේ ප්‍රකට වන පරිදි ගජමන් නෝනා හුදු අනුරාගී ගැහැනියක ලෙස නොව, පසුගාමී චින්තනය සහිත සමාජයක ඉපිද, වඩා නිදහස් - සක්‍රීය ජීවන මාදිලියක් සොයා යන ස්ත්‍රියකගේ ධෛර්ය සම්පන්න බව පිළිබඳ නිදර්ශනයක් ලෙස ගොඩනගා ඇත්තේ සමබර දැක්මකින් යුතුවය. ලාංකේය රූපවාහිනී මාලා නාට්‍ය තුළ ස්ත්‍රිය නිරූපණය පිළිබඳ වඩාත් සාධනීය නිදර්ශනයක් ලෙස ද එය දැක්විය හැකිය.

"අනන්ත" ආකෘතියේ "දැවැන්ත" රූපවාහිනී මාලා නාට්‍ය අරමුණු රහිත, වියවුල් සහිත, අර්ථ ශූන්‍ය සිහින ප්‍රේක්ෂකාගාරය වෙත වගුරුවමින් සිටින සමයක ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ නිෂ්පාදිත මාලා නාට්‍ය ඉන් බැහැරව කැපී පෙනෙන මෙහෙවරක් ඉටු කරමින් සිටී. සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවගේ කාර්යභාරය පිළිබඳ ප්‍රගතිගාමී අදහස් ජනගත කරමින් නව ඩිජිටල් යුගයට ගැළපෙන ශ්‍රී ලාංකේය ස්ත්‍රියගේ භූමිකාව නව මානයකින් නිර්මාණය කිරීමට එයට හැකියාව ලැබේ.නමුත් දූ දරුවෝ, නෑදැයෝ, සත්පුරුවැසියෝ, අසල්වැසියෝ, හයසිය හැට හය,ආදී ටෙලි නාට්‍යය මගින් ඍජු ලෙස පවුල් සංස්ථාව තුල දෝලනය වන කාන්තා රූපකය පුනර්නිෂ්පාදනය කෙරේ.

## 10. පවුල පිළිබඳ න්‍යායාත්මක වපසරිය හා කාන්තාව

සමාජ විද්‍යාඥයන් හා මානව විද්‍යාඥයන් විසින් මූලික අවධානයක් යොමු කරන්නේ පුද්ගලයා පිළිබඳව නොව සමූහ පිළිබඳවයි. ඒ අනුව සමාජයේ ඉතා කුඩාම ඒකකය (Basic Unit) ලෙස පවුල හඳුනාග නී. පවුල ඉතා වැදගත් සමාජ සංස්ථාවක් බවට විවාද රහිතය. මේ නිසාම ආදි කාලයේ සිට සමාජ දාර්ශනිකයන්, ආගමික නායකයන් හා සමාජ චින්තකයන් පවුල් සංස්ථාව පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට ඇති බව පෙනී යයි. ඔවුන්ට අනුව සමාජයේ සැකැස්ම තීරණය කරන ආයතනයක් ලෙස පවුල වැදගත් වේ. මෙසේ විග්‍රහ කරන විට පවුල සමාජ ක්‍රමයේ පදනම නිර්මාණය කළ අංගයක් ලෙස සැළකීම නිවැරදිය.

කෘත්‍යවාදී විග්‍රහයට අනුව පවුල යන්න සමාජ ක්‍රියාකරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් නිර්මාණය වූවකි. ඒ අනුව පවුල තුළින් ඉටුකරන කාර්යය සමාජ ක්‍රමය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වූවකි. පවුල නමැති ආයතනයෙන් තොරව සමාජය පවත්වාගෙන යා නොහැකි බව කෘත්‍යවාදීන්ගේ අදහසයි. පවුලේ කාර්යභාරයන් පිළිබඳව සාකච්ඡා කිරීමේදී එම කාර්යයන් සමාජ පැවැත්මට අත්‍යවශ්‍ය බව මින් පෙන්වා දේ. (Murdock ,1949, Parsons, 1950)

කෘත්‍යවාදීන්ට අනුව සමාජය යනු සාර්ව ඒකකයකි (Macro Unit). මෙම අනු කොටස් එකිනෙක අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතී. පහත දැක්වෙන සටහනින් පෙන්වා දෙන අන්දමට පවුල, ආගම, නීතිය, සංස්කෘතිය, දේශපාලනය වැනි අංශ අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධවය.

මෙසේ මානව සමාජවල අන්තර් සම්බන්ධතා අනුව අනුකලනය වී එකම පද්ධතියක් ලෙස පවතින ආකාරය මින් අවධානය යොමු කෙරේ. මේ අනුව සමාජ ආයතන අතර අන්තර් සම්බන්ධතාවයක් (Inter Relationship) පවතින බව පෙනේ. එසේම සංස්කෘතිය මත යැපීමද ඒ සමග දැකිය හැකි වේ. මෙය අන්තර් යැපීම ලෙස හඳුනාගත හැකි වේ. මෙම විග්‍රහයට අනුව සමාජ අවශ්‍යතාවයන් (Social Needs) ඉටු කිරීම මෙම අන්තර් යැපීම පදනම වි ඇත. පවුල ඒ සඳහා බිහි වී ඇත. පවුල මගින් සමාජ පැවැත්මට ආර්ථික, ලිංගික, ප්‍රජනන, අධ්‍යාපන හා සමාජානුයෝජනය වැනි අවශ්‍යතා ඉටු කරනු ලැබේ. ඉහත දැක්වූ ලෙස සමාජයක පැවැත්මට උපකාරී වන සමාජ ප්‍රපංචයන් (Phenomena) පිළිබඳව විස්තර කිරීම කෘත්‍යවාදය තුළින් සිදු කෙරේ. (බොටමෝර්, 1969). කෘත්‍යවාදී න්‍යායේ පු-රෝගාමිකයන් වන බී. මැලිනොවුස්කි (B, Malinowski) හා රැඩ්ලිෆ් බ්‍රවුන් (Radcliffe Brown) යන දෙදෙනාම මෙසේ කෘත්‍යවාදීව සමාජය තුළ එකිනෙක ආයතන ඉටුකරනු ලබන්නා වූ කාර්යය අනුව එම සමාජ ක්‍රමය මනාව පවත්වාගෙන යන බව පෙන්වා දේ (Abraham 1982).

පවුල තුළින් ඉටුකරනු ලබන කාර්යයන් ඉටු කිරීමට සමාජයේ වෙනත් ආයතනවලට වඩා පවුල වෙත ඉතා උචිත බව මින් අවධාරිත වැදගත්ම අදහසයි. එනම් නූතනයේ පවුල තුළින් කෙරෙන කාර්යයන් සමාජයේ වෙනත් කිසිම ආයතනයකින් කළ නොහැකි බවයි. පවුල් සංස්ථාව නොමැති වූ විට සමාජය තුළ ව්‍යනුකලනයක් (Disintegration) ඇති විය හැකි යැයි විශ්වාස කෙරේ. අනෙක් අතට පවුල යන්න පූජනීය ස්ථානයක් *(Secred Place)* බවත් ඒ තුළින් සදාචාරාත්මක පරිසරයක් නිර්මාණය කරන අංගයක් බව ක්‍රිස්තියානි සභාව හා සාම්ප්‍රදායික මතධාරීන් (Conservative School) කල්ප-නා කරති. (Baxter 1992) මෙය හින්දූන් විසින්ද පිළිගනු ලබන කරුණකි. දේශපාලනඥයන් පවුල පිළිබඳව සළකන්නේ එය තමන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන වේදිකාවක් (Flatform) ලෙසය.

ඒ අනුව පවුල් ඒකකය දේශපාලන පක්ෂයක පිළිගත් වැඩපිළිවෙළවල් ආරම්භ වන ස්ථානයයි. වෙළඳ දැන්වීම් පිළිබඳව සළකා බලන විට එහි ප්‍රධාන ඉලක්කය වන්නේ ද පවුලයි. මාධ්‍යකරුවන් ඔවුන්ගේ නිර්මාණවල දී ද පවුල මූලික ආයතනයක් ලෙස සළකා ඇත. නූතන කාර්මික සමාජයේ පවුල සමානාත්මතාවය ඇති කරන ඒකකයක් ලෙස සළකා ඇති බවද පෙනී යයි. කෙසේ වුවත් මේ සියලු දෙනාම පවුල යන්න දක්වා ඇත්තේ සෙනෙහසල දයාව හා මිත්‍රත්වයේ උල්පත ලෙසය. (Baxter 1992) කෘත්‍යවාදී විග්‍රහයට අනුව පවුල පිළිබඳ අධ්‍යයනයේදී මානව විද්‍යාඥයන් එය චිත්තවේගී ආයතනයකට වඩා සමාජයට ඉටු කරනු ලබන කෘත්‍යය පිළිබඳ අවධානය යොමු කර ඇති බව මින් පෙනී යයි.

ධනපති සමාජ ක්‍රමය හා නිෂ්පාදන ස්වරූපය පදනම් කරගෙන මාක්ස්වාදීන් විසින් පවුල පිළිබඳ අදහස් ඉදිරිපත් කොට ඇත. ඒ අනුව පවුල පිළිබඳ ඔවුන්ගේ විග්‍රහය ධනේෂ්වර නිෂ්පාදන ක්‍රමය පිළිබඳ සමස්ථ විග්‍රහයට අනුවම ඉදිරිපත් කෙරේ. මාක්ස්වාදී විග්‍රහ ක්‍රමය සර්ව විශ්වීය එකක් ලෙස ඔවුන් දකින අතර කාන්තාවන් පිළිබඳ ප්‍රශ්නයද මෙම විග්‍රහය යටතේම ඉදිරිපත් කෙරෙයි. පවුල පිළිබඳ ඉතා පුළුල් විග්‍රහයක් ඉදිරිපත් කොට ඇත්තේ එංගල්ස් විසින්ය. මාක්ස්වාදී විග්‍රහයේ මූලික පදනම වන්නේ ආර්ථිකය නමැති පාදක ව්‍යුහයයි. (Infra Structure) ඒ මත දේශපාලනල සංස්කෘතිකල අධ්‍යාපනල ආගම වැනි උපරි ව්‍යුහීය (Super Structure) ලක්ෂණ රඳා පවතින බවය. මේ අනුව ආර්ථික පදනමෙහි වෙනස්වීමට සාපේක්ෂව උපරි ව්‍යුහයේද වෙනස්කම් ඇති වේ. (Engles,1972,) එවැනි ආයතන ලෙස හඳුනාගන්නා පවුලල විවාහය වැනි සමාජයේ දේශපාලන සම්බන්ධකම් මත පදනම් වී ඇති අංගවලද වෙනස් වේ. මෙම පවුල් ක්‍රමය මෙන්ම ඒ තුළ කාන්තාව පිළිබඳව ඇති ආකල්පයන්ද වෙනස් වේ.

"ධනපති ආර්ථික ව්‍යුහය තුළ පවුල පෞද්ගලික දේපොළ අයිතිය පදනම් කරගෙන ගොඩනැගෙන අතර ඒ තුළ කාන්තාව වැටුප් ලබන ශ්‍රමිකයෙකු මෙන්ම ගෘහස්ථ මෙහෙකරුවෙකුද වේ. ධනේෂ්වරය ක්‍රමය තුළ කාන්තාව එක් අතකින් අඩු වැටුප් හා වැඩි පැය ගණනක් තුළ සේවය ගැනීමෙන් පීඩාවට ලක්වන අතර ගෘහය තුළ ප්‍රජනන කාර්යයට හා ගෘහස්ථ වැඩවලට යොදා ගැනමෙන් සූරාකෑමට ලක් කෙරේ යැයි විශ්වාස කෙරේ"(ජයවර්ධන, 1994, 97) . මාක්ස්වාදීන්ට අනුව පවුල යනු පීතෘ මූලික සමාජ ක්‍රමයේ කාන්තාවන් පීඩාවට ලක්කරන ආයතනයකි. මේ තුළින් කාන්තාව පුරුෂාධිපත්‍යයට බැඳ තබාගැනීමක් සිදු වේ යැයි තර්ක කෙරේ. කාන්තාවටගේ ලිංග භේදය හා අසමානතාවය තේරුම් ගැනීමේදී මාක්ස්වාදී ස්ත්‍රීවාදීන් දකින්නේ ධනවාදී නිෂ්පාදන ක්‍රමය තුළින් එය නිර්මාණය කරන බවයි (Thiruchandran, 1994,78). පවුල තුළින් කාන්තාව පුරුෂයාගේ පුද්ගලික ආධිපත්‍යයට ලක් කරන අතර ඔවුන් "ධනවාදී පවුල" තුළින් පීඩාවට ලක් කෙරේ. (තිරුචන්ද්‍රන්, 1995,50) මේ අනුව පවුල යන්න ඔවුන් විග්‍රහ කරන්නේ ධනේෂ්වර සමාජයේ පංති විග්‍රහය හා සම්බන්ධ කර ගෙනය. මින් ධනපතියා හා කම්කරුවා අතර සූරාකෑමේ ස්වරූපය විග්‍රහ කරන අතර පවුල තුළ පංති දෙකට සාපේක්ෂව විග්‍රහ වන්නේ පිරිමියා හා ගැහැණියයි.

මාක්ස්වාදීන්ගේ විග්‍රහය තුළින් තවදුරටත් පෙන්වා දෙන්නේ කාන්තාව ධනේෂ්වර නිෂ්පාදන ක්‍රමය තුළ සූරාකෑමට ලක්වන තැනැත්තියක් බවයි. කාන්තාවගේ ගෘහස්ථ ශ්‍රමය සංවිධානය කරන මූලික ආයතනය පවුලයි. පවුල තුළ ඇය විසින් වැය කරන ශ්‍රමය ඵලදායික ශ්‍රමයක් නොවන බවත් ඒ තුළින් කාන්තාවගේ දියුණුවට බාධාවක් බවත් වැඩිදුරටත් පෙන්වා දේ.මෙසේ ස්ත්‍රීන්ගේ සමාජ තත්ත්වය හා කාර්යයන් පදනම් වන්නේ ඔවුන් පවුල තුළ දරන තත්ත්වය අනුවයි. පවුල් ව්‍යුහය සකස් වන්නේ පවතින ආර්ථික රටාව පදනම් කරගෙනය. ඒ අනුව පුද්ගලයා අභිබවා සමාජ රටාව බලපෑම් කරන බව කියවේ. මේ නිසා පුද්ගලයාට වඩා ක්‍රමය (System) වැදගත්ය. මාක්ස්වාදීන් විග්‍රහයට අනුව සමාජයේ සෑම සාධකයක්ම පදනම් වන්නේ නිෂ්පාදන රටාවයි. ඒ කෙරෙහි වැදගත් බලපෑමක් කරනු ලබන්නේ ද්‍රව්‍යාත්මක සාධකයි. පවුල් ක්‍රමයේ ආරම්භය සිදු වූයේද මෙම ද්‍රව්‍යාත්මක බලවේග පදනම් කරගෙනය යන්න විශ්වාස කෙරේ.

මෙසේ පවුල පිළිබඳ මාක්ස්වාදීන් විග්‍රහය වන්නේ එය පුද්ගලික දේපළ ක්‍රමය පදනම් කරගෙන ඇති වූවක් බවයි. ධනේශ්වර සමාජයේ පවුල තුළ කාන්තාව පීඩනයට ලක්වීම මෙහි දී අවධාරණය කරන වැදගත් කරුණකි. මෙම පීඩනයෙන් ඇය මුදවා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කිහිපයක් ද පෙන්වා දේ. කාන්තාවගේ ගෘහස්ථ ශ්‍රමයට වටිනාකමක් ලබා දීම, කාන්තාව බාහිර සමාජය සමග සම්බන්ධ කොට ඇයට සංවිධාන ගොඩනගා ගැනීමට අවකාශ ලබා දීම, පංති විඥානයක් ඇති කිරීම, කාන්තාව සාමූහිකව සංවිධානාත්මකව පොදු කටයුතුවලට සම්බන්ධ කිරීම, ඒ තුළින් අරගල කිරීමට හුරුවක් ලබා දීම, පවුල සතු සාම්ප්‍රදායික කාර්යයක් සමාජීයකරණය කිරීම කාන්තාවන්ට ස්වාධීනතාවයක් ලබා දීම එහිලා වැදගත් වේ. කෙසේ වෙතත් පවුල තුළින් කාන්තාව ලක් වී ඇති පීඩනය ඉවත් කිරීම සඳහා ධනේශ්වර සමාජ ක්‍රමය වෙනස් කළ යුතුය. එය විප්ලවීය ක්‍රියාමාර්ගයකි. ලෝකයේ සෑම සමාජයකම පාහේ ජීවත් වන පුද්ගලයන් විවිධාකාර විෂමතාවන් (Inequality) මත විවිධ පීඩනයන්ට ලක් වන බව කිව හැක. මේ අතර බොහෝ සමාජවල ඉතාමත් ඉහළ මට්ටමින් ක්‍රියාත්මක වන්නක් ලෙස කාන්තා පීඩනය යන්න රැඩිකල් කාන්තාවාදීන් (Radical Feminist) විසින් හඳුනාගෙන ඇත."ඓතිහාසිකව ලෝකයේ මුලින්ම පීඩාවට පත් වූ තැනැත්තිය වූයේ කාන්තාවන්ය. මෙය සාර්ව විශ්වීය තත්ත්වයකි. කාන්තාවන් අරඹයා සිදු වන පීඩනය තුළින් සමාජය තුළ පවතින පීඩනයේ ස්වරූපයද හඳුනාගත හැකි බව කාන්තාවාදීන්ගේ අදහසයි"(Millet ,1970, 123). රැඩිකල් කාන්තාවාදීන් කාන්තා පීඩනය පිළිබඳව අවධානය දක්වන විට ඒ කෙරෙහි බලපෑම් කරන සාධක වශයෙන් ඉදිරිපත් කරන්නේ ප්‍රජනනය (Reproduction), මාතෘත්වය (Mothering), හා ලිංගිකත්වය (Sexuality) යන්නයි. මෙම ක්‍රියාවන් සියල්ලම සම්බන්ධ වන ආයතනය වන්නේ "පවුල" වීම විශේෂයකි. මෙසේ කාන්තාවාදීන් පවුල පිළිබඳව විග්‍රහ කරන්නේ කාන්තා පීඩනය හා සම්බන්ධ කොට ගෙන බව පෙනේ. මේ අනුව පවුල තුළ සිදුවන ස්ත්‍රී පුරුෂ විෂම සම්බන්ධතාවය නිසා පුරුෂයාගේ බලයට හෝ පීඩනයට කාන්තාව ලක්කරන බන්ධනාගාරයක් (Prison) බවට පත්වීමයි. මේ නිසා පවුල නැමැති ආයතනය කාන්තාවාදීන්ගේ නිර්දය විවේචනයට ලක් වී ඇත.

## 11. පිතෘමූලික සංකල්පයේ න්‍යාය හා භාවිතය, තුළින් නිර්මිත කාන්තාව

පීතෘමූලිකත්වය යන්නෙහි වචනානුසාරයෙන් අදහස් කෙරෙන්නේ පියාගේ නැතහොත් කුලදෙටු-වාගේ පාලනයයි. මුලදී එය පාවිච්චි කරන ලද්දේ එක්තරා නිශ්චිත වර්ගයක "පුරුෂාධිපත්‍යයෙන් යුත් පවුලක්" (Patriarchial Family) විස්තර කිරීම සඳහාය. පවුලේ සියල්ලන් එම අධිපති පිරිමියාගේ (Patar Families) පාලනයට යටත් විය. "වර්තමානයේ පිතෘමූලික පදය වඩා පොදු වශයෙන් පාවිච්චි කරනු ලබන්නේ පුරුෂාධිපත්‍ය ගැන, පිරිමින් ගැහැණුන් අභිබවා සිටින බල සබඳකම් ගැන සඳහන් කිරීමටය. එනම් කිහිප ආකාරයකින් ගැහැණුන් යටහත් පහත්ව තබා ගනු ලබන ක්‍රමයක් හැඳින්වීමට අද "පීතෘමූලිකත්වය" යන වචනය භාවිතා වේ"(භාසින් 1993: 01). ජුලියට් මිචෙල් (Juliet Mitchell) පීතෘ මූලිකත්වය යන වචනය භාවිතා කරන්නේ පිරිමින් විසින් ගැහැණුන් හුවමාරු කරගන්නා ඥාති (විවාහ) පද්ධති ගැන සහ එම පද්ධති තුළ පියවරුන් භුක්ති විඳින සංකේතමය බලය පිළිබඳ සඳහන් කිරීමටය. ගැහැණුන් පහත් යැයි සළකන විඥානයට හේතුව මෙය බව මිචෙල් සඳහන් කරයි.

පීතෘ මූලිකත්වයේ ස්වරූපය ලොව සෑම සමාජයකම, එකම සමාජයේ වුවත් විවිධ පංති අතර, ඉතිහාසයේ විවිධ වකවානු අතර සමාන ස්වරූපයක් නොගනී. නමුත් පුළුල් මූලධර්මය වෙනස් නොවේ. එනම් පාලනය පිරිමියා සතුය යන මූලධර්මයයි. පීතෘ මූලික පද්ධතියක පිරිමින් විසින් පාලනය කරනු ලබන්නේ මොනවාදැයි විමසීමේදී කාන්තාවන්ගේ ශ්‍රම ශක්තිය, ප්‍රජනන ශක්තිය, සංචලතාවය, දේපළ හා ආර්ථික සම්පත් යනාදී සියල්ල පාලනය කරනු දක්නට වේ. පිරිමින් විසින් පවුල තුළත් ඉන් බැහැරත් ගැහැණු ශමය වැටුපට හා නොමිලේ ගැනීමෙන් පාලනය කරති. එය පීතෘ මූලික නිෂ්පාදන මාදිලිය (Patriarchial mode of Production) ලෙස සිල්බියා වොල්බි හඳුන්වයි. ගැහැණු තම ජීවිත කාලය මුළුල්ලේම තම දරුවන්ටත්, සැමියාටත්, පවුලේ සෙසු සාමාජිකයන්ටත් විවිධ කටයුතු නොමිලේ කර දේ. ඒ අනුව ගැහැණු "නිෂ්පාදක ශක්තිය" ලෙස සැළකුවහොත් පිරිමින් "පැහැරග න්නා පංතිය" වෙති. "පවුල තුළ පමණක් නොව පවුලෙන් බැහැරවද පිරිමින් ගැහැණු ශ්‍රමය පාලනය කරති. ඔවුහු තම ගැහැණුන්ට ශ්‍රමය විකුණන ලෙස බල කිරීම එසේ නැතහොත් වැඩ කිරීමට ඉඩ නොදීම වඩා හොඳ වැටුප් ලැබෙන රැකියාවලින් බැහැර කරවීම යනාදී ලෙස දරුණු සූරාකෑමකට ලක් කරති"(භාසින්, 1999, 05-06).

උදාහරණ වශයෙන් "ලෝක ආහාර හා සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවකට (1984) අනුව ආසියාවේ මුළු ආහාර නිෂ්පාදනයෙන් අඩකටත් වඩා නිපදවන්නේ කාන්තාවන් විසිනි"(සමරනායක, 1994, 17). නමුත් "ඇයගේ ශ්‍රමයට ලැබෙන්නේ අවම සැලකිලිය. අවම තක්සේරුවකි. සංඛ්‍යාන වශයෙන් බැලුවහොත් දවසකට පැය දහයක් පමණ මුලුතැන්ගෙයි කාන්තාව විසින් සිදුවන මෙහෙය නිරන්තරයෙන් නියෝජනය වන්නේ අඩුවෙනි. මේ අනුව පිරිමින් ගැහැණුන්ගේ යටහත් පහත්භාවය තුළ ආර්ථික වාසි ලබන බව පෙනේ.

මෙපමණක් නොව පිරිමින් විසින් ගැහැණුන්ගේ ප්‍රජනන කාර්යයද පාලනය කරනු ලැබේ. දරුවන් කීදෙනෙක් වුවමනාද, එම දරුවන් අතර වයස් පරතරය කොපමණද, ගැබ් ගන්වාගනු ලබන්නේ කොයි කාලයේද, ගැබ් ගැනීමක් (Abortion) අවසන් කරන්නේද යන සියල්ල පිරිමින් විසින් තීරණය කරනු පෙනේ. උදාහරණ ලෙස මෑතකදී ලංකාවේ කළ සමීක්ෂණයකට අනුව හෙළි වූයේ තීරණ ගැනීම ස්වාමි පුරුෂයා හා භාර්යාව එකට කළ යුතු බව පිළිගත්තද සාමාන්‍යයෙන් සෞඛ්‍ය කටයුතු හා පවුල් සැලසුම ගැන තීරණ ගන්නේ පිරිමියා බවයි. "පවුල තුළ තීරණ ගැනීමේ බලධාරී පුද්ගලයා පිරිමියා බවත් ස්ත්‍රිය පාලනය කිරීමට එම බලය අවශ්‍ය බවත් එම පර්යේෂණ නියැදියේ ප්‍රතිචාරකයින්ගේ අදහස විය (විජේවර්ධන, 2019, 21). එමෙන්ම ශ්‍රී ලංකාවේ මෑත කාලීන සාඵල්‍යතාව අඩු වීම ගැන කරන ලද සමීක්ෂණයකින් ද ප්‍රකාශ වන්නේ සමීක්ෂණ නියැදියේ කාන්තාවන්ගෙන් 96ක් උපත් පාලනය පිළිබඳ කාන්තා ක්‍රමයක් භාවිතා කරනු ලබයි. (දිසානායක, 2019, 11).

මේවා පිළිබඳ පිරිමින්ගේ පාලනය හැරුණු විට පුරුෂ මූලික ආයතන විසින් (උදාහරණ රජය, උපත් පාලන ආයතන) කාන්තාවන්ගේ ප්‍රජනන ක්‍රියාවලිය සම්බන්ධ නීති රීති පැනවීම හරහා කරන පාලනයද සැලකිල්ලට ගත යුතුය. උදාහරණ වශයෙන් මේ ආයතන විසින් පනවා ඇති නීතිය තුළ බලහත්කාර ලිංගික හැසිරීමකදී නැතහොත් ස්ත්‍රී දූෂණයක දී එය දඬුවමක් ලැබිය යුතු වරදක් ලෙස නීති සම්පාදනය වී ඇත. එහෙත් එම වරද ඔප්පු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. කරුණු ඉදිරිපත් කළ යුතුය. එහිදී බලහත්කාරකාම සිදු වූ අවස්ථාවේදී අදාළ ස්ත්‍රිය එම ස්ථානයට ගියේ ඇයි? වැනි ප්‍රශ්න නගා බලහත්කාරය ඇගේ එකඟතාවය, කැමැත්ත යැයි විකෘති කර පැවසීමට, නීතිය පවා එකී ස්ත්‍රිය දෙස ඇයගේ සිරුරේ අවයව අනුව දැකීමට හා පුරුෂ දෘෂ්ටිකෝණයකින් බැලීමට උත්සහ දරන බව පෙනේ. ස්ත්‍රිය සම්බන්ධ මෙබඳු ඇතැම් සීමා අලිඛිත නීති වශයෙන් නීතියේ පෞඩත්වය ලබමින් තිබේ. මේ නීති උල්ලංඝනය කිරීම සමාජ වැරදි ලෙස පිළිගැනේ. මෙවැනි සීමා වෙනස් කළ යුතුය යන මතවාදය ඇතිව ස්ත්‍රීවාදීන් විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටිති.

"එම ව්‍යාපාර මගින් එළිදරව් වන විට, ඒවා විවෘතව පිළිගැනීමට තිබෙන බිය, සියල්ලම බිඳී විසිරී යයි යනුවෙන් පුරුෂයන් භීතියට පත් වෙති. ඊට අමතරව කාලාන්තරයක් කමන් භුක්ති විඳි අයිතිවාසිකම්, වරප්‍රසාද, බලය, ආධිපත්‍ය වැනි දේ තමන්ගෙන් ගිලිහී යාම හා ප්‍රශ්නයට භාජනය කිරීම නිසා තම ස්ථාවරභාවය අහිමිවේදෝ යන භීතිය ගිලිහෙමින් තිබේ" (තිරුචන්ද්‍රන්, 1999,15). ගැහැණුන්ගේ ශ්‍රමය, ලිංගිකත්වය හා ප්‍රජනනය පාලනය කිරීමට නම් ඔවුන්ගේ සංචලතාවයද පාලනය කිරීමට පිරිමින්ට අවශ්‍යව ඇත. ඒ නිසා පුරුෂ මූලික සන්දර්භයක් (Patriarchial Context) තුළ ගැහැණුන්ගේ සංචලතාවය පිළිබඳ නිදහස අහුරා දමයි. උදාහරණ වශයෙන් නිවසින් බැහැර යාම සීමා කිරීම, ගැහැණුන් හා පිරිමින් අතර ආශ්‍රය සීමා කිරීම යනාදිය සැළකිය හැකිය. මෙය ඉතා සරල නිදසුනකින් පැහැදිලි කළ හැකිය. ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශයක වයස අවුරුදු 16ක තරම් දැරියක් දර කැඩීම වැනි කටයුත්තකට ගෙදරින් පිටව යාමේදී ඇගේ ආරක්ෂකයා ලෙස වයස අවුරුදු 8-10ක පමණ සහෝදරයෙක් යැවීම සාමාන්‍ය සිරිතයි. එහෙත් පිරිමියෙකුගේ ආරක්ෂාවට කිසිම විටෙක ගැහැණියක් යවන අවස්ථා නැත. මෙහි ප්‍රතිඵලය වන්නේ කාන්තාව වයසින් වැඩි වූවත් වයසින් අඩු පිරිමියා ඇයට වඩා ඉදිරියෙන් සිටින බව එම දැරිය හා පිරිමි දරුවා තුළ ආකල්පයක් ඇති වීමයි.

"සමාජයේ මූලික ඒකකය වන පවුල ඉතාම පීතෘ මූලික ආයතනය ලෙස සැළකිය හැකිය. පවුලේ නැතහොත් නිවසේ මූලිකයා ලෙස සළකනු ලබන්නේ පිරිමියෙකි. පවුල තුළ ඔහු කාන්තාවන්ගේ ලිංගිකත්වය, ශ්‍රමය නැතහොත් නිෂ්පාදනය, ප්‍රජනනය හා සචලතාව පාලනය කරයි. පිරිමියා උසස් හා අධිපති යයිද, ගැහැණිය පහත් හා යටත් යයිද සළකන ධූරාවලියක් ඇත. ඊළඟ පරම්පරාවට පීතෘ මූලික නියමයන් හා පැවතුම් පුරුදු පුහුණු කිරීම සඳහාද පවුල වැදගත් වෙයි. ධූරාවලිය යටහත් පහත්කම්, වෙනස්කම් කිරීම ආදිය පිළිබඳ පළමු පාඩම අප ඉගෙන ගන්නේ ද පවුල තුළින්ය........ පවුල මගින් කෙරෙන්නේ හුදෙක් රාජ්‍යයන්හි පවතින විනය පිළිඹිබු කිරීම හා එය අනුගමනය කරන ලෙස තම දරුවන්ට ඉගැන්වීම පමණක් නොවේ. ඒ විනය බිහි කිරීම හා නිරන්තරයෙන් ශක්තිමක් කිරීම ද එයින් සිදු වේ "(භාසින් ,1994, 11).

මෙසේ පවුල යනු කාන්තාවන්ගේ ලිංගිකත්වය සූරා කන පීතෘ මූලිකත්වය (Patriarchy) ඉදිරියට ගෙන යාමට අවශ්‍ය විනය හා පුහුණුව ඇති කරන ආයතනයකි. කාන්තාවගේ පීඩනයට හේතුව මෙම පීතෘ මූලික පවුල් ක්‍රමයයි. පීතෘ මූලික සමාජයක් තුළ පවතින සියලුම ආයතන තුළින් පුරුෂයාට වැදගත්කමක් ලබාදෙන අතර ඒ අනුව පවුල තුළ ද කාන්තාවට පහළ සමාජ තත්ත්වයක් හිමි වන බව පෙන්වා දේ. පවුල තුළ කාන්තාවගේ පීඩනයට ප්‍රධාන හේතුව ප්‍රජනනයයි. ඕනෑම සමාජයක කාන්තාවන් විසින් දරුවන් වැදීම, දරුවන් හැදීම සහ පුරුෂයාගේ ලිංගික අවශ්‍යතා ඉටු කිරීම කළ යුතුය. මේ අනුව පිරිමින් කාන්තාවන්ගේ ශරීරය පාලනය කරති. මේ සඳහා අවශ්‍ය ආයතන පද්ධතියක් සමාජය තුළ ගොඩනගා ගෙන ඇත. එම ආයතන අතර පවුල හා විවාහය යනාදිය ප්‍රධානය. පීතෘ මූලික සමාජයක් තුළ පවතින ප්‍රධාන ආයතන විශ්ලේෂණය කිරීමේදී ඒවා සියල්ල ස්වරූපය අතින් පුරුෂ ආධිපත්‍ය මූලික කරගත් ඒවා බව පෙනී යයි. පවුල, ආගම, සන්නිවේදන මාධ්‍යයන් හා නීතිය යනාදිය පීතෘ මූලික සමාජ පද්ධතියක ව්‍යුහය වේ. ඒ අනුව පවුල යන්නද සමාජ ආයතනයකි. කාන්තාවන් සූරාකෑම, පීඩනයට ලක් කිරීම, ප්‍රචණ්ඩත්වයට පත් කරන්නේද පවුල තුළින්ය.

මෙසේ පීතෘ මූලික සමාජය තුළ කාන්තාව පීඩනයට පත් වන බවත් කාන්තාවට මින් නිදහස් විය හැකි කම මාර්ගය වන්නේ පීතෘ මූලික පවුල ක්‍රමයට විරුද්ධ වී එම පවුල ක්‍රමය අහෝසි කිරීමෙන් බවත් මින් අවධාරණය කරන අදහසකි. මාක්ස්වාදීන්ට අනුව සමාජයක ගාමක බලවේගය වන්නේ ආර්ථික සාධකයයි. ඒ අනුව නිෂ්පාදනය ක්‍රමය ආශ්‍රිතව භාණ්ඩ හුවමාරුව හා ශ්‍රමය යෙදවීම මත සමාජය තුළ අන්‍යෝන්‍ය ප්‍රතිවිරෝධි පංති ඇති වෙයි. මෙම පංති ප්‍රතිවිරෝධතාවයන් මුල් කරගෙන පංති ගැටුම් ද දක්නට ලැබේ. නමුත් කාන්තාවාදීන්ට අනුව මෙම ආර්ථික පංති ක්‍රමයට වඩා ලිංගිකත්වය පදනම් කරගෙන පංති රටාවක් ගොඩනැගෙන බවත් මෙම පංති ක්‍රමයට අනුව විවාහය, ප්‍රජනනය හා දරුවන් දැරීම වැනි සාධක පදනම් කරගෙන පංති ප්‍රතිවිරෝධතාවයන් ඇති වන බව විශ්වාස කරති.  මෙලෙස මුලින් ස්ත්‍රී පුරුෂත්වය මත ලිංගිකව ඇති වන ශ්‍රම විභජනය පංති ක්‍රමයක් දක්වා වෙනස් වූ බව විග්‍රහ කරති. නමුත් මාක්ස්වාදී විග්‍රහය ඉක්මවා විග්‍රහයක් ඉදිරිපත් කිරීම රැඩිකල් කාන්තාවාදීන් තුළින් සිදු වෙයි. ඒ අනුව පංති ක්‍රමයට වඩා කාන්තාවන් ගැහැණියක් වූ නිසාම ඇයට පීඩනය උරුම වී ඇත. එනම් කාන්තාවගේ ජීව විද්‍යාත්මක සාධක නිසාම ඇය පීඩනයට ලක් වී ඇත.

කාන්තාවන් පීඩනයට පත් වීමේ ප්‍රධාන සාධක අතර වැදගත් වන්නේ පීතෘත්වය (Patriarchy), ලිංගිකත්වය (Sex) හා ස්ත්‍රී පුරුෂභාවයයි (Gender). මෙම සාධක හා දේශපාලන බලය අතර ද සමීප සම්බන්ධතාවයක් පවතී යැයි විශ්වාස කෙරේ. ලිංගිකත්වය බලය හා සම්බන්ධ කරුණකි. "කිසියම් ජන සමූහයක් තුළ බලය ක්‍රියාත්මක වන්නේ පීතෘමූලිකත්වය තුළිනි. සමාජය තුළ දේශපාලන, ආර්ථික, ජාතිකත්වය යනාදී සෑම කරුණක්ම මෙම රාමුව තුළ ගොනු වී ඇත. පෞද්ගලික ලෝකය (Private World) හා පොදු ලෝකය (Public World) යනාදී සියල්ලම ක්‍රියාත්මක වන්නේ පීතෘ මූලික රාමුව තුළය" (Millet ,1970 ,125).

"පීතෘ මූලික සමාජ ක්‍රමය තුළ ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ඇති සබඳතාවය ජීව විද්‍යාත්මක එකකි. එනම් ස්ත්‍රී පුරුෂ ලිංගිකත්වය මත ගොඩනැගුණකි. ඒ අතර ප්‍රධානම කාර්යය වන්නේ ප්‍රජනනයයි. ප්‍රජනන කාර්යය කාන්තාවන් අවේණික වූවක් නිසාම ඇය පීතෘ මූලිකත්වයේ පීඩනයට ලක් වෙයි" (Firestone ,1976, 56). "පීතෘ මූලිකත්වය තුළින් කාන්තාව සිය ගෘහය තුළ පිරිමියාගේ කේන්ද්‍රීය පාලනයට යටත් වෙයි. ඒ අනුව කාන්තාවන්ගේ පීඩනය ඇති කරන ආයතනයකි."(භාසින්,1994,79). "පවුල තුළ පිරිමින්ගේ බලය කාන්තාවන්ගේ පීඩනයට ප්‍රමුඛතම හේතුවයි " (French, 1985, 53).

පීතෘ මූලික පවුල් රටාව තුළින් කාන්තාවන් පවතින සමාජයේ ඇති සදාචාරාත්මක හෝ නීතිමය ආයතන විසින් සාධාරණීකරණය කරති.රැඩිකල් කාන්තාවාදීන්ගේ පවුල පිළිබඳ සමස්ත විග්‍රහය සළකා බලන විට කාන්තාව පවුල තුළ දරන්නා වූ කාර්යය තුළින් ඇය පීඩනයට ලක්වන බව කියවෙයි. මේ කෙරෙහි පීතෘ මූලිකත්වය විසින් ඇය පීඩනයට ලක් කෙරේ. එම තත්ත්වය වෙනස් කිරීමට නම් පවුල් ක්‍රමය අහෝසි කළ යුතු බව ඔවුන්ගේ පිළිගැනීමයි.පංති භේදයට වඩා ලිංග භේදය පදනම් කරගත් විෂමතාවයන් ධනවාදයට කලිනුත් පැවති අතර සමාජවාදයට පසුවත් එසේම පවතින බව පෙනේ. මාක්ස්වාදී කාන්තාවාදීන්ට අනූව පෞද්ගලික දේපළ ක්‍රමය අහෝසි කළ විට ධනේෂ්වර පවුල් රටාව බිඳ වැටේ. එසේ වූවත් "සමාජවාදී කාන්තාවාදීන් පෙන්වන්නේ පීතෘ මූලික පවුල් රටාව තවදුරටත් පවතින බවය " (Tiruchandram, 1991, 86).

පීතෘ මූලික පවුල් ක්‍රමය පද්ධතියක් වශයෙන් සමාජය තුළ පවතින අතර නිෂ්පාදන ක්‍රමය වෙනස් වීම අනූව පංති ක්‍රමය වෙනස් වූවත් පීතෘමූලිකත්වය වෙනස් නොවේ. මාක්ස්වාදී ස්ත්‍රීවාදීන්ට පෙන්වා දෙන පරිදි පුද්ගලික දේපළ ක්‍රමය පදනම් කරගෙන පංති ක්‍රමය ගොඩනැගී ඇත. ඒ අනූව පුද්ගලික දේපළ ක්‍රමය අහෝසි කළ පසුව පංති ක්‍රමය ද වෙනස් වේ. නමුත් පීතෘ මූලිකත්වය දේපළ සම්බන්ධතාවයක් මත ගොඩනැගෙන්නක් නොවන නිසා පුද්ගලික දේපළ ක්‍රමය අහෝසි වීම මත පීතෘ මූලිකත්වය වෙනස් නොවේ. පීතෘ මූලිකත්වය ප්‍රජනනය හා සම්බන්ධ වේ. ප්‍රජනන කාර්යයන් ඉටුකරන ආයතනය ලෙස සමාජය පිළිගන්නේ පවුලයි. එබැවින් පවුල නැමැති සමාජ ආයතනය තුළ කාන්තාවන්ගේ පීඩනයද පීතෘ මූලික පවුල් ක්‍රමය තුළින් ජනිත වන්නකි. මෙම ප්‍රජනන කාර්යය හා ගෘහ ශ්‍රමය යනාදී සමස්ත කාර්යය පද්ධතියම මාක්ස්වාදීන් අමතක කොට ඇත. පීතෘ මූලික පවුල් ක්‍රමයක් තුළ මේ සෑම එකක්ම පද්ධතියක් ලෙස පවතින බව කිව හැක.

පීතෘ මූලික පවුල් ක්‍රමය තුළ පුරුෂයාගේ පාලනය ස්ථාපිත වී ඇත. පවුල තුළ සියලුම සාමාජික-යන් පවුලේ අධිපති පිරිමියාගේ පාලනයට නතු වේ. සමාජයේ සෑම ස්ථරයකම සිටින පුරුෂයන් කාන්තාවන්ගේ පවතින තත්ත්වය නිසා ලාභ ලබාගනිති. කාන්තාව කෙරෙහි ක්‍රියාත්මක වන යම් යම් ප්‍රමිතීන් එනම් කන්‍යාභාවය, පතිවත යනාදිය පිළිගැනීමත්, කාන්තාව වෙළඳ භාණ්ඩයක් ලෙස නිරූපණය කිරීමත් තුළින් කාන්තාව කෙරෙහි අවධානය දක්වති. ස්ත්‍රී දූෂණ, ගණිකා වෘත්තිය ආදිය තුළින් ද මෙම තත්ත්වය පැහැදිලිය. මෙසේ පංති ක්‍රමය ඉක්මවා කාන්තාව පීතෘ මූලික ආධිපත්‍ය යටතේ පීඩාවට ලක්වන බව පෙන්වා දේ.

සමාජවාදී කාන්තාවාදීන් පවුල පීතෘ මූලික ආධිපත්‍ය පිළිබඳ අවධානය යොමු කරන අතර ඒ තුළින් කාන්තාව පීඩනයට පත් වන බව පෙන්වා දේ. මේ නිසා කාන්තාවගේ පීඩනය ඉවත් කිරීමට පීතෘ මූලික පවුල් ක්‍රමය අහෝසි විය යුතුය. මේ නිසා ප්‍රතිවිරෝධතාවයට හේතු වන මූලික සාධකය වන පීතෘ මූලික පවුල් රටාව වෙනස් කිරීම තුළින් පද්ධතියේ අනෙකුත් සාධක ද වෙනස් වීමට භාජනය වේ. මෙම පවුල තුළ පීතෘ ආධිපත්‍ය වෙනස් කිරීම තුළින් කාන්තාවට සම අවස්ථාවන උදා වේ. විශේෂයෙන්ම පිතෘමූලික සංස්කෘතිය මගින් නිර්මිත ආගමික මතවාද තුලින්ද ඉහත කරුණ ප්‍රතක්ෂ වේ.බයිබලයේ සඳහන් වන ආකාරයට ඊඩන්ගේ උපතේදී ප්‍රථම පාපය කරනු ලබන්නේ කාන්තාව විසිනි. ඇය එහිදී තහනම් ගසේ ගෙඩි රස බැලුවාය. ආදම් පොළඹවා ගත්තාය. ඒ සඳහා ආදීනව වශයෙන් සදාකාලිකව වන්දි ගෙවන්නීය. ප්‍රභවය පිළිබඳ පොතෙහි දෙවියන් වහන්සේ මෙසේ ප්‍රකාශ කරයි.

"මම ඔබගේ වේදනාව සහ පිළිසිඳ ගැනීම විශාල වශයෙන් වැඩි කරමි. ඔබ වේදනාවෙන් පෙළෙමින් දරුවන් ලබා දිය යුතුය. එමෙන්ම ඔබගේ කැමැත්ත විය යුත්තේ ඔබගේ ස්වාමි පුරුෂයාගේ සතුටයි. එපමණක් නොව, ඔබ පාලනය කරනු ඇත්තේ ඔහු විසිනි" (Genesis,1996, 16). කාන්තාවගේ සමාජ ස්ථාවරය හා සම්බන්ධයෙන් ඉහතින් දක්වා ඇති උපුටනය හුදු ජනප්‍රවාදයක් ලෙස සමාජ විද්‍යාඥයන් විසින් සැළකිය හැකිය. කෙසේ වෙතත් බොහෝ කාන්තාවන් සිය ස්වාමි පුරුෂයා සමග ශතවර්ෂාධික කාලයක් තිස්සේ ගත කරනු ලබන ජීවිතයේ අන්තර්ගතය පහත සඳහන් වගකීම්වලින් සමන්විත බවට ඇය සාක්ෂි දරනු ඇත.

1 කාන්තාව දරුවන් සෑදිය යුතුය.
2 කාන්තාව බිරිඳක් හා මවක් විය යුතුය.
3 ඉවුම් පිහුම්, සුද්ධ පවිත්‍ර කිරීම්, මැහුම් ගෙතුම් හා සේදීම් කටයුතු කාන්තාව විසින් ඉටු කළ යුතුය.
4 ඇය පුරුෂයාගේ ඕනෑ එපාකම් පිළිබඳ සැලකිළිමත් විය යුතු අතර ඔහුගේ ආධිපත්‍යයට යටත් විය යුතුය.
5 ඉහළ සමාජ තත්ත්වයක් හිමි රැකී රක්ෂාවන්ගෙන් හිතාමතාම කාන්තාව ඈත්කර තපනු ලැබීය.

එමෙන්ම බලයක් හිමි වන මාදිලියේ වගකීම් ද ඇය වෙත නොපවරන ලදී. සංකීර්ණ කාර්මික සමාජවල කාන්තාව විසින් ඉටු කරනු ලබන භූමිකාව සාධාරණීකරණය කර දැක්වීම සඳහා ද මේ හා සමාන වූ අදහස් ඉදිරිපත් වී ඇත. "කාර්මික සමාජයේ හුදකලා වූ න්‍යෂ්ටික පවුල මගින් මූලික කාර්යයන් දෙකක් සම්පූර්ණ කරනු ලබන බව ටැල්කොට් පාසන්ස් විසින් පෙන්වා දෙනු ලැබේ.

1 ළාබාල දරුවන් අනුයෝජනය කිරීම
2 වැඩිහිටියන්ගේ තත්ත්වය ආරක්ෂා කර දී රැකවරණය සැළසීම"(Parsons, 1955,23).

මෙයාකාරයට මානව පරිණාමන ක්‍රියාවලිය තුළ සමාජ අනුයෝජනය සඳහා කාර්යක්ෂම, කුළුපග, උණුසුම් හා අන්‍යෝන්‍ය උපකාරයෙන් යුත්ක සමූහයක සේවය අත්‍යවශ්‍ය වේ. මෙකී අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීමේ සුදුසුකම් පවුල් සමූහය තුළ පවතී. පවුල් සමූහය තුළ හැදෙන වැඩෙන ළාබාල දරුවන් අනුයෝජනය කර ගැනීමේ අතිශය වැදගත් කාර්යභාරය හා සම්බන්ධ වගකීම කාන්තාව වෙත භාර විය. ඔහුට අනුව, ණිදරුවන් දැරීම හා ළාබාල දරුවන් ඇති දැඩි කර ගැනීම මත දරුවා හා මව අතර ඉතාමත් ශක්තිමත් හා සාඩම්බර සම්බන්ධතාවක් සඳහා මූලික පදනම සැකසේ. ජීව විද්‍යාත්මක ලිංග භේදයට සාපේක්ෂව භූමිකා භාර කිරීමට මූලික වශයෙන් පදනම් වන්නේ මෙම සබැඳියාව බව අපගේ ස්ථාවරය වේ යනුවෙනි. මව්වරු දරුවන් දරා සිටින අතර ආරම්භයේ සිට ඇති දැඩි කරති. එහෙයින් මෙම දරුවන් මව හා සමග ඉතාමත් සමීප හා ශක්තිමත් සම්බන්ධතාවක් ඇති කරනු ලැබේ. දැඩි හුදකලාභාවයකට පත්ව ඇති නවීන කාර්මික සමාජවල න්‍යෂ්ටික පවුල තුළ පවා මෙම සම්බන්ධතා මේ අයුරින්ම දක්නට ලැබෙන බව පාසන්ස් අවධාරණය කරයි. එක් වැඩිහිටි කාන්තාවකගේ වගකීම් සමූහය මාතෘ භූමිකාව මගින් තීව්‍ර කරනු ලැබේ. තවද ස්වාමි පුරුෂයා හා පියා දවසේ වැඩි කාලයක් නිවසින් බැහැරව සිටී. ඉන් අදහස් වන්නේ දරුවන්ගේ ප්‍රාථමික අවශ්‍යතා පිළිබඳ වගකීම සම්පූර්ණයෙන්ම පාහේ ඇය වෙත බාර වන බවය.

පවුල් සමූහය තුළ කාන්තාවගේ භූමිකාව විභවනාත්මක හෙවත් හැඟීම්බර එකක් වන බව පාසන්ස් විසින් අර්ථකථනය කරනු ලැබේ. එයින් අදහස් වන්නේ ඇය දරුවාගේ වර්ධනයේදී උණුසුම ආරක්ෂාව මෙන්ම ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා අවශ්‍ය සහයෝගය නොමඳව ලබා දෙන බවයි. දරුවාගේ අර්ථාන්විත නැතහොත් ඵලදායී අනුයෝජනය සඳහා මවගෙන් ලැබෙන මෙකී උපකාරයන් අත්‍යවශ්‍ය වේ.

දරුවා වෙනුවෙන් කරනු ලබන මෙකී කැප කිරීමට සමාන වූ තවත් මෙහෙවරක් ඇය සිය ස්වාමි පුරුෂයා වෙනුවෙන් ද ඉටු කරනු ලැබේ. එමෙන්ම කාර්මික සමාජවල හුදකලා වන න්‍යෂ්ටික පවුලේ දෙවන කාර්‍යභාරය ලෙස වැඩිහිටියන්ගේ පෞරුෂය ශක්තිමත් කරමින් ඔවුනට ආරක්ෂාව සලසාලීම සඳහාද කාන්තාව මෙහිදී උර දෙන්නීය. ඒ අතරම පුරුෂයා ආර්ථික සම්පත් උපයන්නා හැටියට දවස පුරා ඉලක්ක දිශානතික සංකීර්ණ සමාජයෙහි ඉතා උණුසුම් තරගයක පැටලී සිටිනු දක්නට ලැබේ. උපයෝගීතාවන් වෙත යොමු වූ හෙවත් ඉලක්ක සාධන භූමිකාවෙන් හෙම්බත් වූ පුරුෂයා දැඩි සාංකාවකට මෙන්ම මානසික ආතතියකටද ගොදුරු වීමෙන් පීඩාවට පත් වේ. විභවනාත්මක හෙවත් හැඟීම්බර කාන්තාව පුරුෂයා වෙත ආදරය, සෙනෙහස දක්වන්නීය. ඔහු කෙරේ මහත් සේ සැලකිලිමත් වන්නීය. එපමණක් නොව ඔහුගේ තත්ත්වය මැනවින් තේරුම් ගෙන මහත් සේ වෙහෙසට පත් සිය ස්වාමි පුරුෂයා අස්වසාලමින් කායික හා මානසික සුවය ලබා දෙමින් රැකවරණය සළසන්නීය. මෙපමණක් නොව පිරිමින් විසින් ගැහැණුන්ගේ ප්‍රජනන කාර්යයද පාලනය කරනු ලැබේ. දරුවන් කීදෙනෙක් වුවමනාද, එම දරුවන් අතර වයස් පරතරය කොපමණද, ගැබ් ගන්වාගනු ලබන්නේ කොයි කාලයේද, ගැබ් ගැනීමක් (Abortion) අවසන් කරන්නේද යන සියල්ල පිරිමින් විසින් තීරණය කරනු පෙනේ. උදාහරණ ලෙස මෑතකදී ලංකාවේ කළ සමීක්ෂණයකට අනුව හෙළි වූයේ තීරණ ගැනීම ස්වාමි පුරුෂයා හා භාර්යාව එකට කළ යුතු බව පිළිගත්තද සාමාන්‍යයෙන් සෞඛ්‍ය කටයුතු හා පවුල් සැලසුම ගැන තීරණ ගන්නේ පිරිමියා බවයි. "පවුල තුළ තීරණ ගැනීමේ බලධාරී පුද්ගලයා පිරිමියා බවත් ස්ත්‍රිය පාලනය කිරීමට එම බලය අවශ්‍ය බවත් එම පර්යේෂණ නියදියේ ප්‍රතිචාරකයින්ගේ අදහස විය (විජේවර්ධන, 1999,21). එමෙන්ම ශ්‍රී ලංකාවේ මෑත කාලීන සාඵල්‍යතාව අඩු වීම ගැන කරන ලද සමීක්ෂණයකින් ද ප්‍රකාශ වන්නේ සමීක්ෂණ නියදියේ කාන්තාවන්ගෙන් 96ක් උපත් පාලනය පිළිබඳ කාන්තා ක්‍රමයක් භාවිතා කරනු ලබයි(දිසානායක, 1999,11).

මේවා පිළිබඳ පිරිමින්ගේ පාලනය හැරුණු විට පුරුෂ මූලික ආයතන විසින් (නිදසුන් ඨ රජය, උපත් පාලන ආයතන) කාන්තාවන්ගේ ප්‍රජනන ක්‍රියාවලිය සම්බන්ධ නීති රීති පැනවීම හරහා කරන පාලනයද සැලකිල්ලට ගත යුතුය. උදාහරණ වශයෙන් මේ ආයතන විසින් පනවා ඇති නීතිය තුළ බලහත්කාර ලිංගික හැසිරීමකදී නැතහොත් ස්ත්‍රී දූෂණයකදී එය දඬුවමක් ලැබිය යුතු වරදක් ලෙස නීති සම්පාදනය වී ඇත. එහෙත් එම වරද ඔප්පු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. කරුණු ඉදිරිපත් කළ යුතුය. එහිදී බලහත්කාරකාම සිදු වූ අවස්ථාවේදී අදාළ ස්ත්‍රිය එම ස්ථානයට ගියේ ඇයි? වැනි ප්‍රශ්න නගා බලහත්කාරය ඇගේ එකඟතාවය, කැමැත්ත යැයි විකෘති කර පැවසීමට, නීතිය පවා එකී ස්ත්‍රිය දෙස ඇයගේ සිරුරේ අවයව අනුව දැකීමට හා පුරුෂ ද ෘෂ්ටිකෝණයකින් බැලීමට උත්සහ දරන බව පෙනේ. ස්ත්‍රිය සම්බන්ධ මෙබඳු ඇතැම් සීමා අලිඛිත නීති වශයෙන් නීතියේ පෞඪත්වය ලබමින් තිබේ. මේ නීති උල්ලංඝනය කිරීම සමාජ වැරදි ලෙස පිළිගැනේ. මෙවැනි සීමා වෙනස් කළ යුතුය යන මතවාදය ඇතිව ස්ත්‍රීවාදීන් විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටිති.

"එම ව්‍යාපාර මගින් එළිදරව් වන විට, ඒවා විවෘතව පිළිගැනීමට තිබෙන බිය, සියල්ලම බිඳී විසිරී යයි යනුවෙන් පුරුෂයන් භීතියට පත් වෙති. ඊට අමතරව කාලාන්තරයක් කමන් භුක්ති විඳි අයිතිවාසිකම්,වරප්‍රසාද, බලය, ආධිපත්‍ය වැනි දේ තමන්ගෙන් ගිලිහී යාම හා ප්‍රශ්නයට භාජනය කිරීම නිසා තම ස්ථාවරභාවය අහිමිවේදෝ යන භීතිය ගිලිහෙමින් තිබේ"(තිරුචන්ද්‍රන්ල 1999,15).

ගැහැණුන්ගේ ශ්‍රමය, ලිංගිකත්වය හා ප්‍රජනනය පාලනය කිරීමට නම් ඔවුන්ගේ සංචලතාවයද පාලනය කිරීමට පිරිමින්ට අවශ්‍යව ඇත. ඒ නිසා පුරුෂ මූලික සන්දර්භයක් (Patriarchial Context) තුළ ගැහැණුන්ගේ සංචලතාවය පිළිබඳ නිදහස අහුරා දමයි. උදාහරණ වශයෙන් නිවසින් බැහැර යාම සීමා කිරීම, ගැහැණුන් හා පිරිමින් අතර ආශ්‍රය සීමා කිරීම යනාදිය සැළකිය හැකිය. මෙය ඉතා සරල නිදසුනකින් පැහැදිලි කළ හැකිය. ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශයක වයස අවුරුදු 16ක තරම් දැරියක් දර කැඩීම වැනි කටයුත්තකට ගෙදරින් පිටව යාමේදී ඇගේ ආරක්ෂකයා ලෙස වයස අවුරුදු 8-10ක පමණ සහෝදරයෙක් යැවීම සාමාන්‍ය සිරිතයි. එහෙත් පිරිමියෙකුගේ ආරක්ෂාවට කිසිම විටෙක ගැහැණියක් යවන අවස්ථා නැත. මෙහි ප්‍රතිඵලය වන්නේ කාන්තාව වයසින් වැඩි වූවත් වයසින් අඩු පිරිමියා ඇයට වඩා ඉදිරියෙන් සිටින බව එම දැරිය හා පිරිමි දරුවා තුළ ආකල්පයක් ඇති වීමයි. " දේපළ හා වෙනත් ඵලදායක සම්පත් වැඩි ප්‍රමාණයක් පාලනය කරනු ලබන්නේ පිරිමින්ය. මේවා පිය රේඛීය උරුම ක්‍රමයක් (Patrilineal Descent System) ඔස්සේ පියවරුන්ගේ පුතුන්ට හිමි වේ" (Agarawal, 1994: 250). නිදසුනක් ලෙස කාන්තාවන්ට අයිතිවාසිකම් කිව හැක්කේ ලොව පවත්නා සමස්ත භූමියෙන් 1%ක් සඳහාය. එමෙන්ම "ශ්‍රී ලංකාව ඇතුළු තෙවැනි ලොව රටවල පරවේණි උරුමයෙන් වුවද කාන්තාවන්ගෙන් 98%කට ඉඩම් අයිතිය හිමි නොවේ"(සමරනායක, 1994, 15). දෙමාපියන් දියණියන්ට ඉඩම් පවරා දෙතොත් ඒ ඉතාමත් කලාතුරකිනි. ඒ තම පරපුර ගෙන යාමට පුතුන් නැති පවුල් (Sonless families) තුළය. එබඳු අවස්ථාවක වුවද ඇතැම් දෙමාපියන් කටයුතු කරනු ලබන්නේ දෙතුන් ආකාරයකිනි. සමහරු තම දියණියට විවාහයෙන් පසු පිරිමි දරුවෙකු ලැබුණහොත් තම දියණියට අයත් ඉඩම් අයිතිය එම මුණුපුරාට පවරා දේ. තවත් සමහරු තම දියණිය විවාහ කර ගන්නා ස්වාමිපුරුෂයාට දෑවැද්ද ලෙස ඉඩම් අයිතිය පවරා දේ. මෙයින් පැහැදිලි වන්නේ යම් අයිතිවාසිකම් අතින් ස්ත්‍රිය පුරුෂයාට සමාන නැති බවයි. එමෙන්ම මේ පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංගමය මගින් තවදුරටත් පැහැදිලි කර ඇත. "ලෝකයේ මුළු වැඩ පැය ගණනින් 60%කට වඩා ඉටු කරන්නේ ගැහැණුන් විසිනි. එහෙත් ලෝක ආදායමින් ඔවුන්ට ලැබෙන්නේ 10%ක් පමණි. ලෝකයේ දේපළවලින් ඔවුන්ට අයත් වන්නේ 1%ක් පමණි"(භාසින්, 1993, 10).

මෙපමණක් නොව ආර්ථික, දේශපාලන, ආගමික, සමාජ හා සංස්කෘතික ආයතන සියල්ල පාලනය කරනු ලබන්නේ ද පුරුෂයන් විසින් බව ස්ත්‍රීවාදීන් පෙන්වා දේ. පවුල, ආගම, නීතිය වැනි සමාජ සංස්ථා සියල්ලද සන්නිවේදන මාධ්‍යයන් ද ස්වරූපය අතින් පීතෘ මූලික වේ. මැනවින් එකට වෙළුන හා ගැඹුරට මුල් බැස ගත් පද්ධතිය නිසා එම සමාජ සංස්ථාවන්හි පවතින පීතෘ මූලික ක්‍රමය අනභිභවනීය යැයි පෙනී යා හැක. එමෙන්ම එය ස්වාභාවික දෙයක් ලෙස ද පෙන්නුම් කෙරේ. සමාජ නිර්මාණයේ න්‍යෂ්ඨිය වන පවුල නම් ආයතනය පීතෘ මූලිකය. පිරිමියා උසස් හා අධිපති යැයිද, ගැහැණිය පහත් හා යටත් යැයිද සළකන ධූරාවලියක් එහි දක්නට ඇත. පීතෘ මූලික නියමයන් ඊළඟ පරපුර වෙත සම්ප්‍රේෂණය කරනු ලබන්නේ පවුල මගිනි.

"ගර්ඩා ලර්නර් දක්වන්නේ පීතෘ මූලික සමාජයේ විනය ක්‍රමය රකිනු ලැබීමට පවුල මගින් එහි දරුවන් පීතෘ මූලික ආකෘතියකට අනුව සමාජානුයෝජනය කරන බවය. එමගින් රාජ්‍යයේ විනය පිළිබිඹු කිරීමට හා එය අනුගමනය කිරීමට පවුලේ දරුවන්ට ඉගැන්වීම සිදු කරනවා පමණක් නොව, එම විනය බිහි කිරීම හා එහි පවත්වාගෙන යාම හා ශක්තිමත් කිරීම නිරන්තරයෙන් සිදු කරයි"(Lerner, 1986, 56).

පවත්නා සමාජයෙහි ආගම නම් සමාජ සංස්ථාව මගින් ද පිරිමි අධිකාරීත්වය උත්තරීතර බව නියම කර ඇත. පීතෘ අධිපතීත්වය මිනිසාට ඉහළින් ඇති අද්භූත බලයක් විසින් නියම කර ඇතැයි ආගමෙන් උගන්වයි. ස්ත්‍රියගේ ස්වරූපය ආගමෙන් කෙමෙන් දුබල කොට තිබේ. උදාහරණ ලෙස ඇතැම් ආගම්වල දේවතාවියන් ඉවත් කොට ඒ තැන්වලට දේවතාවුන් පත් කර තිබේ. එමෙන්ම ලොව සියලුම ප්‍රධාන ආගම් සැළකුවහොත් ඒවා සියල්ලේ නිර්මාතෘවරයා පිරිමියෙකි. " සෑම ආගමකම වාගේ දක්නට ලැබෙන "පවිත්‍රතාවය හා කිල්ල (Secred and Pollution) පිළිබඳ අදහස" තුළ ස්ත්‍රිය අපවිත්‍ර ලෙස නිර්වචනය කර තිබේ"(භාසින්, 1993, 11).

කාන්තාව සම්බන්ධව භාරතීය සමාජයේ පීඩනකාරී සමාජ අසමානතා පවතින අවධියක බුදුරදුන් පහළ වී කාන්තාවන්ට ආගමික විමුක්තිය මෙන්ම සමාජීය විමුක්තිය උදාකළ බව ප්‍රකාශිතය. බුදුදහම තුළින් කාන්තාවන්ට එතෙක් තිබූ අසමානතාව, පීඩනය දුරු කරනු ලැබූණි යයි ප්‍රකාශ වුවද කාන්තාව සම්බන්ධව ගන්නා ලද සමහර ක්‍රියාමාර්ගවලදී පූර්ණ නිදහසක් නොලැබුණ බව පැහැදිලිය. "උදාහරණ වශයෙන් මෙහෙණි සස්න පිහිටුවීම දැක්විය හැකිය. මෙහිදී බුදුන් වහන්සේ මදක් ප්‍රමාද වී නමුත් මෙහෙණි සසුන පිහිටුවීම උදෙසා අවසර දුන්නේ ගරු ධර්ම අටක් පිළිපැදීමට ඔවුන් පිළිපැදීමට පොරොන්දු කරවා ගැනීමෙනි. එහි පළමු වන ගරු ධර්මය වූයේ, "මෙහෙණිය විසින් උපසම්පදා භික්ෂුවකට වැඳීම, හුනස්නෙන් නැගිටීම කළ යුතු බවයි." මෙය වෙනස් කර ගැනීමට ප්‍රජාපතී ගෝතමී ගන්නා ලද උත්සහය කෙතරම්ද යන්න චුල්ලවග්ග පාලියේ සඳහන් වේ. ස්ත්‍රී පුරුෂභාවය නොව ජ්‍යෙෂ්ඨත්වය සැළකිල්ලට ගෙන ශාසනයේ සංවිධානය සකස් කරන ලෙස ප්‍රජාපතී ගෝතමී ඉල්ලා සිටියාය. එහෙත් බුදුරදුන් ඊට අකමැති වූ බව සඳහන් වේ. භික්ෂූන් විසින් භික්ෂුණීන්ට නමස්කාර කිරීමට ඉඩ දිය නොහැකි බව සඳහන් කර ඇත. මේ ගරු ධර්ම අටෙන් කාන්තාවන් අභිබවා පුරුෂයන්ට උත්තරීතර ස්ථානයක් ලැබෙන බව පැහැදිලිය. අනෙක් අතට බෞද්ධ සාහිත්‍යයෙහි විශේෂයෙන් ජාතක කතා තුළ කාන්තාවන්ගේ ගතිගුණ අපහාසයෙන් හෝ උපහාසයෙන් දක්වා තිබේ. අන්ධභූත ජාතකය, චුල්ලධනුග්ග ජාතකය, හංස ජාතකය ආදී වූ බොහෝ ජාතක කතාවල හරයෙන් කාන්තාවන්ගේ තත්ත්වය එකම පහත් මිනුම් දණ්ඩක ලා සැළකේ. සෑම ආගමකම කාන්තාවට ඇති පිළිගැනීම අසුභවාදී එකක් වේ.

රටවල් බොහෝමයක නීති පද්ධතිය පීතෘ මූලික මෙන්ම ධනවාදී වේ. එය පිරිමින්ට, බලගතු පන්තියට නීතිමය වශයෙන් වාසි සළසයි. ආසියාවේ සෑම නීති පද්ධතියක් මගින් ම පිරිමියා පවුලේ මූලිකයා ලෙස ද, දරුවන්ගේ ස්වාභාවික ලෙස ද, දේපළවල උරුමකරුවා ලෙස ද සළකයි. නීති විද්‍යාව, අධිකරණය, විනිශ්චයකරුවන්, නීතිඥයන් වැඩි වශයෙන්ම සිය ආකල්ප අතින් හා නීතිය තේරුම් කරන ආකාරයෙන් පීතෘ මූලික බව පෙනේ. නමුත් නීතිය ඉදිරියේ සියලු දෙනා සමානය යනුවෙන් මූලධර්මයක් මේ පීතෘ මූලික සමාජය තුළ නාමිකව පවත්වාගෙන යයි. "නීතිය ඉදිරියේ සමානත්වය සැබවින්ම සමානත්වය නොවේ. කාන්තාව නීතිය ඉදිරියේ පමණක් නොව පුරුෂයින්ගේ සමානයි වනු දැකීම අපට උවමනාය" (ලෙනින්, 1983, 108). යනුවෙන් කාන්තා විමුක්තිය ගැන ලෙනින් පවසා තිබේ. කාන්තාවට පුරුෂයා හා සමාන අයිතිවාසිකම් නැති බවට උදාහරණ වශයෙන් පුරුෂයාට තම සිරුර පාලනය කිරීමට නීති ක්‍රමය තුළ ඉඩක් නිර්මාණය වී තිබුනද, කාන්තාවට මේ පීතෘ මූලික නීති ක්‍රමයෙහි එම අවස්ථා නැත. "ලින්ඩා ජෙන්සa (Linda Gennes) දක්වන්නේ මීට හොඳම නිදර්ශකය ගබ්සා කර ගැනීමේ අයිතිය සීමා කරන නීති මේ පීතෘ මූලික ක්‍රමයෙහි පැනවී තිබීමයි"(Marga, 1977, 101).

## 12. පිතෘමූලික දිශානතීන් විදහාදක්වන මාධ්‍යය හා රූපවාහිනි නාට්‍යය කාලාව

දිනපතා පුවත්පත්වල ස්ත්‍රී පිටුවක් වෙනම තිබේ. ස්ත්‍රී සගරා, ස්ත්‍රී චිත්‍රපට, රූපවාහිනියේ හා ගුවන් විදුලියේ වැඩසටහන්, ලියතඹරා, වනිතා විත්ති ආදී වශයෙන් නිමක් නැති අවකාශ, ගැණු ගති, උතුම් කාන්තා ගුණ, සැබෑ ස්ත්‍රිය, චපල ස්ත්‍රිය, වදක භාර්යාව ආදී සෑම අර්ථයක්ම, හැම සංකල්පය රූපයක්ම ෂප්ටෑ එකක් ලෙස අපට සම්පාදනය කරන්නේ ජනමාධ්‍ය විසිනි. එහෙත් පිරිමින් සඳහා මෙයාකාරයෙන් අවකාශ බෙදා වෙන් කර නැත. පුවත්පත්වල "පිරිමි පිටුව" කියා දෙයක් නැත. සිනමා අතිරේකයේ "පිරිමි සිනමාව" කියා දෙයක් නැත. ඊට හේතුව අප මනුෂ්‍ය හා මානුෂික වශයෙන් සළකන හැම දෙයක්ම අවිඥානිකවම පුරුෂ කේන්ද්‍රීය වීමයි.

මෙපමණක් නොව රූපවාහිනිය හරහා නිරූපණය වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව ද, කාමෝද්දීපන රචනා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගැන අවධානය යොමු වී තිබේ. ඒ සියල්ලෙන් පෙනී යන කරුණක් වන්නේ ගැහැණුන්ගේ පහත්භාවය පිළිබඳ පණිවුඩය ඉදිරියට ගෙන යන බවයි. ඒ අනුව පීතෘ මූලික ක්‍රමය තුළ පිරිමින් වැඩි වරප්‍රසාද, අයිතිවාසිකම් භුක්ති විඳින බවයි.

"කාන්තාවට ඇති පීඩනය සමාජයේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික ව්‍යුහයෙහි මුල් බැස ගත්තකි. එම නිසා ජන මාධ්‍ය මේ කාන්තා පීඩනය ස්ථම්භගත කරන අතර, ජනමාධ්‍යයෙන් ස්ත්‍රීභාවය හා ගෘහාශ්‍රිතභාවය යන සංකල්ප තුළ කාන්තාවන් තවදුරටත් වහල්භාවයේ හිරකර තැබීමට යත්න දරණ බාධක වශයෙන් දැක්වේ. කාන්තාව මේ සංකල්පවල එල්බ සිටීම නිසා දරුවන් සමාජීයකරණයේදී මේ අදහස් ඔවුන් වෙත සම්ප්‍රේෂණය වීම සිදු වේ. ජන මාධය ආකෘති ඉදිරිපත් කරයි"(ගුණතිලක, 1985ල 169).

"ඉගෙනීම හා අධ්‍යාපනය විධිමත් වූ දා පටන් මුළුමහත් දැනුම් ක්ෂේත්‍රයෙහි පාලනය පිරිමින් විසින් සියතට ගෙන ඇත. දැනුම බිහි කිරීමෙහි ලා පිරිමින් අතට පත් ආධිපත්‍ය නිසා කාන්තා දැනුම හා අත්දැකීම්, ඔවුන්ගේ නිපුණතා හා ප්‍රාර්ථනා ද අන්තයටම හීන වී තිබේ"(හාසින්, 1993ල 14). මේ අනුව පිරිමි ආධිපත්‍යයෙන් යුතු දැනුම හා අධ්‍යාපනය මගින් පීතෘ මූලික දෘෂ්ටිය බිහි කරනු ලැබීමත්, පවත්වාගෙන යාමත්, චිරස්ථායි කිරීමත් කරනු ලැබේ. ඒ අනුව රටක පවතින මේ ව්‍යුහය තුළම කාන්තාව අධ්‍යාපනය අතින් ඉදිරියට පැමිණීම සිදු ව තිබුනත්, ඔවුන් පුරුෂ මූලික දෘෂ්ටිය ඉදිරියට ගෙන යන බවට තර්ක කළ හැකිය. ඒ කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ සාක්ෂරතා වර්ධන වේගය මහා බ්‍රිතාන්‍යය වැනි දියුණු රටවලට වඩා වැඩි බව පිළිගත යුතුය. එසේ වූවත් ගැහැණුන් අධ්‍යාපන මට්ටම හා ඔවුන්ගේ රැකියා තත්ත්වය අතර නියත රේඛාමය සම්බන්ධයක් නැති අතර, රටේ ශ්‍රම සැපයුම හා රැකියා අවස්ථා අතර ඇති සමස්ත සංතුලනය ට වඩා ගැහැණුන් කෙරෙහි උග්‍ර ලෙස බලපා ඇත.

පීතෘ මූලික සමාජයක වැදගත් ආයතන සියල්ලේම බලය පිරිමින් සතු වුවද ගැහැණුන්ට කිසිම බලයක් නැතැයි හෝ කිසිම අයිතියක්, බලපෑමක් හා සම්පතක් නැතැයි හෝ ඉන් අදහස් නොවේ. කිසිම අසමාන සමාජයක් පීඩිතයන්ගේ සහභාගීත්වය නොමැතිව පවත්වාගෙන යාමට නුපුළුවන. ඔවුන්ගෙන් සමහර දෙනෙකුට යම් යම් පල ප්‍රයෝජන ලැබේ. උදාහරණ ලෙස ගැහැණු රැජිණියන්, අගමැතිණියන්, ජනාධිපතිනියන් වී පාලන බලය භුක්ති විඳීම දැක්විය හැකිය. එහෙත් මේ ක්‍රමය පුරුෂාධිපත්‍යයෙන් යුතුය යන කරුණ එමගින් වෙනස් නොවේ. මේ සම්බන්ධයෙන් ගර්ඩා ලර්නර්ගේ අදහස් වැදගත්ය. "පිරිමි හා ගැහැණු "වේදිකාවක්" තුළ ජීවත් වෙති. එම වේදිකාවේ පසුබිම සකස් කළේත්, එය සායම් කළේත්, පිරිමින් විසිනි.

එමෙන්ම පිරිමි නාට්‍ය ලියූ අතර දර්ශනය ද මෙහෙයවූහ. එහි ඉතා රසවත්, වීරෝධාර චරිත කොටස් තමන් වෙත පවරාගත් පිරිමින් ගැහැණුන්ට නොවැදගත් සහය චරිත පමණක් ලබා දුන්හ."(Lerner, 1986,56). විශේෂයෙන්ම ඇරිස්ටෝටල් කියා සිටියේ ගැහැණුන් පිරිමින්ට වඩා "ස්වභාවයෙන්ම පහත්" බවයි. එම නිසා ඔවුන් "ස්වභාවික වශයෙන්" පිරිමින් විසින් පාලනය කරනු ලබන බවයි. ස්ත්‍රීන් හා පුරුෂයන් අතර අසමානකම් පවත්නා බව සැළකිල්ලට ගන්නා අතර ඔහු, ඊට පිළියම් වශයෙන් කළ හැකි කිසිවක් නැතැයි කියයි. මක් නිසාද යත්, "දේශපාලන යුක්තිය" තිබිය හැක්කේ එක සමාන අය අතර පමණක් බැවිනි. එක සමාන රටවැසියන් වශයෙන්, පාලනය කිරීම හා පාලනය කරනු ලැබීම අතින්, එක සමාන කොටසක් හිමි අය අතර පමණක් බැවිනි. පුරවවැසි තත්ත්වයට ගැහැණුන් තල්ලු කර දැමීමෙන් පසු ගැහැණුන් වෙනුවෙන් ඉටු කළ හැක්කේ "රූපක යුක්තියක්" පමණක් යයි කියයි. එහෙත් රූපක යුක්තිය යනු කුමක්දැයි පැහැදිලි කිරීමට අසමත් වූ ඔහු, දේශපාලන යුක්තියට වඩා වෙනස් ගෘහස්ථ යුක්තියක් ගැන කථා කරයි.එලෙසම, සොබාදහම සමග අනන්‍ය විය යුතු යයි හා ස්වභාවික දේ යයි රූසෝ ඉදිරිපත් කළ තර්කයෙන් මග පෑදුනේ, ඔහු විසින් ගැහැණිය, අක්‍රීයව සියලු දේ ඉවසන, අනුන්ගෙන් යැපෙන, පතිදම් රකින, අවිචාරශීලී නැතහොත් අර්ධ විචාරශීලී, සංවේදීතාවයෙන් යුතු හා කරුණාවෙන් අනුන්ට සළකන තැනැත්තියක ලෙස පිළිගනු ලැබීම කරාය. මේ ලක්ෂණ සියලු ගැහැණුන් දේශපාලනයෙන් අයින් කර දැමීමට ඉවහල් වූවක් විය. රූසෝගේ න්‍යායන්හි ස්ත්‍රීන්ගේ ස්වභාවය ඇගේ ප්‍රජනන කාර්යය සමග බැඳී තිබෙන්නකි. සමානත්වය හා නිදහස නමැති උත්තුංග පරමාර්ථ පිළිබඳ දාර්ශනික අදහස් හැඩ ගැසීමට ඉදිරිපත් වූ පුද්ගලයාම, "ස්වභාවික පිළිවෙළ" රැකගත යුතුය යන යන තර්කය උඩ ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ධූරාවලී බෙදීම, යුක්තිසහගත කිරීමට උපකාරී වීම, වටහා ගත නොහැකි ප්‍රතිවිරෝධතාවකි.

ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය අතරෙන්, කීකරු විය යුත්තේ, අවනත විය යුත්තේ, ගැහැණිය යැයි ඔහු තරයේම පවසයි. දෙවියන් වහන්සේ විසින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම "සීමිත අනුරාගී ආශාවන්" ගෙන් සම්පන්න කරනු ලැබ ඇති බැව් පිළිගන්නා අතර, රූසෝ කියන්නේ, ඒවා දමනය කර ගැනීම සඳහා, පිරිමියාට විචාර බුද්ධියද, ගැහැණියට විනීතභාවයද, ප්‍රධාන කොට ඇති බවයි. මීට සමගාමීව ආසියානු සිතුවිලි කිසි ලෙසකින්වත් බටහිර සිතුවිලිවලට වඩා වෙනස් නොවේ. පීතෘ මූලික චින්තන ක්‍රමය හැම තැන ඒකාකාරය. ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ එකම සංකල්පය ප්‍රදේශ හා රටවල් හරහා පැතිරෙයි. එමගින් රැකගනු ලබන ඒකාකාරත්වයේ ප්‍රතිඵලය වශයෙන් සමහර විට එක සමාන පාරිභාෂික වචනමාලා තුළින් එක සමාන මත පළ කරනු ලබයි. හින්දූ නීති සම්පාදක මනු, ගැහැණියගේ හැසිරීමේ, විශේෂ විලාසයන්ගේ, බුද්ධියේ හා හොඳ නරක පිළිබඳ අවබෝධයෙහි පහත්කම (හීනතාව) ගැන ද, දුෂ්ටවූත් රාගාදී ආශාවලින් පිරුණාවූත් ඇගේ සහජ ස්වභාවය ගැනද, සවිස්තර වශයෙන් තම අදහස් නොවළහා ප්‍රකාශ කොට ඇත.

අවසාන වශයෙන් ඔහු ඇගේ දේශපාලන අසමත්කර ගැන සඳහන් කරයි. ඔහුගේ මතය අනුව රාජ්‍ය රහස් බාර දීමට ගැහැණු සුදුසු නොවෙති. " රජු වැදගත් රාජ්‍ය කටයුතු ගැන මනුගේ උපදෙස් සොයන අවස්ථාවලදී ඔවුන් සිටින තැනින් සියලු ගැහැණුන් ඉවත් කරන ලෙස ඔහු රජුට අවවාද කරයි. මක් නිසාද යත්, උසස් මට්ටමේ රහස් ගැහැණුන් විසින් හෙලි කළ හැකි බැවිනි."(මනු ඩසසථ 149-50). නෛතික පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ඔහු දරන මත වලද එම සංකල්පයම ගැබ් වී ඇත. "තණ්හා ආශාවලින් තොර එක පිරිමියෙකු සාක්ෂිකරුවෙකු වශයෙන් පිළිගත හැකිය. එහෙක් පවිත්‍ර ගැහැණුන් රැසක් වුවද එසේ පිළිගැනීමට නුපුළුවන. මක් නිසාද යත්, ඔවුන්ගේ අවබෝධය චපල විය හැකි බැවිනි" (මනු viii: 77).

"ග්‍රීකවරුන් විසින් හේතුධර්මතා,විචාරබුද්ධිය,දේශපාලනයේ උසස්ම ප්‍රකාශනය ලෙස සළකන ලදී. ලිබරල්වාදය හා ප්‍රබුද්ධත්වය පිළිබඳ කතිකාවේදී හේතුධර්මතාව අළුත් මගක් ගත්තේය. ප්‍රබුද්ධත්ව කතිකාවේ ද්විවිධත්වය, එහි පිරිමි සහ ගැහැණු ස්වභාවය මින් නිශ්චය වේ. පැහැදිලිවම එය ස්වභාවයෙන් අසමමිතික වෙයි. විචාරබුද්ධිය කෙරෙන් ගැහැණුන් බැහැර කළ මේ ද්විත්වභාවය නිසැකවම ගැහැණුන් දේශපාලනයෙන් බැහැර කරලීම සමගද සම්බන්ධය". අවිචාරත්වය සමග ගැහැණුන් අනන්‍ය (සම්බන්ධ) කිරීමද, සම්භාව්‍ය ග්‍රන්ථවල ගැහැණියගේ ඊනියා "ස්වභාවික ගතිගුණ" ගැන කතා කිරීමද, කරණ කොටගෙන, ගැහැණියගේ කාර්යභාරය කුමක්ද යන්න සම්බන්ධයෙන් බරපතල ප්‍රශ්න උද්ගත වී ඇත. පුද්ගලිකත්වය මගින් ඇය වෙත පැවරිය යුතුව තිබුණු සහජ කුසලතා රැසක් ඇගෙන් පැහැර ගනු ලැබ ඇත. දේශපාලන සහභාගීත්වය එබඳු කුසලතාවලින් එකකැයි තර්ක කළ හැක. එසේ වුවද, ස්ත්‍රීන්ගේ ස්වභාව ලක්ෂණ මේ ලෙස හඳුන්වන්නේ කෘත්‍රිම අර්ථ නිරූපණයෙහි යෙදෙන පිරිමින් පමණක් නොවේ.

සංස්කෘතික ස්ත්‍රීවාදීහු ද, අක්‍රියව සියලු දේ ඉවසා දරා ගැනීම, සංවේදීතාවෙන් යුතු වීම, කරුණාවෙන් අනුන් රැක බලා ගැනීම හා පෝෂණය කිරීම සහ තරගකාරී නොවීම ආදී, "ගැහැණු සද්ගුණ" ස්ත්‍රීන්ගේ ස්වභාවික ගතිගුණ ලෙස වර්ණනා කොට ඇත්තාහ. මේ හේතු කොටගෙන යළිත් වරක් අන්තරාදායක ද්විධාකරණයන් සැලකිල්ලට යොමු කරනු ලැබ ඇත. මෙවර අතිමූලිකවාදී එකම අච්චුවේ සම්ප්‍රදායික ලක්ෂණ චිරස්ථායි කිරීමේ වරද පැවරෙන්නේ ස්ත්‍රීවාදීන්ම මතය. එසේ වුවද මෙවර යෝජිත ගැහැණු සාරධර්ම මගින් අදහස් කෙරෙන්නේ ගැහැණුන්ගේ තත්ත්වය උසස් කරලීමයි. එහෙත් විවාදයේ සැලකිල්ල යොමු කරනු ලැබ ඇත්තේ ඔවුන්ගේ යහපත් ගුණාංග කෙරෙහි නොව තවමත් සමාජමය වශයෙන් ගොඩනගනු ලබන ලිංග භේදය මත පදනම් වූ ද්විධාකරණයන් කෙරෙහිය. මේ ගුණාංග තිබෙන්නේ ගැහැණුන්ට පමණක් යයි තර්ක කිරීමෙන් හා එම ගුණ යහපත්කම්වල ඒකාධිකාරී අයිතිය ගැහැණුන් අත පමණක් තබා ගැනීමෙන් අප කරන්නේ එබඳු ගුණාංග සංවර්ධනය කර ගැනීමෙන් පිරිමින් සදහටම වළක්වාලීමයි.

පිරිමියා කිසි දා වෙනස් නොවන්නේය, එම නිසා උවටැන් කිරීමේ බර හැමදාම ගැහැණුන් විසින් දැරිය යුතුය යන්න, දැනට පවත්නා ලිංග භේද තත්ත්වය අභියෝගයට ලක් නොකොට, එලෙසම පැවතීමට ඉඩ දීම සඳහා වන, පිළි ගතමනා තර්කයන් නොවේ. සංස්කෘතික ස්ත්‍රීවාදීන් මෙන්ම දේශපාලන න්‍යායාචාරීන්ද විසින් අදහනු ලබන, ඒ හා සමානව අනතුරුදායක තවත් උපකල්පනයන් වෙයි. එනම්, ආක්‍රමණය, තරගකාරීත්වය, පෞද්ගලිකත්වයද, ඒ සමගව විචාර බුද්ධිය හා තර්කනය, නායකත්වය හා විනිශ්චය කිරීමේ ශක්‍යතාවද ගුණාංග වේය යන්නයි. ඒවා ගැහැණුන්ට යෝග්‍ය නොවේය යන්නයි. ගැහැණුන් හා පිරිමින් අතර වෙනස වෙන් කොට දක්වන මේ ගුණාංග වැඩි වැඩියෙන් අවධාරණය කිරීමත්, ඒවා කිසිදා වෙනස් නොවන ස්ථිතික දේ ලෙස හා ගැහැණුන් දේශපාලනයෙන් බැහැර කිරීම සනාථ කරන පැහැදිලි කිරීම් නොවූවත් ඒ ලෙස සළකනු ලැබීමත්, දේශපාලන බලය පිළිබඳ අළුත් න්‍යායයන් මුදුන් පත් කර ගැනීමට අපට කිසිසේත් ඉවහල් නොවේ.

අතීත සමාජය තුළ කාන්තාවගේ කාර්යභාරය ලෙස සැළකුනේ පවුලේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සැපයීමයි. සැමියාගේ හා දරුවන්ගේ ආහාරපාන, සෞඛ්‍ය කටයුතු ඇයට භාරවී තිබුණි. ආර්ථික කටයුතුවල නියැලීම ඇයට අයත් කාර්යයක් නොවුණි.එහෙත් නූතන කාන්තාවගේ තත්ත්වය අද වෙනස්වීමකට ලක් වී ඇත. පැරණි සමාජය තුළ පවුලේ යැපීම සඳහා කටයුතු කිරීම පිරිමියාට පමණක් පැවරී තිබුනද අද සමාජය තුළ කාන්තාවන් පුරුෂයින් හා සම සමව ආර්ථික කටයුතුවල නියැලේ.

ඊට අමතරව ගෘහස්ථ වගකීම්ද ඉටු කරයි.නමුදු මෙහි නාට්‍යවල පෙනී සිටින බොහෝ තරුණ හෝ මැදි වයසේ කාන්තා චරිත රැකියාවන් නොකරන අය වෙති. සැමියා රැකියාවට යන විට බෑගය දොරකඩට ගෙනවිත් දීමත් රැකියාව නිම කර පෙරළා ගෙදර පැමිණෙන විට සිනහමුසු මුහුණෙන් ඔහුව පිළිගැනීමත් ඇය නිරූපණය කරනු ලබයි. පිරිමින් ඉහළ අධ්‍යාපනයක් ලබා ඉහළ රැකියාවල නියුතු වන අතර කාන්තාවෝ අධ්‍යාපනයෙන් ඉහළට නොගොස් රැකියාවක් නොකොට නිවසට වී ස්වාමි පුරුෂයාගේ සුභසාධනය සඳහා ඇප කැපවී සිටී. නිදසුන් ලෙස ජාතික නාලිකාව - සෙව්වන්දි, ලියතඹරා දියසුළිය, වැනි , ටෙලිනාට්‍ය ද සිරස නාලිකාව මහගෙදර,ප්‍රවීණා වැනි , ටෙලිනාට්‍ය මේ යටතට ගත හැකිය.

ඒ අතර රැකියාවන්වල නිරත වන කාන්තාවන් සිටින ටෙලිනාට්‍ය ස්වල්පයක් විය. එහෙත් මේවායේ කාන්තාවෝද විධායක ශ්‍රේණියේ රැකියා කරන්නෝ නොවෙති. ලිපිකරු වෘත්තිය, යතුරු ලේඛිකා වැනි විධායක ශ්‍රේණියට ගත නොහැකි රැකියා වෙති. උදාථ කළු හංසයෝ, දෙනුවර මැණිකේ වැනි නාට්‍ය ප්‍රධාන චරිත එවන් අවස්ථාවලට උදාහරණ වේ. නෙස්ටමෝල්ට් වැනි දැන්වීම් තුළ දරණ කාන්තාවන් පෙන්නුම් කිරීමට උත්සහ ගෙන තිබුණි. එහෙත් සමස්ථය ගෙන බැලූ විට එය නොදැනෙන තරම්ය. රැකියාවක් කළද නොකළද ආහාර පිසීමට අමතරව තවත් අතිමහත් කටයුතු රාශියක් ටෙලිනාට්‍ය, ආදියේ කාන්තාවට පවරා තිබුණි. නිවසේ සාමාජිකයන්ගේ රෙදි සේදීම :රින්සෝ, සන්ලයිට්), ගෙදර ශුද්ධ පවිත්‍ර කිරීම (සෙව්වන්දි නාට්‍ය), වැසිකිළි සේදීම (හාපික්), කඩේ යාම (පෙප්සි, මෙගා, ලා. ඕ. පී.), දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, සෞඛ්‍ය කටයුතු ආදී වශයෙන් කාර්යයන් රාශියක් ඉටු කරන කාන්තාවන් ඉහත කී වැඩසටහන් තුළින් දක්නට ලැබේ. මේවාට පිරිමින් යොදා තිබුනේ නැතහොත් පිරිමින් සහභාගී කරගෙන තිබුනේ ඉතා අල්ප වශයෙනි. රෙදි සෝදන සබන් වර්ග පිළිබඳ වෙළඳ දැන්වීම් 100 ක් කාන්තාවන් යොදා නිර්මාණය කර තිබුණි. සමහර සබන් දැන්වීම්වල නිවැරදිව ඇඳුම් සෝදා නොතිබීම නිසා කාන්තාවන් සැමියාගෙන් බැණුම් අසන අවස්ථාද ඇතුළත් කර තිබුණි. කෙටිකතාව නාට්‍යයේ මුදලාලි විටෙක පවසන්නේ "අම්මෙක් අප්පෙක් තියා අඩුම ගානෙ ගැහැණියෙක්වත් හිටියද හැළියක් වළඳක් ලිපේ තියාගන්න" යනුවෙනි. ඔහුගේ දෙබසේ ව්‍යංග ාර්ථය අනුව බිරිඳ යනු පිරිමියාගේ වහලියකි. එක් දැන්වීමක පසුබිමින් කියවුනේ "පරම්පරා ගණනක් මව්වරුන්ගේ තේරීම" යනුවෙනි.

නම් වශයෙන් වෙන වෙනම සඳහන් කිරීම අනවශ්‍ය ලෙස වාර්තාව දිගු කිරීමකි. මාගේ විශ්ලේෂණයට භාජනය වූ වැඩසටහන් අතිබහුතරයක කාන්තාව සැමියාගේ, දරුවන්ගේ කටයුතු ඇතුළු ගෙදර දොර අනෙකුත් සියලු කටයුතුවල නිරත වනු නිරූපනය වුණි. මේ කටයුතුවලට ඇයට අන් අයගේ සහයෝගය ලැබෙනු පෙන්වූයේ ඉතා අල්ප වශයෙනි. සහයෝගය දෙන චරිතය තුළද බොහෝ විට සිටියේ දියණිය හෝ නැගණියයි. ඇයද කාන්තාවකි. නිදසුන් ලෙෂ හෝඩුවාව නාට්‍ය, සෙව්වන්දි නාට්‍ය, මැලිබන් කිරි දැන්වීම රැකියාවක් කළද, නොකළද රූපවාහිනියේ නිරූපිත කාන්තා චරිත බොහොමයකට සම්ප්‍රදායික කාර්යභාරය පැවරී තිබුණි. නෙස්ටමෝල්ට් දැන්වීමේ විධායක ශ්‍රේණියේ රැකියාවක නියුතු කාන්තාව රැකියාව අවසන් කර නිවසට පැමිණෙන්නේ එළවළු මල්ලද රැගෙනයි. ඊට අමතරව දරුවන්ගේ අධ්‍යාපන වැඩ කටයුතු සොයා බැලීමත් ඒ අයට බීමට නෙස්ටමෝල්ට් සාදා දීමත් ආදී දහසකුත් රාජකාරී ඇයට පැවරී තිබේ. ඉහළ රැකියාවන් ලබා දුන් ඇය පැරණි රාජකාරීවලින් මුදවාලීමට දැන්වීම් නිර්මාණකරුවන් කැමති වී නැත. සම්ප්‍රදායික කාන්තාවෝ නිවෙසින් පිට ර කියාවක් නොකළ අය වෙති. එහෙත් නූතන සමාජයේ කාන්තාවෝ විශේෂයෙන් බොහෝ ග්‍රාමීය තරුණියෝ මෙන්ම නාගරික කාන්තාවෝද පවුලට ආදායම් මාර්ගයක් සලසා ගැනීම පිණිස ආර්ථික කටයුතුවල නියුක්ත වෙති. කාන්තාවන් රැකියාවන් කිරීමට පිවිසුණු මුල් කාලය තුළ ඇය වැඩි වශයෙන් නිරත වූයේ ගුරු වෘත්තිය, ලිපිකරු වෘත්තිය, යතුරු ලේඛිකා වැනි රැකියා ක්ෂේත්‍රවලය. නමුත් පසුගිය දශක කිහිපය තුළ රටේ ඇති වූ ආර්ථික වෙනස්වීම්ද විශේෂ බලපෑමක් කොටගෙන කාන්තාවන්ගේ ර කියා ඉඩකඩ පුළුල් විය. අද ඇය ගුරු, ලිපිකරු, යතුරු ලේඛිකා වැනි සීමිත රාමුවෙන් ඉහළට ගොස් විවිධ රැකියාවන්හි නිරත වේ.

ආහාරපාන මිලදී ගැනීම ඒවා පිසීම පමණක් නොව සැමියාගේ හා දරුවන්ගේ පරිභෝජනය සඳහා කෑම මේසයට යැවීමද භාරවී තිබුණේ කාන්තාවටය. මේ තත්ත්වය ටෙලි නාට්‍ය (උදාඃ සෙව්වන්දි නාට්‍ය) හා වෙළඳ දැන්වීම් බොහොමයක දක්නට ලැබුණි. රයිස් ඇන්ඩ් ස්පයිස් දැන්වීම මීට වෙනස් ආකාරයකින් නිරූපණය විය. නිවසට එන තරුණියකට (දුරකතන ඇමතුමක් ලබා ගැනීමට) රසවත් කෑම වේලක් සාදා දෙන්නේ එම නිවසේ සිටින තරුණයා විසිනි. එහෙත් මෙය බහුතරයක් අතරින් එක දැන්වීමක් පමණි. කාර්යභාරය අතින් මෙලෙස කාන්තාව පැරණි තත්ත්වයෙන් නිරූපණය කරනවාට අමතරව ටෙලිනාට්‍ය, ප්‍රචාරයන් තුළින් ඇය තවමත් සම්ප්‍රදායික ලාංකික කාන්තාවගේ ඇඳුම සාරිය මෙන්ම රෙද්ද සහ හැට්ටය විය.

නමුත් වර්තමාන සමාජයේ කාන්තාවන් මේ සම්ප්‍රදායික ඇඳුමට කොටු වී නැත. ඇය සාරියට අමතරව පහසුව තකා වෙනත් ඇඳුම්වලට හුරුපුරුදු වී සිටී. (විශේෂයෙන් තරුණියන්) එහෙත් දැන්වීම්, ටෙලිනාට්‍ය, ප්‍රවෘත්ති ප්‍රචාර බොහෝමයක ඇයට අන්දවා තිබුණේ පැරණි ඇඳුමයි. ඒ තුළින් මේ නිර්මාණකරුවන් උපකල්පනය කරනවා විය හැක්කේ කාන්තාව යනු නවීකරණයට භාජනය නොවිය යුතු පැරණි සංස්කෘතිය ඉදිරියට ගෙන යා යුතු තැනැත්තියක ලෙස විය යුතු බවයි.

මේ තත්ත්වය සම්පූර්ණයෙන්ම වාගේ වෙළඳ දැන්වීම් යටතට ඇතුළත් කළ හැක. වෙළඳ දැන්වීම් වල නිරූපිත චරිත අතරින් කාන්තාව සුවිශේෂී ලෙස භාවිතා නොකරන භාණ්ඩ වෙනුවෙන් ඇගේ සිරුර යොදා වෙළඳ දැන්වීම් නිර්මාණය තුළින් ඇය තවත් වෙළඳ භාණ්ඩයක් බවට පත්වන බවත් පෙනේ. මේ තත්ත්වය රූපවාහිනී මාධ්‍ය තුළ මෙන්ම වෙනත් ජන මාධ්‍ය තුළත් පොදුවේ දැකගත හැකි තත්ත්වයකි. . උදාඃ ලංකා ටයිල්ස් දැන්වීම තුළ ටයිල්ස් ඇල්ලූ ගෙබිම මත නටන තරුණියන් පෙන්වීම, ලොතරැයි දැන්වීම් තුළ කාන්තාවන්ගේ නැටුම්, ක්‍රීඩා ආදිය ඇතුළත් කිරීම. තවද සැම්සුන් වායු සමීකරණ දැන්වීම, ට්‍රැක්ටර් දැන්වීම, බැටරි වර්ග දැන්වීම වශයෙන් මා හට දක්නට ලැබුණු දැන්වීම්වලින් සැළකිය යුතු ප්‍රමාණයක් මේ ආකාරයේ දැන්වීම්වලින් කාන්තාව වෙළඳ භාණ්ඩයක් බවට නිරූපණය කර තිබුණි.

මා ඉහත සඳහන් කළ මේ භාණ්ඩ වර්ග කාන්තාවන්ට සුවිශේෂ සමීප සම්බන්ධතාවයක් දක්නට නොලැබෙන භාණ්ඩ වෙයි. කාන්තාවන්ගේ රූපය යොදා ගැනීමෙන් ඇය තුළින් ප්‍රේක්ෂක ආකර්ෂණයක් බලාපොරොත්තු වනවා විය හැක. එහෙත් සත්‍ය තත්ත්වය නම් දැන්වීමකින් භාණ්ඩ ප්‍රචාරණය සඳහා කාන්තාවන් යෙදීම අත්‍යවශ්‍ය නොවන බවයි. කාන්තාවන් නොයොදා සකස් කළ භාණ්ඩ ප්‍රචාරක දැන්වීම් ජනතාව තුළ ජනප්‍රිය වනු දක්නට ලැබේ. උදා: නළුවන්, ක්‍රීඩකයන් යොදා ගන්නා දැන්වීම්. උදා: කීල්ස් සොසේජස්, ලයිෆ්බෝයි සබන්, රෙඩ්කව් කිරි. නමුත් මේ දැන්වීම නිර්මාණය කරන අය තුළ පවතින්නේ සම්ප්‍රදායික අදහස්ය.

රූපවාහිනිය තුළ විකාශනය වනු ලබන වැඩසටහන්වල රඟපානු ලබන බොහෝ කාන්තාවන් රූමත් අය වේ. මේ තත්ත්වය ටෙලිනාට්‍ය, වෙළඳ දැන්වීම්, ප්‍රවෘත්ති ආදී ඕනෑම වැඩසටහනකට අදාළ වේ. පිරිමි චරිත තුළ රූමත්කම එතරම් ඉස්මතු නොවේ. ඔවුන් තුළින් කාර්යශූර බව, බුද්ධිමත් බව, ශක්ති සම්පන්න බව ප්‍රේක්ෂකයාට ගෙන එයි.එහෙත් කාන්තාව තුළින් ඉහත ලක්ෂණ මතු නොකර හුදෙක් රූපය පමණක් ඇය තුළින් ඉස්මතු කිරීම නූතන කාන්තාවට කරන අගෞරවයකි.

අපේ සමාජය පැරණි කාලයේ සිට බලාපොරොත්තු වූයේ කට ඇති පුතුන් සහ රුව ඇති දියණියන් බිහි කිරීමටත්ය. එමගින් වක්‍රව අඟවන්නේ පුතනුවන්ට කට දී (පෞරුෂත්වය) ඔවුන් ඉදිරියට යැවීමටත්, දියණියන්ට රුව උරුමකර දී පිරිමින්ගේ ලිංගික ආකර්ෂණයට ලක් කිරීමත්, මනසට ප්‍රිය දසුනක් බවට පත් කිරීමත්ය. මෙය හුදෙක් පුරුෂෝත්තමවාදී අදහසකි. සෙව්වන්දි ටෙලි නාට්‍යයේ මව පුතාට විවාහ යෝජනාවත් ගෙන එමින් පවසන්නේ "ඒ ගැහැණු ළමයා උපාධි ගුරුවරියක්. හොඳ දෑවැද්දකුත් හම්බ වෙයි. ගෑනු ළමයත් හරියට ඉටි රූපයක් වගෙයි." මේ ටෙලිනාට්‍යවලට ඇතුළු කර ඇති කාන්තාව පිළිබඳ සම්ප්‍රදායික අදහස්ය. බොහෝ ටෙලිනාට්‍යවල කාන්තා චරිත මේ ආකාරයට රුව පමණක් ඉස්මතු වන ලෙස ගොඩනගා තිබුණි. එම නාට්‍යවලම සමාජයේ ඉහළ රැකියාවල නියුක්ත වන, දක්ෂ, බුද්ධිමත්, කාර්යශූර, ශක්තිවන්ත අය ලෙස නිරූපණය වෙද්දී කාන්තා චරිත සු-කොමළ, විනීත, අහිංසක එකයක ලෙස නිරූපණය කර තිබුණි. ටෙලිනාට්‍යවල කාන්තා චරිත බොහෙ-ර්මයක් මා හට දක්නට ලැබුණේ මේ ආකාරයෙනි.මේ පිළිබඳව සාකච්ඡා කරන විට වෙළඳ දැන්වීම්-වලට විශේෂ වැදගත්කමක් හිමි වේ. ඒ මන්ද යත් බොහොමයක් දැන්වීම් කාන්තාවගේ ලස්සන පිළිබඳ සම්ප්‍රදායික අදහස් අලෙවියට තබා තම නිෂ්පාදන ජනප්‍රිය කරගැනීමට උත්සහ කරයි. කාන්තාව යොදා විකාශනය කරන දැන්වීම්වලින් විශාල ප්‍රමාණයක් කාන්තාවගේ රුව ලස්සන කර ගන්නා ආකාරය පෙන්වන දැන්වීම් වේ. කණකර ආභරණ (වෝග් ජුවලර්ස්, ස්වර්ණමහල් ජුවලර්ස්), සබන් වර්ග (ලක්ස්, රෙක්සෝනා), මුහුනේ අතපයේ තවරන ක්‍රීම් වර්ග (ලක්මි, ෆෙයාර් ඇන්ඩ් ලවුලි), හිස සෝදන ෂැම්පු වර්ග (සන්සිල්ක්, කුමාරිකා), කොණ්ඩය කළු කරන ඩයි වර්ග (ගොඩ්රිජ්), තොල්වල තවරන ආලේප, හිසට ගල්වන තෙල් වර්ග (ලින්ක් කේශා) ආදී වශයෙන් කාන්තාවට ලස්සන ය හැකි පාරිභෝගික භාණ්ඩ දැන්වීම් රූපවාහිනී තිරය තුළ ඉතා බහුල වශයෙන් විකාශනය විය. "කාන්තාවක් නම් අනිවාර්යෙන් ලස්සනට සිටිය යුතුයි" යන සම්ප්‍රදායික ආකල්පය වෙළඳ දැන්වීම් නිෂ්පාදකයින් විසින් භාවිතා කරනු ලබයි.

වෙළඳ දැන්වීම්වලින් නිතරම අසන්නට ලැබෙන්නේ කාන්තාව යනු ලස්සන සිනිඳු සමක් ඇති සුකොමළ අයෙකු බවයි. "ඇගේ සිනිඳු සම පිරියෙන් බබළයි" මේ සබන් දැන්වීමක පසුබිම් කථනයයි. බොහොමයක් සබන්, ෂැම්පු හා ආභරණ දැන්වීම්වලදී ඇගේ ශරීරයේ යම් යම් ප්‍රදේශ අඩනිරුවත් කෙට පෙන්වීමටද උත්සහ ගෙන තිබුණි.

අද සමාජය තුළ කාන්තාවන් විවිධ ජයග්‍රහණ ලබා ඇත. පිරිමින් හා සමානව සමාජය තුළ ඉදිරියට ගමන් කරයි. එහෙත් මේ දැන්වීම්, ටෙලිනාට්‍ය ආදියෙන් ඇගේ ජයග්‍රහණ, බුද්ධිමත්භාවය, කාර්යශූර බව නිරූපණය කරනවා වෙනුවට ඉහත කී පරිදි රූපය පමණක් ඉස්මතු කිරීමට උත්සහ කරයි. අපේ පැරණි සාහිත්‍යය, සන්දේශ කාව්‍යවලද කාන්තාව නිරූපණය වූයේ මේ ආකාරයෙනි. ලස්සන කාන්තාවන් කවියන්ට මී පැණි මෙන් විය. ඇගේ දක්ෂතාවයන් මේ පැරණි උදවියට මුණගැහී තිබුනේම නැති තරම්ය. ඔවුන් විහාර මහා දේවී වැනි චරිතද ඉස්මතු කළේ ඇය අගනා පුතුන් රටට බිහි කළ නිසාය.ටෙලිනාට්‍ය, ආදී වැඩසටහන් තුළ කාන්තා චරිත බහුලව දක්නට ලැබේ. එහෙත් වැඩසටහන් නිර්මාණකරුවන් අවබෝධයකින් යුක්තව හෝ අවබෝධයකින් තොරව කාන්තාවට අවමාන ගෙන දෙන ආකාරයෙන් සිය නිර්මාණ සකස් කර ඇති බව පෙනේ. සෑම කාන්තා චරිතයක් කෙරෙහිම මෙවැනි තත්ත්වයන් දක්නට නොලැබුණද සමහර ටෙලිනාට්‍යතුළින්ද ඇය හැල්ලුවට ලක් කළ අවස්ථා දක්නට තිබුණි.

ඓතිහාසික සමාජය තුළ පවා කාන්තාව අවතක්සේරු කළ බව නිදසුන් මගින් පැහැදිලි කළ හැකිය. සමාජය තුළ පැරණි කල සිට තිබෙන "ගැහැණුන්ගේ නුවණ හැඳි මිටේ දිගයි" යන්න හුදෙක් ස්ත්‍රීන් යනු අඥාන ජන කොට්ඨාශයක් වශයෙන් අර්ථ දැක්වීමට ගත් උත්සහයකි. මේ තුළින් බලාපොරොත්තු වන්නට ඇත්තේ ගැහැණු මෝඩ ජාතියක් නිසා සමාජයේ හෝ පවුලේ කිසිඳු වගකීමක් දැරීමට, ඇය නුසුදුදු වන බවද එමෙන්ම ඇයට කිසි දිනෙක ඉදිරියට යාමට නොහැකි බවද ඉන් අඟවන්නට උත්සහ කර ඇතැයි සිතිය හැක. මෙවැනි උපහැරණ තුළින් පුරුෂයා විසින් ස්ත්‍රීන් යටපත් කර තැබීම සාධාරණීකරණය කරන්නට උත්සහ දරන්නට ඇත.

ජන වහරේ එන සිල්ගම හාමිනේගේ කතාවද මේ සඳහා තවත් නිදසුනකි. කරණවෑමියා ගෙදරට එන විට ගමරාළ ගෙදර නොමැති නිසා ඔහු හිස් අතින් ආපසු හරවා යැම නුසුදුසුයි සිතූ නිසා ගමහාමිනේ තම දිගු වරලස කරණවෑමියා ලවා කපාගත් බව මේ කතාවේ සඳහන් වේ.එසේම ජන වහරේ එන "එලොව ගිහින් මෙලොව ආවා" කථාවේ ගමරාළ ගෙදර නොසිටි වෙලාවක ගෙදරට ආ සොරෙකු මිය ගිය දියණිය ගැන වර්ණනා කර ඇය පිළිබඳ කියූ එලොව තොරතුරු නිසා ගමහාමිනේ රවටා ගෙදර තිබූ ධනය සොරා ගෙන ගොස් තිබේ.අතීත සමාජය තුළ කාන්තාව පිළිබඳව පැවතියේ මෙවැනි අදහස්ය.රූපවාහිනී තිරයේ දිග හැරෙන ටෙලිනාට්‍ය, නිර්මාණකරුවන් කාන්තාව පිළිබඳව තවමත් එල්බ සිටින්නේ මෙවැනි ගතානුගතික දෘෂ්ටීන්ගෙන්දැයි ඔවුන්ගේ නිර්මාණ බැලූ විට පෙනී යයි. විශ්ලේෂණයේ පහසුව තතා එබඳු කාන්තා නිරූපණයන් ආකාර කිහිපයකින් ඉදිරිපත් කෙරේ.

ටෙලිනාට්‍ය බොහෝමයක කාන්තා චරිත නිතරම සුළු දෙයකටත් කඳුළු සැලීමට සූදානම් කර තැබූ ඒවා විය. ඇය සුළු සිත් තැවිල්ලකටත් කඳුළු සලයි. බොහෝවිට තමාට එරෙහි වන බලවේගවලට මුහුණ දීම වෙනුවට අඬමින් බයාදු දූර්වල අයෙකු සේ කටයුතු කරයි. කෝපිකඬේ, සෙව්වන්දි, ලියතඹරා, හෝඩුවාව, දෙනුවර මැණිකේ, මේඝතරණ වැනි ටෙලිනාට්‍යවලද, ලොතරැයි, රක්ෂණ දැන්වීම්වලද කාන්තා චරිත මේ ආකාරයේ සුළු දෙයකට පවා කඳුළු සලන ඒවා විය. සමාජය තුළ එඩිතරව ප්‍රශ්නවලට මුහුණ දෙමින් නිවැරැදිව ක්‍රියා කරන කාන්තාවන්ට මේ ආකාරයේ ටෙලිනාට්‍ය චරිත තුළින් අපහාසයක් ගෙන දේ. සමස්ත කාන්තා පරපුර පිළිබඳ වැරදි චිත්‍රයක් දැන හෝ නොදැන මේ නිර්මාණ තුළින් ඉදිරිපත් කෙරේ.

කඳුළු සැලීමට මෙන්ම මේ කාන්තා චරිත සුළු දෙයකටත් තිගැස්සෙන, භය වන ආකාරයෙන් ගොඩනගා ඇත. එයද ඇගේ හැඟීම් එළිදරව් කිරීමට උත්සහ ගත් අවස්ථාවක් වේ. උදා: ලක්ෂපාන බැටරි දැන්වීමේ අඳුරේ සිටින විට පවුලේ සාමාජිකයන් අතරින් බළලෙකු පැනීමෙන් භය වන්නේ මව පමණකි. පියා හා පිරිමි දරුවන් බිය නොවන විට මෙහි මව පමණක් බිය වේ. මේ ආකාරයෙන් දැන්වීම් හා ටෙලිනාට්‍යවල පිරිමින් කඳුළු සලන, භය වන අවස්ථා විකාශනය වූයේ නැති තරම්ය. එසේම විකාශනය වූ ටෙලිනාට්‍යවල කාන්තාව යනු සුවඳට, ලස්සනට, බාහිර ඔපයට ආකර්ෂණය කරගත හැකි කොට්ඨාශයක් ලෙස නිරූපණය වනු දක්නට ලැබුණි. පිරිමින් ඇඟ ගල්වන සුවඳ විලවු-න්වලට, වාහනයේ ලස්සන පෙනුමට රැවටී, රැවුල කපා මුහුණේ තවරන ක්‍රීම්වලට කාන්තාවන් පිරිමින් පසුපස ඇදී එනු දැන්වීම්වලදී පෙනුනි. ඉහත විස්තර කළේ භෞතික දේවලට කාන්තාවන් රැවටෙන ආකාරයයි. මේ ආකාරයට බොහෝ ටෙලිනාට්‍යවල කාන්තාව පිළිබඳව පිරිමින් සඳහන් කරන දෙබස් තුළ ඇය පිරිමින්ට රවටා ගැනීමට පහසු කොට්ඨාශයක් ලෙස හැඳින්වීමක් කරයි.නිදසුන් ලෙස"කෙටි කතාව" නම් ටෙලිනාට්‍යයේ කඩේ මුදලාලිගේ දෙබසක සඳහන් වන්නේ "මිනිහෙක් වුනාම තමන්ගෙ ගෑනිට කන්න අඳින්න දීල ඇති කියන එක හරි නෑ.

ඔය වගේ අරුමෝසම් දේවල්වලින් ගෑණුන්ගෙ හිත ගන්න හරි ලේසියි.” ඔහු අරුමෝසම් දේ ලෙස හඳුන්වන්නේ සුවඳ විලවුන් හා සබන්ය. මෙය කුඩා ළමයෙකුට සීනී බෝල දී රවටනවා වැනි කතාවකි. කළු හංසයෝ නාට්‍යයේ එක් දෙබසක සඳහන් වන්නේ “ඔය හාදයා ජැන්ඩියට අඳින කඩවසම් ඉළන්දාරියා. බොහොම ලේසියෙන් ගෑණියෙක්ව දපනෙ දාගන්න පුළුවන්.” මේ උදාහරණ රාශියක් අතරින් තෝරා ගත් දෙකක් පමණි. මේ ආකාරයට ටෙලිනාට්‍යවල මෙවැනි දෙබස් තුළින් සමස්ත කාන්තා පරපුරම අභූත, බුද්ධිමත්ව කටයුතු නොකරන පිරිසක් ලෙස හැඳින්වෙයි. අඩුම වශයෙන් මේ දෙබස් තුළට “සමහර ගැහැණුන්” යනුවෙන්වත් යොදා තිබුනේ සමස්ත ස්ත්‍රීන් පිතෘමූලික දිශානතින් යාවත්කාලින කරමිනි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය
**සිංහල**


අතුකෝරළ, ඩී.ආර්. සහ අතුකෝළ, එච්. එන්. (2000). **අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා**:ශික්ෂා මන්දිර ප්‍රකාශන, නො. 35/11, මහල, මාර්කට්, බොරැල්ල, කොළඹ 08. ''අධ්‍යාපන'' 26 කලාපය.

ඇතුගල, ආර්. (1998). **සන්නිවේදන සිද්ධාන්ත න්‍යයාය ආකෘතිය හා ආකල්ප**: ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ඇතුගල, ආර්. (1998). **සංජානනය සහ සන්නිවේදනය දෘෂ්‍ය මාධ්‍ය පර්යේෂණය**: ඇම්.ඩී. ගුණසේන මරදාන.

අමරසූරිය , නිර්මලා. (1995) **විද්‍යා හා තාක්ෂණයෙහි නිරත ගැහැණු වෙනසක පැතිකඩ**: කාන්තා පර්යේෂණ කේන්ද්‍රය කොළඹ.

අලවත්තගේ , ප්‍රේමදාස. (2010) **ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රතිඵල සංග්‍රහය**: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

අල්විස් එම්,ජයවර්ධන කේ. (2001) **ස්ත්‍රීන් ඡන්ද බලයට කළ සටන**: කොළඹ සමාජ විද්‍යාඥන්ගේ සංගමය.

ආරියදාස , කීර්ති. (2004) **දේශපාලන විද්‍යාව න්‍යාය සංකල්ප මතවාද**: කර්තෘ ප්‍රකාශන.

උයන්ගොඩ , ජයදේව. (2018) **දේශපාලනය සහ දේශපාලන විද්‍යාව**: සමාජ විද්‍යාඥයින්ගේ සගමය,- කොළඹ 8.

උස්වත්තේ , ආරච්චි, ජිද්‍රෙක්. (2007) **සමාජ ආර්ථිකය හා අධ්‍යාපනය**:පන්නිපිටිය ස්ටැඩ්ෆර්ඩ් ලේක් (පුද්) සමාගම.

එංගල්ස්, ෆෙඩ්රික්. (1979) **පවුල පෞද්ගලික දේපල හා රාජ්‍ය ඇති වූ සැටි**: අනුවාදක දැදිගම .රුද්‍රිගු ප්‍රගති ප්‍රකාශන මොස්කව්.

කුමාර, රන්ජිත් ඒ.ඩී. (1999) **නිර්මාණය හා අනුභූතිය**:සරසවිප්‍රකාශකයෝ, ස්ටැන්ලි තිලකරත්න මාවත,නුගේගොඩ.

කුමාර , හේමන්ත එන්. වී. ජී. ඒ. (2008) **සමාජ විද්‍යාව මූලික සංකල්ප න්‍යාය හා ක්‍රමවේද**:විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මරදාන පාර පුංචි බොරැල.

කේගන්, ඩොනල්ඩ්, සහස්මිත්, ඩෙනිස්.. (1996) **ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයන්** :මාර්ග ප්‍රකාශන, කොළඹ 08.

ගමගේ , කුමාරි. (1999) **ප්‍රබන්ධ කතාවෙන් නිරූපිත කාන්තාව**: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ මරදාන පාර කොළඹ 10.

ගමගේ ඩී. (2015) **විශ්ව සන්නිවේදනය නව මාධ්‍ය හා දේශපලනය**: ජන සන්නිවේදනය අධ්‍යනය අංශය, කැලණි විශ්ව විද්‍යාලය.

ගමගේ සිරි. (1985) **ශ්‍රී ලංකාවේ වෙනස් වන සමාජය හා පවුල** : සමාජ විද්‍යා අංශය, පේරාදෙණි විශ්ව විද්‍යාලය පේරාදෙණිය.

ගම්ලත් , සුචරිත. (2008) **මාක්ස්වාදය හා සාහිත්‍ය කලා**: සරසවි ප්‍රකාශකයෝ නුගේගොඩ.

ගුණතිලක , හේමා. (1985) **කාන්තාවන්ගේ ප්‍රගතිය**: කාන්තා පර්යේෂණ කේන්ද්‍රය,කොළඹ.

ගුණතිලක, හේමා.(1985) **කාන්තාව හා ජනමාධ්‍ය කාන්තා දශකය හා ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ප්‍රගතිය**:කාන්තා පර්යේෂණ කේන්ද්‍රය කොළඹ.

ගුණතිලක, හේමා. (1976) **සමාජ ආකල්ප සමාජ දේශපාලන කටයුතුවලට සහභාගි වීම**: ආර්ථික විමසුම හයවන කලාපය, දෙවන වෙළුම මහජන බැංකු පර්යේෂණ කේන්ද්‍රය.

ගුණසේකර,ආර්. (1992) **අධ්‍යාපනික රූපවාහිනිය**: සම්භාව්‍ය ප්‍රකාශනය.

ගුරුසිංහ , ලතා. (2006) **නූතන සිංහල නවකතාවෙන් නිරූපිත ස්ත්‍රිය**: චතුර මුද්‍රණාලය,142 අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය.

ගුරුසිංහ, ලතා. (2006) **සාහිත්‍ය මැවූ ගැහැණිය**: එම්.ඩී.ගුණසේන සහ සමාගම.

ජයකොඩි, දිලිප. (2009) **ආර්යා**: මියුසස් පබ්ලිෂිං හවුස්(පුද්) සමාගම, ගණේමුල්ල.

ජයවීර,ස්වර්ණා. (1995) **ස්ත්‍රීන් හා අධ්‍යාපනය වෙනසක පැතිකඩ**: කාන්තා පර්යේෂණ කේන්ද්‍රය කොළඹ.

ජයසිංහ ඒ. කේ. ජී. (2013) **සමාජ විද්‍යාත්මක න්‍යාය**: කඩුල්ල ප්‍රකාශන පහළ බියන්විල, කඩවත.

ජයසිංහ ඒ. කේ.ජී. (වර්ෂය සඳහන් කර නොමැත.)**ස්ත්‍රී පුරුෂ සමාජභාවය(බටහිර සංකල්ප)**:කඩුල්ල ප්‍රකාශන පහළ බියන්වල,කඩවත.

ජිනදාස, එම්. කේ. (2014) **නිර්මාණාත්මක සන්නිවේදනය හා විචාර අධ්‍යනය**: මැදමහනුවර සංස්කෘතික සන්නිවේදන පර්යේෂණ මධ්‍යස්ථානය.

ඥාණරතන හිමි, පුස්සැල්ලාවේ. (2012) **සාහිත්‍යසෙවනය**: විද්‍යොදය පිරිවෙණේ ආදිශිෂ්‍ය සංගමය.

තිරුචන්ද්‍රන්, සෙල්වි. (1995) **ස්ත්‍රීවාදී දර්ශන කෝණයෙන් සමාජ න්‍යායන් විග්‍රහ කිරීම**: කාන්තා අධ්‍යයන හා පර්යේෂණ කේන්ද්‍රය, කොළඹ.

දිසානායක, විමල්. (1964) **සිංහල නවකතාවේ දේශීය පදනම**:සිංහල සාහිත්‍ය සම්මේලනය, කෑගල්ල සංස්කෘතික දෙපාර්තමේන්තුව.

දිසානායක, වී. (2007) **රූපවාහිනි මාධ්‍ය ආධිපත්‍ය**: නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.

නිශ්ශංක,චන්දිමා. (1997) **කාන්තාව හා ජනමාධ්‍ය ප්‍රතිරූපයනය**: එස් ගොඩගේ සහ සාහෝදරයෝ මරදාන පාර
නුගේගොඩ.

ප්‍රනාන්දු, නිවුටන්,(සංස්).. (1996) **ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයන්** : මාර්ග ප්‍රකාශන, කොළඹ 08.

ප්‍රනාන්දු, නිවුටන් සහ මද්දුම, සරත්. (සංස්). (1994) **ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද?**: මාර්ග ප්‍රකාශන, කොළඹ 08.

හාසින් , කමලා. (1994) **පිතෘමූලිකත්වය යනු කුමක්ද?**:සමාජ විද්‍යාඥයින්ගේ සංගමය,කොළඹ 05.

මහිම,ජේ. (1998). **කොප්පර කොප්පර පිපිඥ්ඤ විඩියෝ ගේම් ගසඤ්ඤ ලිපිය**: ටී.වී. ශ්‍රී ලංකා සඟරාව.

මහේන්ද්‍ර,එස්. (1983). **සන්නිවේදන න්‍යායා හා ජන සන්නිවේදනය**: ගුණසේන සහෝදරයෝ.

මහේන්ද්‍ර, එස්. (1991). **සන්නිවේදන ගවේශණය**: චතුර ප්‍රකාශ වැල්ලම්පිටිය.

මහේන්ද්‍ර, එස්. (1997). **සන්නිවේදන**: ගොඩගේ සහෝදරයෝ. කොළඹ 10ග

මහේන්ද්‍ර, එස්., **ජන මාධ්‍යයේ නැගිම**: (වර්ෂය සදහන් නැත.) ඇස්, ගොඩගේ, සහ සහෝදරයෝ, කොළඹ 10.

මික්මුවර්, (2000). **ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හා දේශපාලනය**: රාවය ප්‍රකාශය.

මනුරත්න එම්.ජී. (2004) **ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ පවුල**: ආරිය ප්‍රකාශකයෝ,බෞද්ධ විද්‍යාල මාවත, වරකාපොල.

මහේන්ද්‍ර , සුනන්ද. (1993) **සන්නිවේදන විචාර ප්‍රතිචාර**: එස් ගොඩගේ සහ සහෝදරයෝ, 17, පී.ද එස්. කුලරත්න මාවත කොළඹ 10.

මික්මුවර්. (2000) **ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හා දේශපාලනය**: රාවය ප්‍රකාශය.

මිණිවන් පී. තිලකරත්න. (1990) **අත්දැකීම හා නවකථාකරණය**: සීමාසහිත ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ.

මිණිවන් පී. තිලකරත්න. (1987) **සිංහල නවකතාවේ වස්තු විකාශනය**:ප්‍රකාශන සංස්කෘතිය පිළිබඳ අමාත්‍යංශය, මැලේ වීදිය කොළඹ 02.

මිණිවන් පී. තිලකරත්න. (1990) **අත්දැකීම හා නවකථාකරණය**: සීමාසහිත ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ.

මිණිවන් පී. තිලකරත්න. (1987) **සිංහල නවකතාවේ වස්තු විකාශනය**:ප්‍රකාශන සංස්කෘතිය පිළිබඳ අමාත්‍යංශය, මැලේ වීදිය කොළඹ 02.

මහේන්ද්‍ර , සුනන්ද. (1993) **සන්නිවේදන විචාර ප්‍රතිචාර**:එස් ගොඩගේ සහ සහෝදරයෝ, 17, පී.ද එස්. කුලරත්න මාවත කොළඹ 10.

රාහුබද්ධ, සුමිත්‍රා. (1994)**ඉටි පහන්**: සුමිත්‍රා රාහුබද්ධ ප්‍රකාශන,නුගේගොඩ.

රාජකරුණා, සුනේත්‍රා. (2013) **පොදු පුරුෂයා**: සරසවි ප්‍රකාශකයෝ,ස්ටැන්ලි තිලකරත්න මාවත,නුගෙ ගොඩ.

රීඩ්,එව්ලින්. (2009) **ස්ත්‍රී විමුක්තිය පිලිබඳ** ගැටලු:වෙනස ප්‍රකාශකයෝ 84. රාජගිරිය පාර, රාජගිරිය.

ලියනගේ , කමලා, වළාකුළු ගේ සුමුදු. (2006) **ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය**:ෆෙඩ්රික් ඊබට් පදනම.

ලියනගේ , කමලා. (1998) **ශ්‍රී ලාංකික දේශපාලනය තුළ කාන්තා දේශපාලන සහභාගීත්වය**:ෆෙඩ්රික් ඊබට් පදනම.

ලියනගේ, කමලා. (2012) **ශ්‍රි ලාංකීක පළාත් පාලන ආයතන තුල ස්ත්‍රී නියෝජනය**: අභියෝග අපේක්ෂා ෆෙඩ්රික් ඊට් ස්ටිෆත්.

වික්‍රමසිංහ , මාර්ටින්. (1944) **ගම්පෙරලිය**: කේ.එස්.යු. ග්‍රැෆික්(පුද්) සමාගම,රාජගිරිය.

වික්‍රමසූරිය , සරත්චන්ද්‍ර. (1961) **නවකතා විවරණය**:ලංකා සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

විජේගුණසිංහ , පියසීරි, ප්‍රනාන්දු මනෝ. (2011) **සිංහල සමාචාර**: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය මරදාන පාර, පුංචි බොරැල්ල.

විජේගුණසිංහ , පියසීරි. (1995) **මාක්ස්වාදි කලා විචාරයේ මූලධර්ම**: ඩිසයින් සිස්ටම්, මරදාන පාර, කොළඹ 8.

විමලසේන, එච්. (1996) **බහුත්ව සමාජයක ප්‍රජාතන්ත්‍රවාදය**: මාර්ග ප්‍රකාශන, කොළඹ.

වීරසිංහ , ටී. සහ රංජන්, එස්. ඩී. කේ. **ජනමාධ්‍යවේදය (ජනමාධ්‍ය අධ්‍යාපනය හා විචාරය)**: (වර්ෂය සදහන් නැත.) කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රීපාලි මණ්පඩය.

සමරකෝන් , මයුර. (2009) **සමාජ සංස්ථා**: ලීඩ්ස් ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම, නො 356, පන්නිපිටිය පාර,තලවතුගොඩ.

(1976) **සමාජ විද්‍යාව**:අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනතුව අතුරුගිරිය.

සරච්චන්ද්‍ර , එදිරිවීර. (1999) **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය**:නුගේගොඩ සරසවි පොත්හල.

සිරිසේන , පියදාස. (1906) **වසනාවන්ත විවාහය හෙවත් ජයතිස්ස සහ රොසලින්**: එම්.ඩී. ගුණසේන සහ සමාගම.

සිල්වා, ක්ලීන්, ද අල්විස්, ජයිල්ස්, (සංස්) .(2008) **ප්‍රහාර හමුවේ ස්ත්‍රීවාදීන්** : සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, කොළඹ.

සිල්වා , විමලා ද. (1985) **කාන්තාව හා තීරණ ගැනීම,කාන්තා දශකය හා ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ප්‍රගතිය**: කාන්තා පර්යේෂණ කේන්ද්‍රය, ශ්‍රි ලංකාව.

(2011). **ස්ත්‍රියගේ ප්‍රතිපත්ති ප්‍රකාශන**: ස්ත්‍රීන්ගේ දේශපාලන කවය කොළඹ.

සුරවීර ඒ.වී. (1995) **කලාව යනු කුමක්ද?**:මහරගම කර්තෘ ප්‍රකාශක.

හේමන්ත , කුමාර එන්.වී.ජී.ඒ. (2009) **ස්ත්‍රි පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම්**:විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

හේරත් එච්.ඩී.ආර්. (1988) **නවීකරණය හා ශ්‍රී ලංකාවේ පවුල් අනුභූත**:පොල්ලමුරේ සෝරත හිමි සහ දයා අමරසේකර(සංස්. දෙවන කලාපය)

හේරත් , සුභංගි. (1999) **සිංහල කාන්තාවන්ගේ දේශපාලන සභාභාගීත්වය**: ප්‍රතියමාණ කාන්තා අධ්‍යාපනය හා පර්යේෂණ කේන්ද්‍රය, කොළඹ.

## English

Bitter,John R. (1986). Mass Comunication an Introduction (2nd ed.).

Bitter,JohnR. (1986) Mass Comunication an Introduction (4th ed.).

Dawson, C. (2009). Introduction to research methods: a practical guide for anyone undertaking a research project: Oxford: How to books.

De Fleur,l,Melvin, and Sandra Ball- Rokeach, (1989)Theories of Mass Communication.

Dominic,R,Joseph R, ( 1994 ) The Dynamics of cominication, Routlege: Londan.

Fifth Edotion Loegman, 10,Bank Street Whit Plains' N'Y' 10606.

Fiske Johnand Hartly John. (1994 ) Reading Television: New York.

Jack R, Childress, In-serivce Education of Tea-chers.

Levin Diane & Gerzon Chritine A letter to Educatiors about the see Through Violence in the Media

Effcet, Boston, U.S.A.

Meauail,Denis.(1994 ) Mass Media Theory : saga.

Schramm,w, Children, and Television: Washington D,C, Tele – Info – office 1959.

Schram, Wilbur, Robers, Donald.f.( 1974 ) The Proccss and Effect of Mass Commiunication.

Schram w, jack lyle and Edwin, B. Parker 1961- 1965-Television in the live of the Chilren: stafed University Persa , Original Edition.

Sdrow Lester M. (1990), "Psychology", Brown & Benchmark Publishers, Madison, Wisconsin, Dubuque lowa, Indianapolis, Indiana Melbourne, Australia, Oxford, England.

Television and Children in Sri Lanka, A Sample Survey Conducted by Depatment of mass media

Commication. University of kelaniya and UNDA Sri Lanka Noverber 1999.

Tips for parent’s ‘’The Question of TV Viewing and Childers” kaneses National Ediucation Asso’ 7/5 S.W 10th Avenue, Topeka Ks 666/2 , 1020, 2000.
William H. Allen, : Audio – Communication.
w.w.w. Meia- awareness -Media awareness network &The Alliance for Children and Television”

# විවෘත ආර්ථිකය, රූපවාහිනිය, නාට්‍යය හා ස්ත්‍රීය

"රොබින් විලියම්සන්ට අනුව විවෘත ආර්ථිකය යනු අර්ථ ශාස්ත්‍රයේම කොටසක් නොවන අතර මෙකී සුවිශේෂත්වය වනුයේ අර්ථ ශාස්ත්‍රය මගින් සමාජ, දේශපාලන හා සංස්කෘතික සංරචක නිෂ්පාදනය, බෙදා හැරීම හා ප්‍රතිව්‍යාප්තිය ශීඝ්‍ර පරිමාවක සීමා රහිතව සහ ඉතා වේගයෙන් සමස්ත සමාජයට විප්ලවීයකරණයට භාජනය වීමයි"( Lester, 2000, 58 )

"ධනපති ආර්ථික ව්‍යුහය තුළ පවුල පෞද්ගලික දේපොළ අයිතිය පදනම් කරගෙන ගොඩනැගෙන අතර ඒ තුළ කාන්තාව වැටුප් ලබන ශ්‍රමිකයෙකු මෙන්ම ගෘහස්ථ මෙහෙකරුවෙකුද වේ. ධනේශ්වරය ක්‍රමය තුළ කාන්තාව එක් අතකින් අඩු වැටුප් හා වැඩි පැය ගණනක් තුළ සේවය ගැනීමෙන් පීඩාවට ලක්වන අතර ගෘහය තුළ ප්‍රජනන කාර්යයට හා ගෘහස්ථ වැඩවලට යොදා ගැනමෙන් සූරාකෑමට ලක් කෙරේ යැයි විශ්වාස කෙරේ"(ජයවර්ධන, 1994, 97) .

මාක්ස්වාදීන්ට අනුව පවුල යනු පීතෘ මූලික සමාජ ක්‍රමයේ කාන්තාවන් පීඩාවට ලක්කරන ආයතනයකි. මේ තුළින් කාන්තාව පුරුෂාධිපත්‍යයට බැඳ තබාගැනීමක් සිදු වේ යැයි තර්ක කෙරේ. කාන්තාවටගේ ලිංග භේදය හා අසමානතාවය තේරුම් ගැනීමේදී මාක්ස්වාදී ස්ත්‍රීවාදීන් දකින්නේ ධනවාදී නිෂ්පාදන ක්‍රමය තුළින් එය නිර්මාණය කරන බවයි (Thiruchandran,1994,78).

සුදර්ශණි කුමාරි දමුණුපොල

මිල රු. 400

9 786249 982246

කතෘ ප්‍රකාශනයකි.